2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை மற்றும் கணக்கறிக்கை - 2021

Performance and Financial Report - 2021



2021

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

மாவட்டச் செயலகம் - கொழும்பு

DISTRICT SECRETARIAT – COLOMBO

වැය ශීර්ෂ අංකය : 255

செலவினத் தலைப்பு : 255

Expenditure Head No : 255

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05

දු.අංක	ඃ 0112369134/ 0112369136
ෆැක්ස්	ඃ 0112369142
වෙබ් අඩවිය	ඃ **colombo.dist.gov.lk**
ඊමේල්	ඃ **ds@colombo.dist.gov.lk**

2021 වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ පණිවුඩය. . . .



කොවිඩ් 19 ආපදා තත්වයෙන් පීඩා විඳිමින් වුව ද 2021 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කය තුළ සැළසුම් කළ ව්‍යාපෘති අදාළ ඉලක්යන් කරා මෙහෙයවීමට හැකිවීම පිළිබඳව මා තුළ ඇත්තේ නිහතමානී සතුටකි. මේ සඳහා දිස්ත්‍රික්කයේ දේශපාලන නායකත්වය, ප්‍රාදේශීය ලේකම්වරු, අංශ ප්‍රධානීන් සහ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්යමණ්ඩල, දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සෙසු රාජ්‍ය හා පෞද්ගලික ආයතන, සංවිධාන හා පුද්ගලයින් මා වෙත ලබාදුන් සහයෝගය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 හි සම්බන්ධීකරණයෙන් හා අපගේ මෙහෙයවීමෙන් සමස්ත කොළඹ දිස්ත්‍රික්කය පුරා ජීවත්වන මහජනතාවගේ සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා රජය මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු හා ප්‍රගතිය මෙම කාර්ය සාධන වාර්තාවේ ඇතුළත් වේ. විවිධ අමාත්‍යාංශ, දෙපාර්තුමේන්තු මෙන් ම බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපාදන තුළින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති ද ඊට ඇතුළත් වේ.

කොවිඩ් ආපදා තත්ත්වය තුළ ජීවනෝපාය අහිමි වූ පවුල් සඳහා මෙන් ම නිරෝධායනය වූ පවුල් සඳහා ක්‍රියාත්මක කරන ලද සහනාධාර වැඩසටහන්, දිවිනැගුම ආර්ථික සංවර්ධන හා භෞතික සම්පත් සංවර්ධන වැඩසටහන්, ජීවනෝපාය හා ආර්ථික සංවර්ධන වැඩසටහන්ල ආපදා සහන හා කළමනාකරණ වැඩසටහන්ල මත්ද්‍රව්‍ය නිවාරණ හා පුහුණු වැඩසටහන් යනාදී සෑම අංශයකින් ම ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්, එහි ඉලක්ක, අරමුණු මෙන්ම එම වැඩසටහන්වල ප්‍රගතිය ද අන්තර්ගත කර ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝජනය කරන ඒකක හරහා ක්‍රියාත්මක කරන ලද භෞතික සංවර්ධන හා මානව සංවර්ධන ක්‍රියාවලියට අදාළ වැඩසටහන් පිළිබඳ තොරතුරු මෙන් ම රාජ්‍ය නොවන ආයතන හා ස්වේච්ඡා සංවිධානවල අනුග්‍රහයෙන් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසහන් පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

සමස්තයක් ලෙස මෙම සියලු භෞතික, ආර්ථික හා මානව සංවර්ධන වැඩසටහන් සහ ඒවායේ ප්‍රගතිය පිළිබඳව විශ්ලේෂණය කර බැලීමේ දී, වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟාවී

ඇති අයුරු පැහැදිලි වේ. තව ද, සමාජ අවශ්‍යතාවයන් පිළබඳව හා මුහුණ දීමට සිදුවිය හැකි අභියෝගයන් පිළිබඳව අවබෝධයෙන් යුතුව ඉදිරි ඉලක්කයන් ගොඩනගා ඇති අයුරු ද නිරීක්ෂණය වේ.

මේවනතුරු ද පහව නොගිය ආපදා තත්ත්වයක් යටතේ වුව ද කොළඹ දිස්ත්‍රික්කයේ භෞතික හා මානව සම්පත් සංවර්ධන කටයුතු කාර්යක්ෂමව හා මනා ඵලදායිත්වයකින් යුතුව සිදු කිරීමට නායකත්වය ලබාදීමට හැකිවීම පිළිබඳව තෘප්තිමත් වෙමි.

සුවිශේෂ ජයග්‍රහණ හරහා ඉදිරි ඉලක්ක සාර්ථක කර ගැනීමට නන් අයුරින් දායකත්වය ලබාදුන් මහජන නියෝජිතයන් ඇතුලු රාජ්‍ය නිලධාරීන් සැමට මාගේ ගෞරවය පුද කරමි.



ප්‍රදීප් යසරත්න,
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය

පටුන

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය. ---------- 7

1.1 දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම. ---------- 7

1.1.1 දිස්ත්‍රික් මායිම් ---------- 9

1.1.2 දිස්ත්‍රික්කයේ ජනගහනය හා මූලික සංඛ්‍යාලේඛන තොරතුරු ---------- 9

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු. ---------- 10

1.2.1 ආයතනයේ දැක්ම ---------- 10

1.2.2 ආයතනයේ මෙහෙවර ---------- 10

1.2.3 ආයතනයේ අරමුණු ---------- 10

1.3 ප්‍රධාන කාර්යයන්. ---------- 10

1.4 සංවිධාන සටහන ---------- 12

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාල ---------- 13

1.5.1 කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 13

1.5.2 දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 15

1.5.3 මොරටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 18

1.5.4 හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 20

1.5.5 සීතාවක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 22

1.5.6 කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 24

1.5.7 තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 26

1.5.8 පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 28

1.5.9 රත්මලාන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 30

1.5.10 කැස්බෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 32

1.5.11 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 33

1.5.12 මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 35

1.5.13 කොලොන්නාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ---------- 37

2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම (විශේෂ ජයග්‍රහණ/ අභියෝග/ ඉදිරි ඉලක්ක) ---------- 38

2.1 ආයතන අංශය ---------- 38

2.2 දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය ---------- 40

2.3 අභ්‍යන්තර විගණන අංශය ---------- 43

2.4 දිස්ත්‍රික් ඉංජිනේරු අංශය ---------- 45

2.5 සමෘද්ධි අංශය ---------- 46

2.6 කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය ---------- 51

2.7 දිස්ත්‍රික් මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය ---------- 52

2.8 දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය ---------- 53

2.9 දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය ---------- 55

2.10 පර්යේෂණ හා සන්නිවේදන අංශය ---------- 56

2.11 දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය ---------- 56

2.12 පුපුරන ද්‍රව්‍ය පාලන අංශය ---------- 57
2.13 දිස්ත්‍රික් පොහොර අංශය ---------- 59
2.14 බෞද්ධ කටයුතු අංශය ---------- 60
2.15 සමාජ සේවා අංශය ---------- 61
2.16 සංස්කෘතික අංශය ---------- 63
2.17 විදේශ රැකියා අංශය ---------- 64
2.18 මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය/හානිර සේවා අංශය (අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය) ---------- 65
2.19 පරිසර අංශය ---------- 66
2.20 මානව සම්පත් සංවර්ධන අංශය ---------- 68
2.21 වනිතා සංවර්ධන අංශය ---------- 70
2.22 මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණ අංශය ---------- 71
2.23 සමට පුහුණු නිලධාරී (අධිකරණ අමාත්‍යංශය) ---------- 73
2.24 ළමා හිමිකම් ප්‍රවර්ධන අංශය ---------- 73
2.25 රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණ අංශය ---------- 75
2.26 ජාතික ඒකාබද්ධතා අංශය ---------- 75
2.27 දිස්ත්‍රික් උපදේශන අංශය ---------- 76
2.28 දිස්ත්‍රික් මාධ්‍ය අංශය ---------- 77
2.29 සමාජ ආරක්ෂණ මණ්ඩලය ---------- 78
3 පරිවිජේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය. 79
4 පරිවිජේදය - කාර්ය සාධන දර්ශක ---------- 149
5 පරිවිජේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධන ---------- 162
6 පරිවිජේදය - මානව සම්පත් පැතිකඩ ---------- 196
7 පරිවිජේදය - අනුකූලතා වාර්තාව ---------- 201

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය.

1.1 දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම.

ශ්‍රී ලංකාවේ මෙන්ම බස්නාහිර පළාතෙහි කුඩාම දිස්ත්‍රික්කය කොළඹ දිස්ත්‍රික්කය වන අතර විශාලත්වයෙන් ව.කි.මී 699 ක විශාලත්වයෙන් යුතු මෙම දිස්ත්‍රික්කය මුහුදු මට්ටමේ සිට මීටර් 50 වඩා උස ප්‍රදේශ නොමැති හා මුහුදු මට්ටමට වඩා අඩු මට්ටමක භූමි පිහිටීමක් තිබීම සුවිශේෂී වේ. උතුරින් ගම්පහ දිස්ත්‍රික්කයද, දකුණින් කළුතර දිස්ත්‍රික්කයද, නැගෙනහිරින් රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කයද, බටහිරින් මහා සාගරයෙන් සීමා වී පවති. කැළණි ගඟ මුහුදු හා සම්බන්ධ වන ගං මෝදර පිහිටා ඇත්තේද මෙහිය. දියවන්නා ඔය, බොල්ගොඩ ජලාශය ද, කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටයි.

ශ්‍රී ලංකාවේ ජනාකීර්ණම නගරයක් වන කොළඹ බහු ආගමික, බහු වාර්ගික හා බහු සංස්කෘතියකින් යුක්ත වේ. ගංගාරාම පෙරහැර, බෙල්ලන්විල පෙරහැර, කොළඹ වේල් පෙරහැර ආදිය වාර්ෂිකව මෙහි දක්නට ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 ක් හා ග්‍රාම නිලධාරී වසම් 557 කින් යුක්ත කොළඹ දිස්ත්‍රික්කය ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලන ආදී සියලු ක්ෂේත්‍ර වල කේන්ද්‍රස්ථානය වෙයි. පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, ජනාධිපති ලේකම් කාර්යාලය, පැරණි පාර්ලිමේන්තුව, ජනාධිපති මන්දිරය, උසාවි සංකීර්ණය, අරලියගහ මන්දිරය ඇතුළු රජයේ උසස් ආයතන, පරිපාලන ආයතන, සියලුම බැංකු කටයුතු මෙහෙයවන ප්‍රධාන ආයතන මෙන්ම කොළඹ කොටස් වෙළඳ ඇතුළු ප්‍රධාන ආර්ථික ස්ථාන රැසක් මෙම දිස්ත්‍රික්කයේ පිහිටයි.

මහා මාර්ග හා දුම්රිය මාර්ග මාර්ගයන් කොළඹ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන පිහිටන අතර ප්‍රධාන වරාය, ගුවන් හා නාවික ගමනා ගමන කේන්ද්‍රස්ථාන ද පිහිටයි. රජයේ මෙන්ම පෞද්ගලික රෝහල් හා ප්‍රධාන ආයුර්වේද රෝහලද මෙහි පිහිටයි. ප්‍රධාන විශ්වවිද්‍යාල 03 ක්ද, කාර්මික විද්‍යාල කිහිපයක්ද, ප්‍රධාන පෙලේ පාසල් 50% වඩා කොළඹ දිස්ත්‍රික්කයේ දක්නට ලැබේ.

මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික බෝගය පොල් වන අතර වී වගාව, එළවළු වගාව, තේ, රබර් වැනි බෝගද වගා කරනු ලබයි. කොළඹ දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණය 92.99% ක් ගොඩබිම වන අතර එයින් 32.47% වගා කල බිම් ද 61.23% වගා නොකළ බිම්ද 6.29% වනාන්තර සඳහාද වෙන් වේ. 7.01% ප්‍රමාණයක් අභ්‍යන්තර ජලාශ වලට වෙන් වේ. මෙම දිස්ත්‍රික්කයේ තෙත් කලාපීය දේශගුණික ලක්ෂණ පිහිටා ඇති අතර සමතෝශික ස්වභාවයක් වසර පුරා පවති. මාර්තු, අප්‍රේල් කාලයන්හි 32.1^0C ක උපරිම උෂ්ණත්වයක් පවතින අතර 25^0C අවම උෂ්ණත්වයක් පවති. මෝසම් කාලයේදී අධික වර්ෂාපතනයක් දක්නට ලැබෙන අතර ගංවතුර තත්ත්ව පවා ඇති වේ.

අතීතයේ කොළොම්තොට වරාය හේතුවෙන් පෙර රජ සමයේ සිට කොළඹ දිස්ත්‍රික්කය ප්‍රසිද්ධව පැවති ආගමික ස්ථාන, පොදු සුසාන භූමි, පැරණි ගොඩනැඟිලි බහුලව දක්නට ලැබෙන බැවින්

ඓතිහාසික අතින් වැදගත් තැනක් මෙම දිස්ත්‍රික්කය සඳහා හිමි වේ. එමෙන්ම ප්‍රධාන රංග ශාලාවල් පවත්වනු ලබන විවිධ සංස්කෘතික කලාකෘතින් නිසා රසිකයන්ගේ මනදොළ පිනවාලයි. ක්‍රීඩා පිටි, සතුටු උයන් හා සත්ව උද්‍යාන ඇතුළු බොහොමයකින් සමන්විත මෙම දිස්ත්‍රික්කයේ ජනතාවගේ ක්‍රීඩා කෞශල්‍යය හා විනෝදය සපයනු ලැබේ.



1.1.1 දිස්ත්‍රික් මායිම්

බස්නාහිර පළාතේ ප්‍රධානම දිස්ත්‍රික්කය වන කොළඹ දිස්ත්‍රික්කය වර්ග කි.මී. 699 කින් යුක්ත වේ. මෙහි මායිම් වශයෙන් උතුරින් කැළණි ගඟ ද, දකුණින් බොල්ගොඩ ගඟද, බස්නාහිරින් මුහුදු තීරය ද, නැගෙනහිරින් සබරගමු පළාත් මායිම් ද සීමා මායිම් කොටගෙන පිහිටා ඇත.

1.1.2 දිස්ත්‍රික්කයේ ජනගහනය හා මූලික සංඛ්‍යාලේඛන තොරතුරු

කොළඹ දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාස 15 කින් සහ පළාත් පාලන ආයතන 13 කින් සමන්විතය.

කොට්ඨාසය	ජනගහනය
කොළඹ	341,431
කොළොන්නාව	202,464
කඩුවෙල	266,211
හෝමාගම	251,280
සීතාවක	120,205
පාදුක්ක	68,936
මහරගම	207,466
කෝට්ටේ	113,993
තිඹිරිගස්යාය	251,441
දෙහිවල	93,963
රත්මලාන	100,875
මොරටුව	177,741
කැස්බෑව	259,019
එකතුව	2,455,025

පළාත් පාලන ආයතන

මහ නගර සභා	නගර සභා	ප්‍රාදේශීය සභා
කොළඹ	කොළොන්නාව	කොට්ටාවත්ත මුල්ලේරියාව
දෙහිවල ගල්කිස්ස	සීතාවකපුර	සීතාවක
මොරටුව	මහරගම	හෝමාගම
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	කැස්බෑව	
කඩුවෙල		

1.2 **ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු.**

1.2.1 ආයතනයේ දැක්ම

යහපාලනයෙන් සහ තිරසාර සංවර්ධනයෙන් ප්‍රමුඛතම දිසාව.....!

1.2.2 ආයතනයේ මෙහෙවර

නිර්මාණශීලිව හා නම්‍යශීලිව පවත්නා සම්පත් කළමනාකරණයෙන් ජන ජීවිතය සවිබල ගැන්වීමට දිසාව මෙහෙය වීම.

1.2.3 ආයතනයේ අරමුණු

- කාර්යක්ෂම හා ඵලදායි දිස්ත්‍රික් ක්‍රමයක් පවත්වාගෙන යෑම.
- ජනතා තෘප්තිය ඉහල නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මගින් කාර්යක්ෂම සේවා සැපයීම සහතික කිරීම.
- ප්‍රතිලාභිමුඛ ආකල්ප, වගකීම, විවක්ෂණශීලී සම්පත් භාවිතය, අපක්ෂපාතිත්වය, විනිවිදභාවය වැනි හර පද්ධතීන් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත කිරීම.
- රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්ති වලට අනුකූල වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරී මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ව්‍යාපෘති සංවිධානය කිරීම, මූල්‍ය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසුවිපරම් කටයුතු වල සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුභසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.

1.3 **ප්‍රධාන කාර්යයන්.**

- දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියාකරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම.
- දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.
- විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශිය ලේකම්වරුන් 13 දෙනා සමඟ ප්‍රාදේශිය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම හා අධීක්ෂණය කිරීම.
- පරිපාලන කටයුතු වල දී ඵලදායිතාවය ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.

- ❖ දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතන වල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- ❖ සියළුම මැතිවරණ කටයුතු වලදී එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණ වල දී මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් ත්‍රේරීමිහාර නිළධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාති මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.
- ❖ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්ය මණ්ඩල නිළධාරීන්ගේ අභිප්‍රේරණ සහ හැකියා වර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ❖ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිළධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා අදාල ආදායම් ගණන් දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.
- ❖ මුහුදු ගොඩගැලීම, නියඟ, ගංවතුර, සුලි සුලං වසංගත තත්ත්ව වැනි විස්තීරණ ආපදා අවස්ථාවන් හිදී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරීම තුළින් ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.

1.4 **සංවිධාන සටහන**



1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාල

1.5.1 කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



කොළඹ දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 13 අතුරින් විශාලත්වයෙන් තුන්වෙනි තැන හිමි කඩුවෙල කොට්ඨාසයේ මුළු බිම් ප්‍රමාණය වර්ග කි. මී. 91.76කි. එහි වසම් 57 තුළ ප්‍රධාන ගම් 16කි. මුළු ජනගහනය 281,282 වන අතර 75,245ක මුළු පවුල් සංඛ්‍යාවකින් හා 70,389ක මුළු නිවාස සංඛ්‍යාවකින් කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය සමන්විත වේ.

2. ප්‍රධාන කාර්යයන්



රාජ්‍ය ප්‍රතිපත්තින්හි විනිවිදභාවය පෝෂණය කරමින් සේවා සැපයීම, ජනතා සහභාගිත්වය සහිතව ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් කළමනාකරණය හා සම්බන්ධීකරණය තුළින් කොට්ඨාසයේ ජනතාවගේ ජන ජීවිත නඟා සිටුවීම.

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලඟා කර ගෙන ඇති විජයග්‍රහණ



2021 වර්ෂයේ කෝවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ කඩුවෙල කොට්ඨාසයෙහි කෝවිඩ් මර්දන බලකාය මඟින් ජන ජීවිතය අබණ්ඩව පවත්වා ගෙන යාමට කටයුතු සැලසීම මෙන්ම කාර්යාල සාමාන්‍ය සේවා කටයුතු හා කොට්ඨාසයට අදාල සංවර්ධන කටයුතු ද අවම කාර්යය මණ්ඩලයක් යටතේ කාර්යක්ෂමව ඉටු කිරීම. කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් සිදුකල මෙහෙවර උදෙසා 2021 වසරේ බත්තරමුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් ලබා දුන් Health Heroes ඇගයීම් සම්මානය ලබා ගැනිම.

4. මුහුණ දෙන ලද අභියෝග



කෝවිඩ් - 19 වසංගත තත්ත්වය අතරතුර බලපෑ ගං වතුර තත්ත්වයන් හමුවේ අවතැන් වූ පවුල් 3,824 සඳහා අවශ්‍ය පහසුකම් සලසමින්ද, සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් අවම කාර්යය මණ්ඩලයක් යොදා ගනිමින් මහ ජනතාවට සේවා සපයමින්ද, කොට්ඨාසයේ සියළු සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීමට සිදුවීම.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය



ආයතන අංශය, සැලසුම් අංශය, ගිණුම් අංශය, විශ්‍රාම වැටුප් අංශය, රෙජිස්ට්‍රාර් අංශය, ඉඩම් අංශය, ක්ෂේත්‍ර අංශය හා සමෘද්ධි අංශය යන අංශ විසින් 2021 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අරමුණු කරගත් ඉලක්ක 100% අත්පත් කර ගෙන ඇත.

6. ඉදිරි ඉලක්ක



2022 වර්ෂයේ රජයේ මූලික සංවර්ධන වැඩසටහන වන “ගම සමඟ පිළිසඳර“ - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ඇතුළු සියලු සංවර්ධන කාර්යයන් සහ ජනතාව වෙත දෛනිකව ඉටු කළ යුතු සියළු සේවාවන් ඉතා මැනවින් කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීම තුළින් අදාළ ඉලක්ක සපුරා ගැනීම.

1.5.2 දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය තුළ වර්ග කි.මීටර් 08කට සීමා වූ භූමි ප්‍රදේශයක් තුළ පිහිටි දෙහිවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ වෙසෙන 100,000 කට අධික විවිධ ජන කොට්ඨාසයන්ට අයත් සියළු ජනතාවගේ අවශ්‍යතා සපුරාලමින් ජන ජීවිතය නගා සිටුවීම උදෙසා සෞභාග්‍යයේ දැක්ම අනුව යමින්, රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලවෙමින්, සමාජ සංහිඳියාවෙන් යුතුව, ප්‍රාදේශිය ජනජීවිතය නංවාලනු වස් රජය මගින් ලබාදෙන ප්‍රතිලාභ ජනතාව වෙත ලබාදෙමින්, කාර්යක්ෂම ඵලදායී සේවාවක් සම්පතම සේවාවක් සපයමින්, ජනතාවගේ මුඛ්‍ය අවශ්‍යතා හඳුනාගනිමින්, ඒවා අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙත යොමුකරමින්ද ප්‍රදේශයේ සියළු සංවර්ධන කටයුතු ක්‍රියාවට නැංවීම තුළින් ජනතා හිතෛෂී සේවාවක් ලබාදෙන ආයතනයකි.

2. ප්‍රධාන කාර්යයන්



ළමා, තරුණ, වැඩිහිටි, කාන්තා, විශේෂ අවශ්‍යතා, රාජ්‍ය සේවකයින් හා විශ්‍රාමිකයින් මෙන්ම කලාකරුවන් යනාදී සියලුම කණ්ඩායම්වලට අයත් මහජනතාවගේ ආර්ථික හා සමාජ සංවර්ධනයට අදාළ වන සුබසාධක අවශ්‍යතා, යටිතල පහසුකම්, ආර්ථික කටයුතු, ජීවනෝපාය කටයුතු, සමාජසේවා කටයුතු, ආපදා කටයුතු, තාක්ෂණික පහසුකම් යනාදී සියලුම කාර්යයන් සිදුකිරීම.

- ඉහත ක්ෂේත්‍රයන්ට අදාලව ගැටළු හා අභියෝග හඳුනාගැනීම හා ඊට පිළියම් යෙදීම.
- ඉහත සඳහන් ක්ෂේත්‍රවලට අදාල සේවාවන් සැපයුමෙන් සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සංවිධාන අතර මනා සම්බන්ධීකරණය
- ප්‍රාදේශිය ජනතාවට මෙන්ම, ලක්වැසි සමස්ත ජනතාවට අවැසි උපත්, මරණ, විවාහ සහතිකවල මුල් පිටපත් නිකුත් කිරීම හා විවිධ බලපත්‍ර නිකුත් කිරීම.

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලඟා කර ගෙන ඇති විජයග්‍රහණ



- කොරෝනා වසංගත කාලසීමාව තුළ වුවද අපේක්ෂිතව පැවැති යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ යෝජිත ව්‍යාපෘති වෙනුවෙන් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හරහා හිමි වූ ප්‍රතිපාදන සියල්ලම භාවිතයට ගනිමින් සැලසුම් කරන ලද ව්‍යාපෘති සියල්ල වඩා ඵලදායී අයුරින් අවසන් කිරීමට හැකිවීම.
- අඟුලු ලෑම හා සංචරණ සීමා පනවා පැවති කාලසීමාවන් තුළ ග්‍රාම නිලධාරීන්ගේ ද සහයෝගිත්වයෙන් ජනතාවට අවශ්‍ය සේවාවන් අවැසි සම්බන්ධීකරණ කටයුතු දෙනිකව, 24 පැයෙහි ක්‍රියාත්මක වූ මෙහෙයුම් මැදිරි සංකල්පය තුළින් සාර්ථකව ඉටුකිරීමටත්,

සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමග එකමුතුව, ප්‍රදේශයේ ජනතාව වෙත දියත් කෙරුණු එන්නත්කරණ වැඩසටහන ඉතා සාර්ථක අයුරින් සිදුකිරීමට හැකි වීම.

- කොරෝනා වසංගත කාලසීමාව තුළදී වුවද ග්‍රාම නිලධාරී කාර්යාල සඳහා පවත්වනු ලබන කාර්යාල කළමනාකරණ තරඟය පැවැත්වීම, ප්‍රදේශයේ කලාකරුවන්ගේ හා කාර්යාලීය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන සාහිත්‍ය කලා මහෝත්සවය,සෞඛ්‍යය මාර්ගෝපදේශයන්ට අනුව ඉතාමත් සාර්ථක අයුරින් අවසන් කිරීමට හැකිවීම.
- ගාලු පාරේ දෙනිකව මුහුණදීමට සිදුව ඇති ගමනාගමන අපහසුතා අවම කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද මුහුදුබඩ මාර්ගයේ II අදියරේ කටයුතු කොරෝනා වසංගත කාලසීමාව තුළදී අවසන් කිරීමට හැකිවීම.
- ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා සුදුසු භූමියක් ලබාගනිමින්, කාර්යාලය සෑදීමට අදාලව සැලසුම් සකස් කර, ඊට අදාල කැබිනට් පත්‍රිකාව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකිරීම දක්වා කටයුතු අවසන් කර තිබීම.

4. මුහුණ දෙන ලද අභියෝග



1- අවම කාලසීමාවකින් කාර්යක්ෂම කඩිනම් සේවාවක් සැපයීම උදෙසා තොරතුරු තාක්ෂණය භාවිතයේදී LGN හරහා අන්තර්ජාල පහසුකම් භාවිතය තුළ වේගවත් ක්‍රියාකාරිත්වයක් නොමැතිවීම හේතුවෙන් විවිධ තාක්ෂණික ගැටලු සඳහා මුහුණදීමට සිදු වීම.

2- කිලෝමීටර් තුනකට නොඅඩු වෙරළ තීරයකින් සමන්විත වුවද ඒ ආශ්‍රිතව ධීවර කර්මාන්ත කටයුතු ප්‍රශස්ත ලෙස සංවර්ධනය නොවීම.

3- කාර්යාලීයගත නිලධාරීන්ගෙන් වැඩි පිරිසක් කොට්ඨාසයෙන් පිටත හා දිස්ත්‍රික්කයෙන් පිටත නේවාසික නිලධාරීන් වීම හේතුවෙන් අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී අවම මානව සම්පත් භාවිතයෙන් සියලු මෙහෙයුම් කටයුතු ඉටුකිරීමට සිදුවීම.

4- දෙහිවල මංසන්ධියේ පවතින අධික වාහන තදබදය හේතුවෙන් සේවා ස්ථානය වෙත පැමිණීමේදී නිලධාරීන්ට හා සාමාන්‍ය ජනතාවට දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවීම.

5- දෙනිකව විවිධ සේවාවන් ලබාගැනීමේ අරමුණින් රෙජිස්ට්‍රාර් අංශය, බලපත්‍ර අංශය, ඉඳිරිපස හා විශ්‍රාම වැටුප් අංශය ආදිය වෙත විශාල ජනකායක් පැමිණෙන බැවින්ද, වැඩි වශයෙන් රාජ්‍ය සේවාවන් සැපයීම සඳහා බහුකාර්ය සහයක, උපාධිධාරීන් නවක නිලධාරීන් ලෙස බඳවා ගැනීම තුළ කාර්යාලයේ ඉඩකඩ නොමැතිවීම හේතුවෙන් ගැටලු මතුවීම.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය

- විවිධ අභියෝග රැසක් හමුවේ වුවද ජනතාව වෙත ඵලදායී සේවාවක් සපයමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව එහි ඉලක්කගත කාර්යයන් උපරිමයෙන් අවසන් කරමින් 90%ක ප්‍රගතියක් ලබා ගැනීමට හැකිවීම.

6. ඉදිරි ඉලක්ක



- සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාවට අනුව, ග්‍රාමීය ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින්, ආර්ථිකමය වශයෙන් පසුබෑමට ලක්ව සිටින ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම සඳහා විවිධ පක්ෂ විපක්ෂ ජනතා නියෝජිතයින්ගේ සහයෝගයෙන් විවිධ ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- මුහුදුබඩ මාර්ගයේ තෙවන අදියර දුම්රියපළ පාරේ සිට ඕබන් පෙදෙස දක්වා ගමන් මාර්ග කොටසෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අදාලව මූලික පියවර කටයුතු සැලසුම් කිරීම.

- කොහුවල ඉදිවන නව ගුවන් පාලම සඳහා ඉඩම් අත්කර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති අතර පළමු අදියර වෙනුවෙන් සියලු වන්දි මුදල් ගෙවා අවසන් කිරීම.

- ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා සැලසුම් කරන ලද නව ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල කටයුතු සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහාය ලබාගැනීම.

- රාජ්‍ය අංශයේ කාර්යාලවල වලදායිතාවය ඇගයීමේ අරමුණින් ක්‍රියාත්මක වලදායිතා තරඟාවලිය සඳහා ඉදිරිපත් වෙමින් අපගේ සේවාවන් පිළිබඳ ගුණාත්මකභාවය තහවුරු කිරීම.

1.5.3 මොරටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



පුරෝගාමිත්වයේ නගරය යනුවෙන් හැඳින්වෙන මොරටු පුරවරය කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු මායිම වන අතර මොරටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට වර්ග කිලෝමීටර් 23.4 ක භූමි ප්‍රමාණයක් අයත් වේ. උතුරින් රත්මලාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයද, දකුනෙන් හා නැගෙනහිරින් බොල්ගොඩ ගඟ ද, බටහිරින් ඉන්දීය සාගරය ද මායිම් වන අතර තුන් පැත්තක්ම ස්වභාවික මායිම්වලින් වටවී තිබීම විශේෂ ලක්ෂණයකි. නාගරික පරිසරයක් වන මෙහි 180,000 ක පමණ ජනගහනයක් වාසය කරති. ඉන් 95% ක්ම සිංහල වන අතර දෙමළ 3%, මුස්ලිම් හා වෙනත් 2%.ආගම අනුව බෞද්ධ 68%, කතෝලික 19% , ක්‍රිස්තියානි 8% , ඉස්ලාම් 2% , හින්දු 2%, වෙනත් 1%

2. ප්‍රධාන කාර්යයන්



ප්‍රදේශයේ වාසය කරන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම හා එදිනෙදා අවශ්‍යතා සඳහා අවශ්‍ය වන රාජ්‍ය සේවාවන් සැපයීම, කොට්ඨාසයේ සංවර්ධන කටයුතු, අධ්‍යාපනික, සාමාජීය, ආගමික හා සංස්කෘතික වශයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ආපදා කළමනාකරණය හා සහන සේවා සැපයීම, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය හා පහසුකම් සැපයීම

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ලඟා කර ගෙන ඇති විජයග්‍රහණ



අන්තර් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයිය වලදායිතා සම්මාන

2012/13 - විශේෂ ඇගයීම් සහතිකය

2014 - තෙවන ස්ථානය

2015 - තෙවන ස්ථානය

4. මුහුණ දෙන ලද අභියෝග





කාර්යාලයේ අභ්‍යන්තර හා බාහිර ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම, වාහන නතර කර තැබීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම, කාර්යාල කටයුතු සඳහා භාවිතා කරන පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ජායා පිටපත් යන්ත්‍ර ඇතුළු කාර්යාල උපකරණ ප්‍රමාණවත් නොවීම සහ දැනට භාවිතා කරන එම උපකරණ නිතරම අළුත්වැඩියාවට යොමු කිරීමට සිදුවීම මගින් කාර්යාල කටයුතුවලට බාධා ඇතිවීම, කණිෂ්ඨ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම, නිලධාරීන්ගේ පුහුණු අවස්ථා ප්‍රමාණවත් නොවීම, වසම්වල සේවය කරන ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි නිලධාරීන් සඳහා පවතින කාර්යාල පහසුකම් සීමිතවීම

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය

76%



6. ඉදිරි ඉලක්ක

කාර්ය මණ්ඩලය හා පවතින සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරමින් අදාළ බාහිර පාර්ශවයන් සම්බන්ධීකරණයෙන් ප්‍රදේශයේ මහජනතාව වෙත කාර්යක්ෂවම හා ඵලදායී ලෙස රාජ්‍ය සේවා සැපයීම

1.5.4 හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය



අක්කර 1½ ක් පමණ විශාල වූ කාර්යාල භූමිය තුළ දෙමහල් කාර්යාල ගොඩනැගිල්ල හා උප ගොඩනැගිලි කිහිපයක් පිහිටා ඇත. අළුතින් ඉඳිවන සිවි මහල් නව කාර්යාල පරිශ්‍රයේ වැඩ කටයුතු මෙම වර්ෂය තුල නිම කිරීමට අපේක්ෂා කර ඇත.
විශ්‍රාමිකයන් දොළොස්දාහකට වැඩි ප්‍රමාණයකගේ කටයුතු ද ඇතුළු විවිධාකාර සංවර්ධන ව්‍යාපෘතින්ද, ක්‍රියාත්මක වන බැවින් අති විශාල රාජකාරී ප්‍රමාණයක් මෙම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ආවරණය කිරීමට සිදුව ඇත.

2. ප්‍රධාන කාර්යයන්



මාසික වැටුප් වාර්තා හා විශ්‍රාම වැටුප් වාර්තා සකස් කිරීම, බැංකු සැසඳුම් වාර්තා සකස් කිරීම,රජයේ ඉඩම් හා ඉඩම් අත්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම, සියළුම උප්පැන්න,විවාහ මරණ මුල් ලේඛණ නිකුත් කිරීමේ කටයුතු, ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, පස් ප්‍රවාහන(වාණිජ නොවන), සුරාබදු බලපත්‍ර, උකස් බලපත්‍ර, සතුන් ප්‍රවාහන බලපත්‍ර, දැව හෙළිම් බලපත්‍ර, දැව ප්‍රවාහන බලපත්‍ර, පුද්ගලයින් ලියාපදිංචි කිරීම, ග්‍රාම නිලධාරී පදිංචි සහතික නිකුත් කිරීම, කලු ගල් කැනීම්, පස් ප්‍රවාහන බලපත්‍ර සම්බන්ධව පරිගණක දත්ත පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම, මධ්‍යම රජයේ හා පළාත් සභා සංවර්ධන වැඩසටහන්, සමෘද්ධි සංවර්ධන වැඩසටහන්, විවිධ ක්ෂේත්‍ර ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ලබා කර ගෙන ඇති විජයග්‍රහණ



- 2020 වර්ෂයේ පවත්වන ලද ජාතික වලදායිතා සම්මාන තරඟාවලිය සඳහා කුසලතා සම්මානයක් 2021 වර්ෂයේදී දිනා ගැනීම
- 2021 කොළඹ දිස්ත්‍රික් අන්තර් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ක්‍රීඩා උළෙලේ කණ්ඩායම් ශූරතාවය, මලල ක්‍රීඩා ශූරතාවය හා සමස්ථ ශූරතාවය දිනා ගැනීම.

අළුතින් ඉඳිවන නව කාර්යාල පරිශ්‍රය

4. මුහුණ දෙන ලද අභියෝග

- 2021 වර්ෂයේ ඇතිවූ කොවිඩ් වසංගතයදී ජනතාවට දීමනා හා පහසුකම් සැලසීම.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය

- කොවිඩ් වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය 90% මට්ටමට ළඟා වී ඇත.



වලදායිතා ඒකකය

6. ඉදිරි ඉලක්ක

- මහජනතාවට විශිෂ්ට සේවාවක් ලබාදීම, මහජනයා වෙත තොරතුරු පහසුවෙන් ලබා දීමට හැකිවීම
- ජනතා සහභාගිත්වයෙන් යුත් කාර්යාක්ෂම, තිරසාර හා සැලසුම් ගත සංවර්ධන ක්‍රියාවලියක් තුළින් ප්‍රදේශයේ ජන දිවිය නංවාලීම

1.5.5 සිතාවක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



සිතාවක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 68 කින් සමන්විත වේ. පළාත් පාලන ආයතන 2 කට බෙදී ඇත. වසම් 14ක් සිතාවකපුර නගර සභාවට හා ඉතිරි වසම් 54 ක් සිතාවක ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් වේ. සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර 14460.5කි. සමස්ත ජනගහනය 119843 වේ.

2. ප්‍රධාන කාර්යයන්



1. රජයේ ඉ.සං.ආ.පනත, ඉඩම් අත්පත්, ඉඩම් ප්‍රදාන විශේෂ විධි විධාන පනත ක්‍රියාත්මක කිරීම
2. බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු (වාහන/ දැව/ මත්පැන්/ පුපුරණ ද්‍රව්‍ය/ වැලි/ පස්/ සත්ත්ව ප්‍රවාහන/ උකස්/ ගිනි අවි)
3. උප්පැන්න/ විවාහ /මරණ ලියාපදිංචිය



4. ව්‍යාපාර නාම ලියාපදිංචිය
5. හැඳුනුම්පත් නිකුත් කිරීමේ කටයුතු
6. විශ්‍රාම වැටුප් ලබාදීමේ කටයුතු
7. ආපදා සහන සේවා කටයුතු
8. කාන්තා හා ළමා කටයුතු
9. ක්‍රීඩා/සමාජ සේවා/සංස්කෘතික හා ආගමික /නිවාස/තරුණ සේවා කටයුතු

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ලබා කර ගෙන ඇති විජයග්‍රහණ

1. ජාතික ඵලදායිතා කුසලතා සම්මානය 2018,
2. තුරුණු ශ්‍රම ශක්ති වැඩ සටහන දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය,
3. ක්‍රිකට් අනුශූරතාව - 2019

4. මුහුණ දෙන ලද අභියෝග



1. Covid 19 ට අදාළව සහන සැලසීමේ කටයුතු ඉතා කඩිනමින් නිවැරදිව ඉටු කිරීම්

2. Covid 19 වසංගත තත්ත්වය තුළම සාමාන්‍ය රාජකාරී කාර්යක්ෂමව ඉටු කිරීම.

3. නිරන්තර ආපදාවන්ට මුහුණ දෙන කොට්ඨාසයක් බැවින් ආසන්නතම අවස්ථාව සඳහා කාර්යක්ෂමව සහන සැලසීම.

4. ආපදා කළමණාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් ආපදා අවම කිරීම

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය

- 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය 98% මට්ටමට ළඟා වී ඇත.

6. ඉදිරි ඉලක්ක



1. දිමනා පත්‍ර ලේඛන ගත කර සංරක්ෂණය කිරීම.

2. ඉඩම් කච්චේරි පවත්වා බලපත්‍ර ලබා දීම.

3. දිමනා පත්‍ර ලබා දීම.

4. රජයේ ඉඩම් හඳුනාගෙන සංරක්ෂණය කිරීම.

5. සමස්ත කොට්ඨාසයම ආවරණය වන පරිදි පරිගණක දත්ත පද්ධතියක් සැකසීම.

6. ජනතා සේවා කවුළු සියල්ල ජනතාවට පහසුවෙන් ළඟා විය හැකි පරිදි ස්ථාන ගත කිරීම

7. ආපදා කළමණාකරණය හඳුනාගත් ව්‍යාපෘති වල වැඩ අවසන් කර ජන ජීවිතය සුරක්ෂිත කිරීම

8. ග්‍රාම නිලධාරී සේවා පියස- හඳුනාගත් ඉඩම් වල ඉදිකිරීම් අවසන් කිරීම

1.5.6 කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



උතුරු කොළඹ හා මැද කොළඹ යන ජන්ද කොට්ඨාස දෙකෙන්ද ග්‍රාම නිලධාරී වසම් 35කින්ද සමන්විත කොළඹ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ජනගහනය හාරලක්ෂ පනස් දහසකට ආසන්නය. වරාය නගරය, නෙළුම් කුළුණ, කාක දූපත, ඕලන්ද කෞතුකාගාරය වැනි අද්විතීය ස්ථාන රැසක් පිහිටි ශ්‍රී ලංකාවේ වාණිජ අගනගරය වන කොළඹ පිහිටි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වේ.

2. ප්‍රධාන කාර්යයන්



I .ව්‍යවස්ථාපිත කාර්යයන්

- උප්පැන්න/විවාහ/මරණ සහතික ඇතුළු පුද්ගල අනන්‍යතාව සම්බන්ධ කාර්යයන්
- ජාතික හැඳුනුම්පත් ලබා දීම හා අනු අත්සන්ද, සියලු බලපත්‍ර වර්ග ලබා දීම/ ඉඩම් අත්පත්/ ඉඩම් පැවරීම් කටයුතු
- විශ්‍රාම වැටුප් ගෙවීම හා සම්බන්ධ කටයුතු

II .සමාජ සුබසාධන

- ගංවතුර/ කොරෝනා ආදී වසංගත තත්ත්ව වලදී ජනතාවට ආහාර ලබා දීම ඇතුළු ආපදා කටයුතු
- වැඩිහිටි/ ආබාධිත/ ගර්භණී/ රෝගාධාර ආදී පුද්ගල ආධාර ලබා දීම

III. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පාසල් සංවර්ධන කටයුතු, පොදු වැසිකිළි, මාර්ග අලුත්වැඩියා, නඩත්තු කටයුතු

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලඟා කරගෙන ඇති ජයග්‍රහණ

1. ජාතික ඵලදායිතා සම්මාන උළෙලේ 3 වන ස්ථානය හිමි කර ගැනීම.



2. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු නිලධාරීන් සඳහා පවත්වනු ලබන "Voice of Colombo" රියැලිටි වැඩසටහන සඳහා මෙම කාර්යාලය නියෝජනය කරමින් තරඟකරුවන් 05 දෙනෙකු අවසන් 48 දෙනාගේ වටය සඳහා සුදුසුකම් ලැබීම සහ අවසන් මහා තරඟය සඳහා තරඟකරුවන් දෙදෙනෙකු සුදුසුකම් ලැබීම.

3.කොවිඩ් 19 වසංගතය නිසා තුන්වනවර රට තුළ සංචරණ සීමා පනවා තිබූ කාලසීමාවේදී

- ජීවනෝපාය අහිමි පවුල් 30,000ක් සඳහා රු. 2000/- දීමනාව බෙදාදීම.

- නිරෝධායන වන පවුල් සහ හුදෙකලා කළ පවුල් සඳහා රු.5000/-ක් වටිනා වියළි ආහාර මලු 34,250ක් ලබා දීම.

4. 2021 වර්ෂයේදී ඉඩම් අත්පත් රාජකාරී ලෙස හිමිකම් පරීක්ෂණ 40ක් අවසන් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව පුද්ගලයින් 30කට වන්දි මුදල් ලබා දීම, ඉඩම් අමාත්‍යාංශය වෙත 6(1) නිකුත් කිරීමට අදාළ වන පැරණි අත්පත් ගොනු 10ක වාර්තා යොමු කිරීම, පැරණි අත්පත් කිරීම්වලට අදාළව ඉල්ලීම් ලිපි 10ක ගැටලු විසඳීම.

4. මුහුණ දෙන ලද අභියෝග



1. කජීමාවත්ත ගින්න - 2021.03.15 වන දින කජීමාවත්ත පිහිටි පැල්පත් 27ක් ගිනි ගෙන විනාශ විය. එම පැල්පත්වාසීන් මෝදර උයන ප්‍රජා ශාලාව ආශ්‍රිත කඳවුරක් වෙත යොමු කළ අතර 2021.04.07 දින වන තෙක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, කොළඹ මහා නගර සභාව සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය සහිතව ඔවුන් වෙත ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය උපකරණ ලබා දෙන ලදී. 2021.04.10 දින ඔවුන් නැවත පෙර ස්ථානවලම පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලදී.



2. ගංවතුර - 2021 මැයි,ජූනි මාසවලදී කැලණි ගඟේ ජල මට්ටම ඉහළ යාම සමඟ ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් නිවාස 500කට අධික ප්‍රමාණයක පුද්ගලයින් 1000කට අධික සංඛ්‍යාවක් පීඩාවට පත් වූ අතර ආපදාවට ලක් වූ පවුල් වෙත පිසූ ආහාර බෙදා දෙන ලදී. මේ සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම්තුමාද සහභාගි විය.

3. කොවිඩ් 19 - කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2021 මැයි මාසය සහ 2021 අගෝස්තු 20 සිට ඔක්තෝබර් 01 දින දක්වා හුදෙකලා තත්ත්වයේ පැවති. කොරෝනා තුන්වන රැල්ල යටතේ මුළු කොට්ඨාසයම හුදෙකලා තත්ත්වයට පත් කර තිබියදී කාර්යාලයීය නිලධාරීන්ගේ සෞඛ්‍යාරක්ෂාව සුරක්ෂිත කරමින් පීඩාවට පත් වූ කොට්ඨාසයේ ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කරමින් ඔවුන්ට සහන සලසන ලදී.

4. එක්ස්ප්‍රස් පර්ල් නෞකාව හානි වීම හේතුවෙන් බලපෑමට ලක් වූ ධීවර ජනතාව වෙත වන්දි ලබා දීම සිදු කරන ලදී.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය

2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය 89% මට්ටමට ළඟා වී ඇත

6. ඉදිරි ඉලක්ක



කොවිඩ් 19 වසංගතය ඇතුළු අනපේක්ෂිත තත්ත්වයන් හමුවේ සියලුම ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කර ගනිමින් හා 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අරමුණු ළඟා කර ගැනීමට රාජ්‍ය ප්‍රතිපත්ති හා යහපාලන මූලධර්ම අනුගමනය කරමින් කොළඹ ජනතාව තෘප්තිමත් වන ලෙස ඔවුන්ගේ අවශ්‍යතා කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර දීම.

1.5.7 තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ශ්‍රී ලංකාවේ වාණිජ අග නගරය වන කොළඹ කේන්ද්‍ර කර ගනිමින් වර්ග කිලෝමීටර 22 ක වපසරියක් තුල ග්‍රාම නිලධාරී වසම් 20 ක් ආවරණය වන පරිදි 1999 මාර්තු 03 වන දින ප්‍රමුඛ පෙළේ රාජ්‍ය පරිපාලන ආයතනයක් ලෙස පිහිටුවන ලදී.

2. ප්‍රධාන කාර්යයන්



උපත්,විවාහ හා මරණ ලියාපදිංචි කටයුතු කිරීම, අවසරපත්‍ර / බලපත්‍ර හා සහතිකපත් නිකුත්කිරීම , ඉඩම් පරිපාලනය සම්බන්ධ කටයුතු කිරීම, සමාජ සුභ සාධන සහ සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ප්‍රසම්පාදන කටයුතු කිරීම, විශ්‍රාම වැටුප් ගෙවීම හා සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලඟා කරගෙන ඇති විජයග්‍රහණ



- ජාතික වලදායිතා සම්මානය *2019,2020* සමස්ථ ලංකා දෙවන ස්ථානය හිමි කර ගැනිම.
- කොවිඩ්-*19* වසංගත තත්ත්වය හමුවේ කොට්ඨාසයේ ජනතාවගේ ජීවන තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීම වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ ආපදා සහන සැලසීම.
- රෙජිස්ට්‍රාර් අංශය සඳහා පෝලිම් කළමනාකරණ පද්ධති ස්ථාපනය කිරීම මඟින් සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම.
- වාර්තාගත උපත්, විවාහ හා මරණ සහතික පත්‍ර සංඛ්‍යාවක් නිකුත් කිරීම මඟින් ඉහළ ආදායමක් ඉපැයීම.
- උපාධිධාරී අභ්‍යාසලාභී හා බහුකාර්ය සේවා නවක නිලධාරීන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ හා පුහුණු වැඩසටහන් සාර්ථකව පැවැත්වීම.
- කොවිඩ්-*19* වසංගත තත්ත්වය හමුවේ කලා රසාස්වාදය ඔප්නැංවීම උදෙසා වැඩසටහන් සාර්ථක ලෙස පැවැත්වීම.
- මාර්ගගත අන්තර්ජාල සේවා ක්‍රමය මඟින් සේවා සැපයීම් කාර්යක්ෂම කිරීම

4. මුහුණ දෙන ලද අභියෝග



- මැතිවරණ කොට්ඨාශ 03 ක්, ග්‍රාම නිලධාරී කොට්ඨාස 20කින් ආවරණය කිරීම.
- කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ කොට්ඨාසයේ ජනතාවගේ ජීවන තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීම වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ ආපදා සහන සැලසීම.
- අධික ජනඝනත්වයක් සහිත කොට්ඨාසයකට සේවා සැපයීමේ දී කාර්යාලය සතු වූ සීමිත කාර්ය මණ්ඩලයක් මඟින් සිදු කළ යුතු වීම.
- කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ ඩෙංගු උවදුර මැඩලීම.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය



2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ලඟා කරගෙන ඇති ප්‍රගතිය 85% කි.

6. ඉදිරි ඉලක්ක



- කොවිඩ්-*19* වසංගත තත්ත්වය යටතේ ආයතනය මඟින් ලබාදෙන සියළු සේවාවන් කිසිදු බාධාවකින් තොරව අඛණ්ඩව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම.
- මාර්ගගත අන්තර්ජාල සේවා ක්‍රමය මඟින් සේවා සැපයීම් වඩා කාර්යක්ෂම කිරීම
- හදිසි ආපදා තත්ත්වයන් හමුවේ සහන සැපයීම.
- ආයතනයේ සමස්ථ වලදායිතාවය තවදුරටත් ඉහළ නැංවීම.

1.5.8 පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පහතරට තෙත් කලාපයට අයත් වන අතර, බස්නාහිර පළාතේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ හෝමාගම හා අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාස දෙකටම අයත් භූමිය තුළ ග්‍රාම නිලධාරී වසම් 46ක් පුරා පැතිරී ඇත. එය උතුරින් - සිතාවක, නැගෙනහිරින් - ඇහැලියගොඩ, දකුණින් - ඉංගිරිය හා හොරණ, බටහිරින් - හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට මායිම් වේ.

2. ප්‍රධාන කාර්යයන්



- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරිපාලනය පවත්වා ගෙන යාම.
- කොට්ඨාසය තුළ භෞතික, ආර්ථික, සමාජ ගැටළු සඳහා විසඳුම් ලබාදීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංවර්ධනය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම හා අධීක්ෂණය.

3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලඟා කරගෙන ඇති විජයග්‍රහණ



- කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් අවදානම් කාලසීමාවේ දී අඛණ්ඩව මහජන සේවාවන් පවත්වා ගෙන යාම.
- අපේක්ෂිත ප්‍රගතිය ලඟා කරගනිමින් මහජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීම.
- කොට්ඨාසය තුළ කොරෝනා රෝග ව්‍යාප්තිය අවම මට්ටමකින් පවත්වා ගනිමින් මහජනතාව වෙත අවශ්‍ය පහසුකම් සැලසීමේ සම්බන්ධීකරණ කටයුතු මනාව ඉටු කිරීම.



- සමාජ ආරක්ෂණ මණ්ඩලයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ 2021 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වැඩිම මූල්‍ය දායකත්වයක් ලබාදීමට හැකිවීම.
- කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු වූ අතර ඒ සඳහා සහය වෙමින් කොට්ඨාසයේ දරුවන් 09 දෙනෙකු සඳහා ජංගම දුරකථන ප්‍රදානය කළ අතර තවත් දරුවන් 10 දෙනෙකු සඳහා කැපකරු ශිෂ්‍යත්ව ප්‍රදානය සිදු කරන ලදී.
- කිරුමි මිනුම් උපකරණ ජංගම සත්‍යෝක්ෂණ මධ්‍යස්ථාන වැඩසටහනේ වැඩිම ආදායමක් අප කොට්ඨාසයෙන් ලබා ගැනීමට හැකි වීම.

- කෝවිඩ් 19 වසංගත කාලයේ දී සතොස හරහා සහන මළු වැඩිම ප්‍රමාණයක් අලෙවි කර ප්‍රාදේශිය මහජනතාවට සහන සැලසීම.



4. මුහුණ දෙනලද අභියෝග

කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් පැවැති තත්ත්වය හා අපහසුතා මැද අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට සිදුවීම.



5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

- ආයතන අංශය - 71%
- සමාජ සංවර්ධන අංශය - 131%
- ගිණුම් අංශය - 101%
- සැලසුම් අංශය - 105%
- රෙජිස්ට්‍රාර් අංශය - 108%
- සමෘද්ධි අංශය - 105%

6. ඉදිරි ඉලක්ක

- රජය විසින් පවරනු ලබන කාර්යයන් හා ඉලක්ක සපුරාලීම සහ මහජනතාවට තෘප්තිමත් සේවයක් සැලසීම.

1.5.9 රත්මලාන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට ග්‍රාම නිලදාරී වසම් *13*ක් ඇතුලත්ව තිබෙන අතර, මෙහි භූමි ප්‍රමාණය වර්ග කි.මී. *13.17* කි. ප්‍රදේශයේ මුළු ජනගහනය *100875* කි.

දැක්ම - යුගයේ අභියෝග ජයගනිමින් ජන හිතවාදී රාජ්‍ය සේවයේ ප්‍රාදේශිය කේන්ද්‍රස්ථානය වීම.

මෙහෙවර - මහජන හිතකාමී

ආකල්ප පෙරදැරිව නව තාක්ෂණය යොදා ගනිමින් ව්‍යවස්ථාපිත මහජන සේවාවන් හා කොට්ඨාසයේ භෞතික හා සමාජ සංවර්ධනය සඳහා කටයුතු කිරීම.

2. ප්‍රධාන කාර්යයන්



- මධ්‍යම රජය හා පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- කොට්ඨාසය තුළ ආදායම් බදු මුදල් එකතු කිරීම .
- සමාජ සුභ සාධන හා සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රජයේ ඉඩම් සම්බන්ධ රාජකාරී කටයුතු.

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ලඟා කර ගෙන ඇති විජයග්‍රහණ



කොවිඩ් *19* වසංගතය හමුවේ වුවද සෞඛ්‍ය නීති අනුගමනය කරමින් මහජන සේවාවන් උපරිමයෙන් සලසාදීම.

4. මුහුණ දෙනලද අභියෝග



- කොරෝනා වසංගතය හේතුවෙන් සැලසුම් කළ සියළුම ක්‍රියාකාරකම් වෙනස් විය. ප්‍රදේශයේ ජනතාවගේ උපතේ සිට මරණය දක්වා වන සේවාවන් රැසක් ඉටු කරන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරීන්ට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම. කාර්යාලයේ කාර්යයන්ට සාපේක්ෂව ඉඩකඩ මදිකම.
- ඇතැම් තනතුරු සඳහා නිලධාරීන් නොමැති වීම.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය



- සමස්ථ භෞතික ප්‍රගතිය *100%*

6. ඉලක්ක



1. 2022 ක්‍රියාකාරී සැලැස්ම *100%* ක්ම සාර්ථක කර ගැනීම.

2. වෙනත් භූමියක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ස්ථාපිත කර ගැනීම.

1.5.10 කැස්බැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම.



ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන අතුරින් වඩාත් සජීවී ආකාරයට ක්‍රියාත්මක වීම හා ප්‍රාදේශිය පරිපාලනයේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීම.

2. ප්‍රධාන කාර්යයන්.



දිළිඳුකම අවම කිරීම/ නීතිය හා සාමය සුරක්ෂා කිරීම/ ප්‍රදේශිය සංවර්ධනය/මූල්‍ය සේවා පුළුල් කිරීම/ රැකියා වුයුක්තිය අවම කිරීම/ රාජ්‍ය ආදයම් ලබා ගැනීම/ විශ්‍රාම වැටුප් ප්‍රදානය/ ඉඩම් ප්‍රදාන/ සමාජ සම්බන්ධීකරණ කටයුතු / ආපදා කළමනාකරණ කටයුතු / වසංගත රෝග මර්දන කටයුතු.



3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලඟා කරගෙන ඇති විජයග්‍රහණ



තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේ පැවති වසංගත තත්ත්වය හමුවේ ජන ජීවිතය සාමාන්‍ය අයුරින් පවත්වා ගැනිමට අවශ්‍ය සේවාවන් සැපයීමේදී නන් අයුරින් සාමුහිකව කටයුතු කිරීම.
දිවයින පුරා උප්පැන්න සහතික නිකුත් කිරීමේ කවුළුව විවෘත කිරීම..
වලදායිතා විශේෂ කුසලතා සම්මානයෙන් පිදුම් ලැබීම.

4. මුහුණ දෙන ලද අභියෝග.



ග්‍රාම නිලධාරී වසම් 73 ක්, අධික ජන ඝනත්වයක් ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක් වන බැවින් තම කාර්යයන් ඉටු කර ගැනීමට පැමිණෙන මහජනතාව උදෙසා කාර්යක්ෂම සේවාවක් ලබා දීමට හැකිවන පරිදි අවශ්‍ය ඉඩ පහසුකම් හා සීමිත සම්පත් කළමණාකරණය කිරීම මගින් අවශ්‍ය සේවාවන් සැපයීම.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය.



වාර්ෂික ප්‍රගතිය - 90% කි.

6. ඉදිරි ඉලක්ක.

පවතින වසංගත තත්ත්වය හමුවේ මානව හා භෞතික සංවර්ධනය තුලින් දිළිඳුකම අවම කිරීම සඳහා සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තින් ක්‍රියාත්මක කිරීම මගින් ඒ හා සම්බන්ධ ඉලක්ක සපුරා ගැනිම.

1.5.11 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



බස්නාහිර පළාතට අයත් කොළඹ දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන පරිපාලන අග නගරය තුළ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පිහිටා ඇත. හෙක්ටයාර 1700 ක භූමි ප්‍රමාණයකින් යුක්ත මෙම කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 20 කින් සමන්විත වන අතර, වැඩි ජන සංඛ්‍යාවකගේ ප්‍රධාන ජීවනෝපාය සේවා අංශය මත පදනම් වී තිබේ.

2. ප්‍රධාන කාර්යයන්



කාර්යාලයීය සේවාවන් සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම, ප්‍රතිලාභ නොලද හා පීඩා විඳින සමාජ කණ්ඩායම් සහන සැලසීම් තුළින් සමාජ සංවර්ධනය, ප්‍රදේශයේ තිරසාර සංවර්ධනය ශක්තිමත් කිරීම, සමස්ථ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා මනා මූල්‍ය කළමනාකරණය, උපත්, විවාහ, මරණ සහතික පිටපත් නිකුත් කිරීම හා එම සහතික ආරක්ෂා කිරීම තුළින් ජනතාවගේ අයිතින් ආරක්ෂා කිරීම. විවිධ රේඛීය අමාත්‍යාංශ, මන්ත්‍රී ප්‍රතිපාදන හා විවිධ සංවර්ධන වැඩසටහන් යටතේ ලැබෙන ප්‍රතිපාදන ඵලදායීව යොදා ගනිමින් කොට්ඨාසයේ සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම. කොට්ඨාසයේ මහජනතාව විසින් ඉදිරිපත් කරන ගැටලු නිරාකරණය කරගැනීමට අවශ්‍ය ආයතන සම්බන්ධ කර ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලගා කර ගෙන ඇති විජයග්‍රහණ.



2021 වර්ෂය තුළ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.මි.20ක් වටිනා ව්‍යාපෘති 152 ක්ද,ඇඟළුම් ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන හා යටිතල පහසුකම් වැඩසටහන යටතේ සියලුම ව්‍යාපෘතිද සාර්ථකව නිම කර (ප්‍රගතිය 100%) කොට්ඨාසයේ සංවර්ධනයට දායක වීම



4. මුහුණ දෙන අභියෝග

කාර්යාල නිලධාරීන් සඳහා පහසුවෙන් රාජකාරී කටයුතු කිරීමට ප්‍රමාණවත් තරම් ඉඩකඩ නොමැති වීම, කාර්යාල නිලධාරීන්ට රාජකාරී ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිගණක, මුද්‍රණ යන්ත්‍ර ඇතුලු කාර්යාල උපකරණ ප්‍රමාණවත් නොවීම.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය.



වාර්ෂික ප්‍රගතිය 91%

6. ඉදිරි ඉලක්ක.



මහජනතාවට උපරිම සේවයක් ලබා දීම, දිස්ත්‍රික්කයේ සංවර්ධනය අතින් ප්‍රමුඛතම කොට්ඨාසය බවට පත් කිරීම, කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ජනතාවට උපරිම සහන සැලසීම, කොට්ඨාසයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම. කොට්ඨාසය වෙත වෙන්වන සංවර්ධන ව්‍යාපෘති ඵලදායීව සහ සාර්ථකව ඉටුකර මහජනතාවගේ ජීවනෝපාය සහ කොට්ඨාසයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

1.5.12 මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



මහරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඓතිහාසිකමය දීර්ඝ කාලීන ඉතිහාසයකට හිමිකම් නොකිවද වර්තමානයේ සමාජීය, ආර්ථික, සංස්කෘතික වටිනාකම් වලින් අනූන සේවා හා භාණ්ඩ සපයන නගරයක් ලෙස හැඳින්විය හැක. ග්‍රාම නිලධාරී වසම් 41 ක් යටතේ වර්ග කිලෝමීටර් 36.64 ක භූමි ප්‍රදේශයකින් යුක්ත අර්ධ නාගරික හා නාගරික 212,014 ක ජනතාවකට සේවය ඍජුවම සපයන අතර කොට්ඨාසය තුළ සමස්ථ ලාංකේය ප්‍රජාව සඳහාම මහඟු සේවා සපයන රාජ්‍ය ආයතන ගණනාවක් ස්ථාපිතව පවති.



2. ප්‍රධාන කාර්යයන්

ප්‍රදේශයේ වාසය කරන ජනතාවගේ එදිනෙදා අවශ්‍යවන රාජ්‍ය සේවාවන් කඩිනමින් සැලසීම, කොට්ඨාසය තුළ විවිධ අධ්‍යාපනික, සංස්කෘතික, ආගමික, සාමාජීය වැඩ සටහන් පැවත්වීම, සම්පත් සම්බන්ධීකරණය හා ජනතා සහභාගිත්වයෙන් යුත් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම, අපදා කළමනාකරණය හා සහන සේවා සැපයීම, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් කොට්ඨාසයේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම.



3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලබාගෙන ඇති විජයග්‍රහණ

2020 වර්ෂයේ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලද අන්තර් ප්‍රාදේශිය ලේකම් කාර්යාල තරඟයෙන් මුළු දිවයිනේම තෙවන ස්ථානය ලබාගැනීම.



4. මුහුණ දෙන අභියෝග

1. පරිපාලන නිලධාරී, පරිපාලන ග්‍රාම නිලධාරී, නිත්‍ය ඉඩම් විමර්ශන නිලධාරියෙක් නොමැතිවීම

2. වසම්වල සේවය කරන ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි නිලධාරීන් සඳහා පවතින කාර්යාල පහසුකම් සීමිත වීම.

3. කොවිඩ් 19 වසංගත අවධානම හමුවේ සාමාන්‍ය රාජකාරී ඉටුකිරීමේ දී හා සහන සැලසීමේ කටයුතු වලදී අතිවන සෞඛ්‍ය ආරක්ෂිත ගැටළු



5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය



2021 වර්ෂයේ කොවිඩ් වසංගත අවධානම් තත්ත්වය නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි 100% ක ප්‍රගතියක් අත් කර ගැනීමට නොහැකි වූ අතර 80% ක පමණ ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවිය.

6. ඉදිරි ඉලක්ක

නව තාක්ෂණ ක්‍රමවේද භාවිතයෙන් හා පවතින මානව සහ භෞතික සම්පත් ඵලදායිව කළමනාකරණය කර ගනිමින් කොට්ඨාසයේ ජනතාවට ප්‍රසස්ථ සේවයක් සැපයීම. රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් හා අදාළ බාහිර පාර්ශව සම්බන්ධීකරණයෙන් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම.

1.5.13 කොලොන්නාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

1. හැඳින්වීම



කොලොන්නාව මැතිවරණ කොට්ඨාසය වෙන් කරන ලද්දේ 1960 දශකයේය. ඉන්පසුව මෙය කොළඹින් වෙන් වූ ප්‍රදේශයක් බවට පත් විය. මේ වන විට ග්‍රාම සේවා වසම් 46 කින් සමන්විත වේ. මෙම කොට්ඨාසයේ ජන සංයුතිය අතින් විවිධ වන අතර සිංහල, ශ්‍රී ලංකා ද්‍රවිඩ, ඉන්දියානු ද්‍රවිඩ, යෝනක, මැලේ, බර්ගර් ආදී වශයෙන් ජන විවිධත්වයක් ප්‍රදේශය පුරා විසිර පවති.

2. ප්‍රධාන කාර්යයන්



රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව සේවා සැපයීම, සම්පත් සම්බන්ධීකරණය, ජනතා සහභාගිත්වයෙන් යුත් කාර්යක්ෂම තිරසාර හා සැලසුම් සහගත සංවර්ධන ක්‍රියාවලියක් තුළින් ප්‍රදේශයේ ජන ජීවිතය නංවාලීම හා ප්‍රාදේශිය පරිපාලනය ශක්තිමත් කිරීම තුළින් කාර්යක්ෂමව හා ඵලදායීව ජනතාවට උපරිම සේවයක් සැපයීම.

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ලඟා කරගෙන ඇති විජයග්‍රහණ



- ව්‍යාපෘති ප්‍රගතිය 100%
- ක්‍රීඩා ජයග්‍රහන

4. මුහුණ දෙන ලද අභියෝග



විටින් විට පැමිණෙන ආපදා වලට සාර්ථකව මුහුණ දීම.

උදා - ඟං වතුර, කුණු කන්ද කඩා වැටීම සහ කෝවිඩ් වසංගතය.

5. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය



සැලසුම් අංශය, ගිණුම් අංශය, ආයතන අංශය, රෙජිස්ට්‍රාර් අංශය, ක්ෂේත්‍ර නිලධාරී අංශය, සමෘද්ධි අංශය, විදාතා මධ්‍යස්ථානය යන සියලුම අංශවල ප්‍රගතිය 100% ක් සාර්ථක කරගැනීම.

6. ඉදිරි ඉලක්ක



- ඉඩ පහසුකම් සහිත කාර්යාල පරිශ්‍රයක් ඉදි කිරීම.
- සියලුම ව්‍යාපෘති සාර්ථකව නිම කිරීම.
- කොවිඩ්-19 වසංගතය තව දුරටත් මර්දනයට පියවර ගැනීම.
- මහජන සේවය නවීන තාක්ෂණය භාවිත කරමින් වඩා සෞඛ්‍යාරක්ෂිත හා කාර්යක්ෂමව සිදු කිරීම.

2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම (විශේෂ ජයග්‍රහණ/ අභියෝග/ ඉදිරි ඉලක්ක)

2.1 ආයතන අංශය

විශේෂ ජයග්‍රහණ

1. කොවිඩ්-19 වසංගත තත්ත්වය මත පැනවූ ඇඳිරිනිති කාලසීමාව තුළ දිස්ත්‍රික්කය ඇතුළත හා දිස්ත්‍රික්කයෙන් පිටත අත්‍යාවශ්‍ය කටයුතු සඳහා සංචරණය කිරීමට සීමාසහිත කාර්යමණ්ඩලයක් යොදාගෙන ජනතාවගේ අවශ්‍යතාව පරිදි ඇඳිරිනිති බලපත්‍ර ලබාදීමට කටයුතු කිරීම.

2. කොවිඩ්-19 උවදුර හමුවේ වුවද කාර්යාල කටයුතු බිඳ වැටීමකට ලක් නොකර සීමා සහිත කාර්ය මණ්ඩලයකින් කාර්යාල කටයුතු පවත්වා ගෙන යාම.

3. නිරෝධායනය වෙමින් සිටින පවුල් සඳහා රු. 5000 හා රු. 10000 වටිනාකමකින් යුත් බඩු මළු ලබා දීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම තුළින් කොළඹ දිස්ත්‍රික් ජනතාවගේ ජන ජීවිතය බිඳවැටීමකට ලක් නොකිරීම.

4. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 ට අදාලව සේවාලාභීන්ගෙන් පැමිනෙන පැමිණිලි සම්බන්ධයෙන් අපක්ෂපාතිව විමර්ශන කටයුතු පැවැත්වීම හේතුවෙන් වංචාව දූෂණය අවම කිරීමට හැකිවීම.

5. කොවිඩ්-19 වසංගත හමුවේ වුවද වසරේ ඉලක්කගත මූලික විමර්ශන ගණන අවසන් කිරීමට හැකිවීම.

6. කොවිඩ් - 19 වසංගතය හමුවේ වුවද දිස්ත්‍රික්කයේ නිලධාරීන් සඳහා සේවක අභිප්‍රේරණ වැඩසටහන් පැවැත්වීමට හැකිවීම.

7. කොවිඩ් - 19 උවදුර හමුවේ වුවද මුළු දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ගෙන යාමට හැකිවීම.

8. කොවිඩ් - 19 වසංගතය කාලය තුළ දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර්වරුන් බදවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට හැකිවීම.

9. කොළඹ දිස්ත්‍රිකයේ කළමනාකරණ සේවා නිලධාරී 1 ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉමි විභාගය නිදහස් කිරීමට අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීම.

10. ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල පවතින්නාවූ ඉඩම් ගැටළු කඩිනමින් විසඳීමට පියවර ගැනීම.

12. තැපෑල කටයුතු ඉතාමත් සුපරීක්ෂාකාරීව සිදුකිරීමට හා එහි විධිමත් භාවයක් ඇතිකිරීම සඳහා නව තැපැල් අංශයක් ස්ථාපිත කිරීම හා තැපෑල සඳහා පරිෂනක දත්ත පද්ධතියක් හඳුන්වාදීම.

අභියෝග

1. කොවිඩ්-19 හමුවේ සේවය සඳහා නිලධාරී මණ්ඩලය කැඳවීමේ අපහසුතාව හා නිළධාරීන්ට ප්‍රවාහනය පහසුකම් සැපයීමට සිදුවීම මත කාර්යාල කටයුතු මැනවින් සිදු කිරීමට ඇති අපහසුතාව.

2 කාර්යාලයේ ඵලදායිතා කටයුතු නිසි ආකාරයෙන් බලාපොරොත්තු වූ පරිදි සිදු කර ගැනීමට නොහැකි වීම.

3. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ 2022 වර්ෂය සඳහා ගිනි අවි බලපත්‍ර ලබා දීමට කටයුතු කිරීම.

4 සීමිත කාලසීමාවක් තුළ පැමිණෙන හදිසි රාජකාරි කටයුතු වලදී දෛනික රාජකාරී කටයුතු සමඟ කළමණාකරණය කර ගනිමින් කටයුතු කිරීමට සිදුවීම.

5. කොවිඩ් - 19 වලට අදාලව සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුකූලව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

6. කොවිඩ්-19 හමුවේ විමර්ශන කටයුතු සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම සඳහා ක්ෂේත්‍ර යාම් නිසි අයුරින් සිදුකිරීමට නොහැකිවීම හා පරීක්ෂණ කටයුතු සීමා කිරීම් මත සිදුකිරීමට සිදුවීම.

7. අංශය තුළ පැවති කාර්යාල කළමණාකරණ සේවයේ අධික පුරප්පාඩු ප්‍රමාණය මත රාජකාරී කටයුතු සිදුකිරීමට සිදුවීම.

8. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුවද ජනතාව සඳහා අඛන්ඩව සේවා සැපයීමට සිදුවීම.

ඉදිරි ඉලක්ක

1. 2022 වර්ෂයේ ආයතන අංශයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය 100% වැඩිකිරීමට කටයුතු කිරීම.

2. නිලධාරීන්ගේ සේවා තෘප්තිය වර්ධනය වන ආකාරයේ වැඩසටහන් නිර්මාණය කිරීම.

3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගනිමින් අවශ්‍ය සියලු කටයුතු කාර්යක්ෂමව පවත්වා ගැනීම.

4. කොවිඩ්-19 උවදුර හමුවේ වුවද කාර්යාල කටයුතු බිඳ නොවැටී පවත්වා ගැනීමට කටයුතු කිරීම.

5. සංවර්ධන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී, රියදුරු හා කාර්යාල කාර්ය සහයක තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.

6. අංශයේ නිලධාරීන් සඳහා විධිමත් පුහුණු වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම.

7. ක්ෂණිකව සිදු කරන දැනුම් දීම අනුව කෙටි කාලයකින් සංවිධානය කිරීමට සිදුවන විවිධ වැඩසටහන් සාර්ථකව පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර පවත්වාගෙන යාම.

8. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජනතාව වෙතින් පැමිණෙන පැමිණිලි සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම හා ක්‍රියාත්මක කිරීම.

2.2 **දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය**

විශේෂ ජයග්‍රහන.

1. Covid-19 වසංගත රෝග තත්වයේ වුවද ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මගින් 95% කට වැඩි භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට සමත්වීම.
2. දිස්ත්‍රික්කයේ ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති හඳුනාගත් ගැටළු සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් විසඳුම් ලබා දීමට හැකිවීම.

- ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුත්ගමුව ග්‍රාම නිලධාරී වසමේ පදිංචි පවුල් 42ක් හේනමුල්ල නිවාස සංකීර්ණයේ පදිංචි කරවීමට කටයුතු කිරීම හා එම අනවසර පදිංචිකරුවන් පදිංචිව සිටි භූමිය තෙත්බිම් කලාපයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.
- සිතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටහැර ප්‍රදේශයේ නායයෑම් අවධානමට ලක්වී සිටින පවුල් නැවත පදිංචි කිරීම
  i. අධි අවදානම් පවුල් 07ක් වෙනත් ස්ථානවල පදිංචි කරවීම.
  ii. මධ්‍යම අවදානම් තත්ත්වයේ පවතින පවුල් 129 පදිංචි වී සිටින භූමිය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශයන්ට අනුකූලව ස්ථාපිත කිරීම.
- තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර පාමංකඩ නුගගහපුර නිවාස ක්‍රමයේ පස් කණ්ඩිය ස්ථාවර කිරීම සඳහා ඉඳිකරමින් පැවැති ආරක්ෂිත බැම්ම විරෝධතා හේතුවෙන් අතරමග නැවති පැවති අතර, එම විරෝධතාවය සමථයකට පත්කර බැම්ම ඉඳිකිරීම හා එමගින් ආපදා තත්වය මඟ හරවා පදිංචිකරුවන්ගේ පදිංචි ස්ථාන සුරක්ෂිත කිරීම.
- කඩුවෙල තලාහේන ප්‍රදේශයේ ගං වතුර ආපදා තත්ත්වයට බලපෑ අනවසර හා අක්‍රමවත් ඉදිකිරීම් ඉවත් කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05ක නිසි පරිදි නඩත්තු නොවන ඇළ මාර්ග 51 ක් ප්‍රතිසංස්කරණය කිරීමට රු.මි. 4.6 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර එමගින් දිස්ත්‍රික්කයේ අස්වැද්දිය හැකි කුඹුරු වපසරිය ඉහල නැංවීම හා පුරන් කුඹුරු ප්‍රමාණය අඩු කිරීමට හැකිවීම.
- නාගරික සංවර්ධන අධිකාරියට අයත් වූ මාඳිවෙල කිඹුලාවල ආදර්ශ යාය 01 කොටසේ කුඹුරු ජලයෙන් යටවීම වැළැක්වීම සඳහා කුඹුරු දෙපස ඇළ මාර්ගයේ ඇළ කණ්ඩිය කැඩී ඇති ස්ථාන පිළිසකර කිරීම, තලවතුගොඩ කෝට්ටේ පාර අසල ඇනිකට් එක පිළිසකර කිරීම හා බෝධිරාජ මාවත අසල බෝක්කුව පිළිසකර කිරීම තුළින් එම යායේ වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය වැඩි කිරීම

- කොළොන්නාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කුරුණියාවත්ත ග්‍රේලයින් ආයතනය අසල සිදු කර තිබූ අනවසර ඉදිකිරීම හා පස් පිරවීම ඉවත් කිරීම මගින් අවට පදිංචිකරුවන්ගේ නිවාස හා දේපලවලට සිදුවන ගංවතුර හානි අවම කිරීම.
- හංවැල්ල සිතාවක වෙළඳ සංකීර්ණයේ කඩ 80ක පමණ කුලි, සිතාවක ප්‍රාදේශිය සභාව විසින් වැඩි කිරීම හේතුවෙන් එම කඩහිමියන් මුහුණ පා සිටි ගැටළුවට පිළියමක් ලෙස සහනදායී පදනමකට අනුව හිඟ කුලි අය කර ගැනීමට ප්‍රාදේශිය සභාව හා කඩහිමියන් අතර එකඟතාවකට එළඹීම තුළින් එම පාර්ශව අතර පැවති අනවබෝධය හා ආරවුල් තත්ත්වය සමථයකට පත්කිරීම.
- හෝමාගම හා කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ආක්‍රමණශීලී යෝධ නිදිකුම්බා ශාක මර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම මඟින් කුඹුරු හා වෙනත් වගාවන්ට සිදුවන හානිය අවමවීම.
- ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් වැඩි කර තිබූ ගලි රටාවලින් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලින් අය කරන ගාස්තුව නැවත අඩු කිරීම තුළින් එම ආයතනවල පිරිවැය අඩුවීම.
- බොල්ගොඩ ජලාශයේ දැල්කූඩු තුළ මත්ස්‍ය වගා ව්‍යාපෘතිය විධිමත්ව හා නෛතික භාවයකින් යුතුව ආරම්භ කිරීම තුළින් එම ජලාශය ආශ්‍රිතව ධීවර කර්මාන්තයේ නියැළෙන ධීවර ප්‍රජාවගේ ආදායම් මට්ටම හා මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම.
- බෙල්ලන්විල-අත්තිඩිය අභය භූමියේ වනජීවී කාර්යාලයක් පිහිටුවීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිල නිවස පිහිටි ඉඩම වනජීවී දෙපාර්තමේන්තුවට පවරා ගැනීම හා වනජීවී කාර්යාලය එහි පිහිටුවීම මගින් අභය භූමියේ ආරක්ෂාව සහතික කර ගැනීම හා අභය භූමියට අයත් ඉඩමේ මැනුම් කටයුතු සිදුකර සිතියම සකස් කිරීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ විහාරස්ථාන හා ශීල මාතා ආරාමවල නිරවුල් නොවූ ඔප්පු සහිත ඉඩම්වලට නිරවුල් ඔප්පු හා හිමිකම් ලබාදීම සඳහා විහාරස්ථාන 85 ක තොරතුරු ලබාගෙන ඇත. එම ඉඩම් අයිති ආයතන සමග සම්බන්ධවී සාකච්ඡා පවත්වා නිරවුල් ඔප්පු හා හිමිකම් ලබාදීමට කටයුතු කෙරෙමින් පවති.
- සුරකිමු ගංගා වැඩසටහන පරිසර අමාත්‍යාංශය හා සම්බන්ධ වී ක්‍රියාත්මක කල අතර මෙමගින් කැළණි ගඟ හා අතු ගංගා ආශ්‍රිතව ගංවතුර පාලනය කිරීම හා ගංගාවන් දූෂණය වීම වැලැක්වීම සඳහා පියවර ගන්නා ලදී.
- හුස්ම දෙනතුරු රුක් රෝපණ වැඩ සටහන යටතේ පරිසර අමාත්‍යාංශය මගින් පැල ලබාදීම සිදුකල අතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවලට එම පැල ලබාදී පාසැල්වල, පොදු ස්ථාන, පන්සල්, රෝහල්, මංතීරු හා ගං ඉවුරු අසල රෝපණය කිරීමට කටයුතු කර ඇත.
- කාබනික පොහොර වැඩසටහන මගින් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ගොවිජන සංවර්ධන නිලධාරීන් හා කෘෂිකර්ම උපදේශකවරුන් හා තෝරාගත් ගොවි සංවිධාන සාමාජිකයින්ගේ ගැටළු සම්බන්ධ මූලික සාකච්ඡාවක් පවත්වා පාදුක්ක, සීතාවක, කැස්බෑව හා මහරගම

යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කාබනික පොහොර නිෂ්පාදනකරුවන්ගේ ධාරිතාව ඉහල නැංවීමට කටයුතු කිරීම.

- එක් ගමකට එක් ව්‍යවසායකයෙකු බිහිකිරීමේ වැඩ සටහන යටතේ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදනයට යොමුකර ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවීම

<u>අභියෝග.</u>

- කොළඹ දිස්ත්‍රික්කයේ පැල්පත්වාසී ජනතාව වෙසෙන ප්‍රදේශවල මාර්ග සංවර්ධනය කිරීම
- අඩු පහසුකම් සහිත නිවාසවල ජීවත්වන ජනතාවගේ නිවාස හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම
- ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීම
- දිස්ත්‍රික්කය තුළ අඩු ආදායම්ලාභී ජනතාවගේ ආදායම ඉහළ නැංවීමේදී ඔවුන්ව නිෂ්පාදන ක්ෂේත්‍රවලට යොමු කරවීම
- අනවසර හා කුලී පදනම්න් පදිංචිව සිටින නිවැසියන්ගේ නිවාස පහසුකම් වැඩිදියුණු කිරීමට පවතින නෛතික ගැටළු

ඉදිරි ඉලක්ක.

2022 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට යෝජිත ගම සමඟ පිළිසඳර වැඩසටහනට රු. මි. 4585 ක් ද විමධ්‍යගත අයවැය වැඩසටහනට රු.මි.315 ක් ද වශයෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයට වෙන්වී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.4900 කි. ඒ අනුව සමාජ සුභසාධනය, පොදු යටිතල පහසුකම් සංවර්ධනය, පරිසර, තිරසර හා ජීවනෝපාය සංවර්ධනය, සමාජ සුභසාධන හා සමාජ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණු වේ.

ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ ප්‍රතිපාදන බෙදී යාම පහත පරිදි වේ.

- ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් - රු.මි. 1671
  (වසමකට - රු.මි. 03 බැගින් වසම් 557 සඳහා)
- පළාත් පාලන කොට්ඨාශ මට්ටමින් - රු.මි. 1212
  (පළාත් පාලන කොට්ඨාශයකට - රු.මි.04 බැගින්)
- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයෙකුට - රු.මි. 1300
  රු.මි.100 බැගින් 13 දෙනෙකු සඳහා
- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු උප සභාපතිවරයෙකුට රු.මි.20 බැගින්
  18 දෙනෙකු සඳහා හා කමිටු නියෝජිතවරුන් සඳහා - රු.මි. 0402

  එකතුව - රු.මි. 4585

එසේම ගම සමඟ පිළිසඳර වැඩසටහනට වෙන්වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය සංරචක 4ක් යටතේ බෙදීගොස් ඇති ආකාරය ද පහත පරිදි දැක්විය හැකිය.

- සමාජ සුභ සාධන වැඩ සටහන - රු.මි. 1834
- පොදු යටිතල පහසුකම් වැඩ සටහන - රු.මි. 1834

- ❖ පරිසර හා තිරසර සංවර්ධන වැඩ සටහන - රු.මි. 458,5
- ❖ සමාජ සුභ සාධන හා සමාජ සංවර්ධන වැඩ සටහන - රු.මි. 458,5

- එසේම 2022 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 19 ක් හා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් 02 ක් සඳහා රුපියල් මිලියන 15 බැගින් වෙන්වන රුපියල් මිලියන 315 ක් සඳහා ඉඳිරිපත්වන ව්‍යාපෘති යෝජනා ක්‍රියාවට නැංවීම මගින් ග්‍රාමීය ආර්ථිකය, යටිතල පහසුකම් හා සමාජීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- දිස්ත්‍රික්කය තුළ දැනටමත් ස්වයං රැකියාවල නියුතු වූවන්ගේ නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ඇති පුරන් කුඹුරු වලදායී කාර්යයන් සඳහා යොදා ගැනීම.
- විසිතුරු මස්ත්‍ය නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට දිරිගන්වා අපනයනය සඳහා යොමුකරවීම.
- ධීවර ක්ෂේත්‍රයේ අගය එකතු කල නිෂ්පාදන ඉහල නැංවීම. (උදා- කරවල , උම්බලකඩ)
- දිස්ත්‍රික්කයේ කාබනික පොහොර අවශ්‍යතාවය දිස්ත්‍රික්කය තුළම සපුරාගැනීම.
- වගාවන් සඳහා ජලය විධිමත්ව ලබාදීමට දිස්ත්‍රික්කය තුළ පවතින වැව් හා අමුණු ප්‍රතිසංස්කරණය කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනාගන්නා ලද ග්‍රාමීය ක්‍රීඩාපිටි හා පාසැල් ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම
- ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීම තුලින් සාර්ව ආර්ථික අරමුණු ලඟාකර ගැනීම සඳහා දායකවීම.
- ග්‍රාමීය ආර්ථිකය සවිබල ගන්වා පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ ග්‍රාමීය හා අඩු ආදායමිලාභී පවුල් ඒකක සවිබල ගන්වා ඔවුන් රටේ ආර්ථිකය ගොඩනැගීමේ මෙහෙයුමට දායක කර ගැනීම හා යහපත් ජීවන රටාවක් ඇති කරලීම.
- "සෞභාග්‍ය" සංවර්ධන කාර්යාංශය මගින් ක්‍රියාත්මක වන "සෞභාග්‍ය" නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අඩු ආදායමිලාභී පවුල් සවිබල ගැන්වීම.

2.3 අභ්‍යන්තර විගණන අංශය

විශේෂ ජයග්‍රහණ,

01. විගණන සැලැස්මට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හයක පූර්ණ විගණන පරීක්ෂණ කටයුතු සිදුකිරීම හා සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බැංකු සැසඳුම් විගණනය සිදු කිරීම.

02. විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වල දී ගනු ලැබූ තීරණ අනුව දීර්ඝ කාලයක් අය නොවී පැවති හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීම.

03. රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අවධානයට යොමු වූ පොදු තැන්පත් ගිණුමේ පැවති කල් ඉකුත් වූ ශේෂයන් අදාල පාර්ශවයන්ට ගෙවීම් කිරීමට සහ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කිරීම.

04. අභ්‍යන්තර විගණන චක්‍රලේඛ නිකුත් කිරීම.

05. දිස්ත්‍රික් ලේකම් ගේ උපදෙස් හා මඟ පෙන්වීම මත විශේෂ විගණන පරීක්ෂණ සිදු කිරීම.

06. සංචරණ සීමා කාලය තුළ මීගොඩ, රත්මලාන, බෝකුන්දර හා නාරාහේන්පිට යන ආර්ථික මධ්‍යස්ථාන වලට අදාළව කරනු ලබන තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සපයන සැපයුම්කරුවන්ට අවශ්‍ය ඇදිරිනීති බලපත්‍ර නිකුත් කිරීම.

07. කොවිඩ් ව්‍යසනකාරී තත්වය යටතේ අතිරික්ත කෘෂි නිෂ්පාදන (එළවළු /පළතුරු) මහජනතාවට නොමිලේ ලබා දීමේ කටයුතු සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

08. ගංවතුරින් හානියට පත් වූ ප්‍රදේශවලට මනුසත් දෙරණ හා ඩයලොග් ආයතන මගින් ලබා දුන් ද්‍රව්‍ය බෙදා හැරීමේ කටයුතු සඳහා සහයෝගය ලබා දීම.

09. සතොස ආයතනය විසින් ලබා දෙන්නා වූ රු.1000 සහන බඩු මළු බෙදාහැරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

10. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කරනු ලබන එළවළු ගොවියාටත්, පාරිභෝගිකයාටත් සහන ගෙනෙන සහන එළිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

11. පුහුණු වැඩමුළු පැවැත්වීම.

- අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන්, අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා බදවා ගන්නා ලද නිලධාරීන් හා විමර්ශන අංශයේ නිලධාරීන් සඳහා සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව දැනුම ලබා දීමේ වැඩමුළුවක් පැවත්වීම.
- විමර්ශන අංශයේ නිලධාරීන් හා අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන්, සඳහා විමර්ශනය සම්බන්ධව දැනුම ලබා දීමේ වැඩමුළුවක් පැවත්වීම.
- අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා බදවා ගන්නා ලද නිලධාරීන්ගේ සේවා වලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රසම්පාදනය සම්බන්ධ වැඩමුළුවක් පැවත්වීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂවරු, ගණකාධිකාරීවරු, අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් හා අංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා බදවා ගන්නා ලද අභ්‍යන්තර විගණන අංශ නිලධාරීන්ට ව්‍යාපෘති සම්බන්ධ ඇස්තමේන්තු සකස් කිරීම හා විගණනය සම්බන්ධ වැඩමුළුවක් පැවත්වීම.

අභියෝග

- ප්‍රධාන අභ්‍යන්තර විගණක, සංවර්ධන නිලධාරීන් සිවිදෙනෙකු හා උපාධිධාරී අභ්‍යාසලාභීන් තිදෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් මඟින් දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීම සහ ඒවා නිවැරදි කිරීමට යෝජනා හා නිර්දේශ දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කිරීමේදී විගණන කටයුතු සිදුකිරීමට ඇති කාර්යාල සංඛ්‍යාව, විෂය පථය හා සසඳන කල මානව සම්පත ප්‍රමාණවත් නොවීම මත අභ්‍යන්තර විගණනය වෙනුවෙන් වෙන් කරන ලද කාලය අභියෝගයක් ලෙස දැක්විය හැකිය.
- 2021 වසරේ පැවති කොවිඩ් 19 ව්‍යාප්තිය සමccs ජන ජීවිතය අඩාල වූ ජනතාවට හා ගංවතුරෙන් විපතට පත් ජනතාවට සහන සැපයීමේ කටයුතු හමුවේ අභ්‍යන්තර විගණන අංශයේ රාජකාරී කටයුතු බාධාවකින් තොරව ඉටු කිරීම.

ඉදිරි ඉලක්ක

1. රාජ්‍ය ගිණුම් කටයුතු පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම සහ DMA 1-2019 චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් විගණන කලමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම හා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වල දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම.

2. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක 06/2018 (1) හා 2019.06.12 දිනැති චක්‍රලේඛය අනුව දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රාදේශීය විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

3. 2021 විගණන සැලැස්මට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන පරීක්ෂණ කටයුතු සිදු කිරීම.

2.4 දිස්ත්‍රික් ඉංජිනේරු අංශය

විශේෂ ජයග්‍රහණ

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති වල සහ නිළ නිවාස වල ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම
2. නිළ නිවාස වල අළුත්වැඩියා කටයුතු සියල්ල සම්පූර්ණ කිරීම
3. දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු රැස්වීම වර්ෂයට දෙවතාවක් පැවැත්වීම සහ නියමිත කාලය තුළදී අදාල වාර්තාව ලබා දීමට කටයුතු කිරීම
4. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබුනු ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කර දීමට කටයුතු කිරීම
5. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබුනු ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් සිදු කර භාර දීම
6. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අදාල ව්‍යාපෘති සඳහා අවශ්‍ය අධීක්ෂණ කටයුතු හා ප්‍රසම්පාදන කටයුතු සිදුකර ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු සිදු කිරීම

7. මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදුලි සෝපාන සපයා සවි කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය මාස 06ක් වුවද නියමිත කාලයට මාස 2 ක් පෙර ව්‍යාපෘතිය නිම කිරීම

අභියෝග

1. ඩොලර් හිඟතාවය මත රජයේ ආනයන සීමාවීම සහ දේශීය වෙළඳපලේහි සැපයීම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සහ ගොඩනැගිලි ඉදි කිරීමේ ද්‍රව්‍ය වෙලඳපලේ සොයා ගැනීම ඉතා දුෂ්කර වීම
2. ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය වල මිළ සීඝ්‍ර ලෙස ඉහල යාම
3. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති කටයුතු අඩාල වීම නිසා අපේක්ෂිත අරමුණු සියල්ල ඉටු කර ගැනීමේ දුෂ්කරතා පැවතීම
4. කොවිඩ් 19 වසංගත තත්ත්වයට මුහුණ දෙමින් රාජකාරී කටයුතු සිදු කිරීමට සිදු වීම
5. සංචරණ සීමා පැනවීම හේතුවෙන් කම්කරුවන් වැඩබිමට ගෙන්වා ගැනීමේ දුෂ්කරතා පැවතීම

ඉදිරි ඉලක්ක

1. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පසුගාමී වූ ව්‍යාපෘති අවසන් කිරීම
2. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලැබෙන නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
3. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හරහා ලැබෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
4. ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම
5. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක (කැස්බෑව, පාදුක්ක, කඩුවෙල, මහරගම, සීතාවක) විදුලි පද්ධති සඳහා සැලසුම් සකස් කිරීම හා අලුත්වැඩියා කටයුතු කිරීම
6. තාක්ෂණ නිලධාරීන්ගේ සහ තාක්ෂණ සහයක නිලධාරීන්ගේ තාක්ෂණික දැණුම වර්ධනය කිරීමේ අරමුණින් පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
7. දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව පවත්වා නියමිත කාල වේලාවට වාර්තාව සකස් කර අදාල ආයතන වලට ලබාදීම

2.5 සමෘද්ධි අංශය

විශේෂ ජයග්‍රහණ

1) සමෘද්ධි අරුණළු - ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි, ධීවර, සත්ව පාලන, අලෙවි හා කර්මාන්ත සංවර්ධන යන අංශ මඟින් ව්‍යාපෘති 1988ක් රු.81,343,651ක් වැය කරමින් ක්‍රියාත්මක කර ලීම.

- කෘෂි වැඩසටහන යටතේ සීතාවක, කොලොන්නාව, හෝමාගම, පාදුක්ක යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ප්‍රතිලාභීන් 118 දෙනෙකු සඳහා ව්‍යාපෘති 118ක් ක්‍රියාත්මක කිරීම.
- සත්ව පාලන වැඩසටහන යටතේ සීතාවක,ශ්‍රී ජයවර්ධනපුර, හෝමාගම, පාදුක්ක යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ප්‍රතිලාභීන් 71ක් දෙනෙකු සඳහා ව්‍යාපෘති 71 ක්‍රියාත්මක කිරීම.
- ධීවර වැඩසටහන යටතේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 07 දෙනෙකු සඳහා ව්‍යාපෘති 07ක් ක්‍රියාත්මක කරලීම.

- කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ සීතාවක, ශ්‍රී ජයවර්ධනපුර, කඩුවෙල, කොලොන්නාව, දෙහිවල, මොරටුව, කැස්බෑව, හෝමාගම, මහරගම, තිඹිරිගස්යාය, පාදුක්ක, රත්මලාන යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල ප්‍රතිලාභීන් 1,242 දෙනෙකු සඳහා ව්‍යාපෘති 1,242ක් ක්‍රියාත්මක කරලීම.
- අලෙවි සංවර්ධන වැඩසටහන යටතේ කොළඹ, සීතාවක, ශ්‍රී ජයවර්ධනපුර, කඩුවෙල, කොලොන්නාව, දෙහිවල, මොරටුව, කැස්බෑව, හෝමාගම, තිඹිරිගස්යාය, පාදුක්ක, රත්මලාන යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල ප්‍රතිලාභීන් 545 දෙනෙකු සඳහා ව්‍යාපෘති 545ක් ක්‍රියාත්මක කරලීම.

2) විශේෂ ව්‍යාපෘති වැඩසටහන යටතේ

- විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන යටතේ සීතාවක, ශ්‍රී ජයවර්ධනපුර, මොරටුව, කැස්බෑව, හෝමාගම, තිඹිරිගස්යාය හා පාදුක්ක යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල ප්‍රතිලාභීන් 27ක් සඳහා රු.1,353,876.00ක මුදලක් වැය කරමින් ව්‍යාපෘති 27ක් ක්‍රියාත්මක කරලීම.
- සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන කර්මාන්ත ප්‍රවර්ධනය යටතේ රූපලාවන්‍ය වැඩසටහන සීතාවක, කොලොන්නාව, මොරටුව, කැස්බෑව, හෝමාගම, මහරගම, තිඹිරිගස්යාය, පාදුක්ක හා රත්මලාන යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල රු.142,700.00ක මුදලක් වැය කරමින් ව්‍යාපෘති 27ක් ක්‍රියාත්මක කරලීම.

3) සමෘද්ධි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ

- කුකුළු පැටවුන් ලබාදීම

කුකුළු පැටවුන් ලබාදීම යටතේ කොළඹ, සීතාවක, ශ්‍රී ජයවර්ධනපුර, කඩුවෙල, කොලොන්නාව, මොරටුව, කැස්බෑව, හෝමාගම, මහරගම, පාදුක්ක, රත්මලාන යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ප්‍රතිලාභීන් 1458 දෙනෙකු සඳහා රු.5,833,600.00ක මුදලක් වැය කරමින් කුකුළු පැටවුන් 14770ක් බෙදා දීම.

- පොල් පැල ලබාදීම

පොල් පැල ලබාදීම යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල ප්‍රතිලාභීන් 7,075ක් සඳහා පොල් පැල 7,075ක් ලබාදෙන ලදී.

- බීජ පැකට් ලබාදීම

බීජ පැකට් ලබාදීම යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සඳහා රු.1,329,540.00ක මුදලක් වැය කරමින් බීජ පැකට් 22,159ක් ලබාදෙන ලදී.

- අපනයන බෝග වගාව

අපනයන බෝග වගාව යටතේ හෝමාගම, ශ්‍රී ජයවර්ධනපුර, පාදුක්ක, සීතාවක යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සඳහා රු.202,496.00ක මුදලක් වැය කරමින් ගම්මිරිස් පැල 7,232ක් ද රු.48,996.00ක මුදලක් වැය කරමින් කුරුඳු පැල 2,722ක් ද ලබාදෙන ලදී.

- පලතුරු පැල ලබාදීම

පලතුරු පැල ලබාදීම යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල ගෙවතු 23,418ක් සඳහා රු5,539,848.00ක මුදලක් වැය කරමින් පලතුරු පැල 45,488ක් ලබාදෙන ලදී.

4) සමාජ සංවර්ධන වැඩසටහන

- සමාජ සංවර්ධන හා පරිසර සංවර්ධන වැඩසටහන

දිරිය පියස නිවාස වැඩසටහන කොළඹ දිස්ත්‍රික්කයේ සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන් සඳහා ක්‍රියාත්මක වන වැඩසටහනකි. මෙම වැඩසටහන සඳහා තෝරා ගැනීමේ නිර්ණායක වන්නේ නිවාසයක් අහිමිව පවතින හා නිවාසයේ අඩුපාඩුකම් පවතින , වැන්දඹු, ස්වාමියා හැරගිය , ප්‍රතිලාභියා ආබාධිත මන්ද මානසික දරුවන් සිටින , ගැහැණු දරුවන් වැඩිපුර සිටින අනාරක්ෂිත නිවාස මේ සඳහා තෝරා ගනු ලබයි. 2021 වර්ෂයේ නිවාස 06 කට ප්‍රතිලාභී පවුල් 06 වෙනුවෙන් රු.ලක්ෂ 02 බැගින් ලක්ෂ 12 ක මුදලක් මේ සඳහා වැය කරන ලදී. එමෙන්ම විශේෂ නිවාස 78 ක් සඳහා රු. ලක්ෂ 2 බැගින් රු 15,600,000.00 ක මුදලක් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වෙත ලබාදී ඇත.රු,ලක්ෂ 06 බැගින් නිවාස 10ක් සඳහා රු.6,000,000.00 ක මුදලක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වෙත ලබාදී ඇත. එමෙන්ම ඉහත සෑම නිවසක්ම ලබාදුන් මුදලට වඩා වැඩි නිමි වටිණාකමකින් නිමකරන්නට සමත්ව ඇත.

- මත් නිවාරණ ගෘහ කලමනාකරණ වැඩසටහන

ඉහත වැඩසටහන සඳහා 2021 වර්ෂයේ කැස්බෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට පමණක් රු.30,000.00 ක මුදලක් වැයකරන ලදී ඒ ඔස්සේ මත් නිවාරණය පිළිබඳව සමෘද්ධි ප්‍රතිලාභීන් දැනුවත් කිරීම ප්‍රිතිමත් පවුල් ජීවිතයක් ගත කරමින් සමාජීය වශයෙන් උසස් ජීවිතයක් ගත කිරීම පිළිබඳව මෙම වැඩසටහන ඔස්සේ 75 ක පමණ ප්‍රතිලාභීන් පිරිසක් දැනුවත් කරන ලදී.

- සමෘද්ධි ළමා පුස්ථකාල වැඩසටහන

සමෘද්ධි ළමා සමාජ පුස්ථකාල ප්‍රවර්ධන වැඩසටහන සඳහා දිස්ත්‍රික්කයේ තොරාගන්නා ලද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 03 ක් සඳහා එකකට රු.25,000.00 බැගින් රු.75,000.00ක මුදලක් ලබාදී ඇත.මෙහි අරමුණ වන්නේ සමෘද්ධි කැකුළු ළමා සමාජවල දරුවන්ගේ කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීම,කියවීමට උනන්දුවක් ඇති කිරීම තුලින් දැනුමින් පිරි දරු පරපුරක් අනාගතයට දායාද කිරීමයි. මේ ඔස්සේ දරුවන් 300 කට අධික පිරිසකට ප්‍රතිලාභ හිමිවී ඇති අතර පුස්ථකාල 03 ක් ආරම්භ කර ඇත.

- සනීපාරක්ෂක වැඩසටහන

මේ සඳහා වැසිකිලියක් නොමැති හා තාවකාලික වැසිකිලි සහිත සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන් හට වැසිකිලියක් ඉදිකර ගැනීම සඳහා රු 30,000.00 ක මුදලක් ලබාදෙන ලද අතර එවැනි වැසිකිලි 81 ක් සඳහා රු2,430,000.00 ක මුදලක් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ලබාදී ඇත. මෙහි අරමුණ වන්නේ සෞඛ්‍යසම්පන්න නිරෝගිමත් සමාජයක් බිහි කිරීමයි.

සමාජ සංවර්ධන අංශයේ ඉදිරි දැක්ම වන්නේ පසුගිය වසරේ ක්‍රියාත්මක කල ඉහත වැඩසටහන් සියල්ල සහ කොරෝනා වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ වැඩසටහන් සියල්ලම 2022 වසරේදී කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමයි.

5) සමාජ ආරක්ෂණ වැඩසටහන

- සමාජ ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක වනු ලබන්නේ, සමාද්ධි ප්‍රතිලාභීන් විවිධ අවස්ථාවන් වලදී මුහුණ දෙන ප්‍රශ්ණ ගැටළු වලදී සමාජ ආරක්ෂණයන් ලබාදීමේ අරමුණෙනි.ඒ අනුව 2021 වර්ෂයේ සමෘද්ධිලාභී දරු උපත් 227ක් සඳහා රු.2270000.00ක්ද සමෘද්ධිලාභී විවාහ 911ක් සඳහා රු.9107500.00ක්ද රෝහල් ගතවීම් 2897ක් සඳහා රු.12203700.00ක්ද ප්‍රතිලාභී මරණ 2269ක් සඳහා රු.45305000.00ක්ද විශේෂ දරු උපත් 23ක් සඳහා රු.125000.00ක මුදලක් ද ප්‍රතිලාභීන් සඳහා නිදහස් කර ඇත.
- සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන මගින් උසස්පෙළ අධ්‍යාපනය හදාරණ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සියළු දරුවන් සඳහා මාසිකව රු.1500.00 බැගින් වර්ෂ දෙකක් පුරා ලබාදේ. මෙමගින් අපේක්ෂා කරන්නේ අඩු ආදායම් පවුල් වල දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා ඔවුන්ව දිරිගැන්වීමයි.2021 වර්ෂයේදී සිසු දරුවන් 26734ක් සඳහා රු.40101000.00ක මුදලක්ද ලබාදී ඇත.
- සමාජ ආරක්ෂණ වැඩසටහනේ ඉදිරි දැක්ම වන්නේ 2022 වර්ෂය තුල සමෘද්ධි ප්‍රතිලාභී ගෙවීම් කඩිනම්ව හා කාර්යක්ෂමව සිදුකර සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වලට උපරිම සේවයක් සිදුකිරීමයි.

6) ප්‍රජාමූල වැඩසටහන

- සෑම අතින්ම කාර්යක්ෂම ප්‍රජාමූල සංගම් 30ක් සඳහා රු.150,000ක් වටිනා කාර්යාල උපකරණ ලබා දීම.

7) සමෘද්ධි සහනාධාර හිමිකම්පත් ප්‍රදානය

අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් සමෘද්ධි සහනාධාරය ලබාදීම කොළඹ දිස්ත්‍රික්කයේ හදුනාගත් අඩු ආදායම්ලාභීන්ගේ පවුල් අතරින් කමිටුවක් මගින් තෝරාගත් සුදුසුකම්ලාභී පවුල් සඳහා සමෘද්ධි සහනාධාරය මාසිකව ලබා දෙන ලදී. රු.3500 ,රු.2500 හා රු.1500 වශයෙන් සහනාධාර ලබාදුන් අතර, 2021 දෙසැම්බර් මාසයේ දී පවුල් 53220 ක් වෙනුවෙන් රු. 123,204,480.00 ක මුදලක් වැය කරන ලදී.

- තව ද දිළිඳුකම ජයගෙන සමෘද්ධි වැඩසටහනින් ඉවත්වන පවුල්, සවිබල ගැන්වීම මත ඉවත්වන පවුල් හා ස්ව කැමැත්තෙන් සහනාධාරය භාර දෙන පවුල් වෙනුවෙන් සමෘද්ධි රන් සහතික පත්‍ර පිරිනැමීමට කටයුතු කළ අතර රන් සහතික පත්‍ර 176 ක් ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත ලබා දී ඇත.

8) සමෘද්ධි බැංකු සංගම් වැඩසටහන

- ඉතුරුම් වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභීන්ගේ ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම උදෙසා පවත්වන වැඩසටහනකි. මේ වන විට කොළඹ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභීන්ගේ පහත සඳහන් ගිණුම් යටතේ සාමාජික තැන්පත්, සාමාජික නොවන තැන්පත්, කොටස්, ළමා තැන්පත්, දිරිය මාතා තැන්පත්, කණ්ඩායම් තැන්පත්, ස්ථාවර තැන්පත් යන ගිණුම් යටතේ

ගිණුම් 2021.12.31 දිනට 635,191ක් සහ මුදල මිලියන 5,566,104,610.74 ක් ඉතිරි කර ඇත.

- ණය වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් මට්ටම වැඩිදියුණු කිරීම උදෙසා සමෘද්ධි බැංකු මගින් ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දෙනු ලබයි. මේ ඔස්සේ විවිධ ණය වැඩසටහන් ක්‍රියාත්මක වන අතර, 2021 වසර අවසන් වන විට ලබා දුන් ණය සංඛ්‍යාව 516,954 ක් හා මුදල රු. 15,710,809,349.30ක් වේ.

අභියෝග

- කොවිඩ් වසංගතය ව්‍යාප්ත වෙමින් පවතින කාලයක රාජකාරී ඉටුකිරීමට සිදුවීම හා කොළඹ දිස්ත්‍රික්කය අධි අවධානම් දිස්ත්‍රික්කයක් බවට පත්වීම හා නිලධාරීන් ගෙන්වීම කඩින් කඩ සිදුකිරීමට සිදුවීම. ප්‍රවාහනය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රාජකාරියට කැඳවීම සීමා කිරීම.
- රැස්වීම් සීමා කිරීම හේතුවෙන් සන්නිවේදන ගැටළු ඇතිවීම. (ප්‍රගති සමාලෝචන හා දැනුවත් කිරීම් සඳහා)
- වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන නිසි වේලාවට නොලැබීම.
- ප්‍රතිපාදන ලබාදුන් වැඩසටහන් සඳහා අක්මුදල් ලැබීම ද සිදුවූයේ වසරේ අවසාන මාස තුළදී බැවින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී විවිධ අපහසුතා වලට මුහුණ දීමට සිදුවීම.
- අවධානම් පරිසරයක රාජකාරී කටයුතු කිරීමට සිදුවීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ වසම් තුළ පවතින නිලධාරී හිඟය.

ඉදිරි ඉලක්ක

1) සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ මාසික සහනාධාර ප්‍රතිලාභ කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීම

2) ජීවනෝපාය සංවර්ධන වැඩසහන යටතේ වසම් මට්ටමින් ක්‍රියාත්මක වන ගෙවතු සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

3) ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ

- සමෘද්ධි අභිමාන 2022 පොළ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- දුම්රිය ස්ථානවල සමෘද්ධි අලෙවි සැල් ආරම්භ කිරීම
- දේශීය ශාඛසාර නිෂ්පාදන ඇසුරින් රුපලාවණ්‍ය සඳහා පුහුණුව
- අන්තර්ජාලය හරහා භාණ්ඩ අලෙවිය
- සමෘද්ධි වෙළඳ ජාලය ශක්තිමත් කිරීම
- සමෘද්ධි නිෂ්පාදන සඳහා තත්ත්ව හා ප්‍රමිති සහතික ලබා ගැනීම

4) සමෘද්ධි නිවාස ලොතරැයි හා සෞභාග්‍ය විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම

5) සමාජ සංවර්ධන වැඩසටහන යටතේ

- සමාජ සංවර්ධන හා පරිසර සංවර්ධන වැඩසටහන යටතේ දිරිය පියස වැඩසටහන, විශේෂ නිවාස වැඩසටහන හා සෞභාග්‍ය සමෘද්ධි නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- මත්නිවාරණ ගෘහ කලමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- සමෘද්ධි ළමා පුස්ථකාල වැඩසටහන
- සනීපාරක්ෂක වැඩසටහන

6) සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීම

7) සමෘද්ධි බැංකු වැඩසටහන යටතේ

- One Stop Shop වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ණය වැඩසටහන්(මිතුරු ණය, අරුණළු ණය සහ අනෙකුත් ණය වර්ග) ක්‍රියාත්මක කිරීම
- ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම

2.6 කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

විශේෂ ජයග්‍රහණ

- 2021 වර්ෂය කොළඹ දිස්ත්‍රික්කය පුරා ප්‍රබල අභියෝගයක් වූ COVID - 19 සීමා හමුවේ උවද ව්‍යවසායකයන් 550 ක් සඳහා ප්‍රාදේශිය අලෙවි පොළ හා ප්‍රදර්ශන මගින් රුපියල් අසූ එක් ලක්ෂ හැත්තෑපන්දහසක (81,75,000.00) පමණ වූ අදායමක් ලබා දීමට හැකි වීම හා ඒ හරහා රුපියල් විසි අට ලක්ෂ දෙදහසක් පමණ වූ අලෙවි සම්බන්දතා ලබා දීමට හැකිවීම
- 2021 වර්ෂයේ නිරෝධායන ඇඳිරිනීතිය පැවති සමයේ ව්‍යවසායකයන් 48 ක් සඳහා , Colombo Mobile Mart , ජංගම ව්‍යාපෘතිය මගින් අදායම් ලබාදීමට හැකි වීම
- COVID - 19 සීමා හමුවේ පීඩාවට පත් ව්‍යවසායකයන් සඳහා නව අලෙවි සම්බන්ධතා 560 ලබා දීමට හැකියාව ලැබීම (උදා - CIB ආයතනය , KEELLS වැනි)
- ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් සියලු අංශයන්හි සහයෝගය ලබා ගැනීමට හැකියාව ලැබීම. (උදා සමෘද්ධි නිලධාරීන් , ආර්ථික සංවර්ධන නිලධාරීන් , කෘෂි තාක්ෂණ නිලධාරීන්)
- කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ව්‍යවසායකයන් 8000 කට වඩා වැඩි පිරිසකින් සමන්විත යාවත්කලීන් වන දත්ත පද්ධතියක් පැවතීම
- ලංකාව පුරා විසිරී පවතින ව්‍යවසායකයන් , නිෂ්පාදකයන් , සේවාලාභීන්ගෙන් සමන්විත නවතම EASYBIZ APP සඳහා සක්‍රිය දායකත්වය සැපයීමට හැකි වීම
- කොළඹ දිස්ත්‍රික්කය තුළ ව්‍යවසායකයන් හා පරිභෝගියකයන් සඳහා ,SED Pages , ව්‍යාපෘතිය හරහා 3000 කට අධික Sed pages හරහා සමාජ මාධ්‍ය ප්‍රවලිත කිරීම

- පවතින ආර්ථික අභියෝග හමුවේ වුවද රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු සමග සහයෝගයෙන් ව්‍යවසායකයන් 83 ක් සඳහා මූල්‍ය ණය පහසුකම් ලබාදීමට හැකිවීම

අභියෝග

- සංවර්ධන නිලධාරීන් සඳහා වන සීමිත තාක්ෂණික සම්පත් ප්‍රමාණයක් සහිත වීම (උදා - පරිඝනක, Laptop)
- මූල්‍ය ආයතන විසින් ණය ලබාදීමේදී , සිදුවන ප්‍රමාද දෝෂයන් හේතුවෙන්, ව්‍යාපාරිකයාට තම ව්‍යාපාරය සඳහා අවශ්‍ය ණය පහසුකම් කලට වේලාවට නොලැබීමෙන් නියමිත ඉලක්කය සපුරාගැනීමට නොහැකි වීම.
- නාගරික ජනතාව අධි ඝනත්වයක් පවතින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ , කොළඹ , කොලොන්නාව වැනි ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශයන්හි ව්‍යවසායකයන් සඳහා ස්ථිර නේවාසික ලිපින නොමැති වීම නිසා ව්‍යාපාර පවත්වා ගෙන යාමේ පවතින නීතිමය ගැටළු (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ , විදුලි සබඳතා ලබාගැනීමේ)
- ඇතිවී ඇති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම්ගත ක්‍රියාත්මක සැලැස්ම, නියමිත කාලයේදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

ඉදිරි ඉලක්ක

- නව ව්‍යාපාර 110 ක් ආරම්භ කිරීම.
- පවත්නා ව්‍යාපාර 660 ක් සංවර්ධනය කිරීම.
- අලෙවි සබඳතා 220 ක් ගොඩනැගීම.
- ව්‍යාපාර උපදේශන 88 ක් පැවැත්වීම.
- ව්‍යාපාර ලියාපදිංචි 110 ක් සිදු කිරීම.
- තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් 154 ක් ක්‍රියාත්මක කිරීම.
- ඇසුරුම් සකස් කිරීමේ වැඩසටහන් 88 ක් පැවැත්වීම.

2.7 දිස්ත්‍රික් මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය

විශේෂ ජයග්‍රහණ

01. ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික්කය තුළ වාර්ෂික කිරුම් හා මිනුම් උපකරණ සත්‍යාපනය කිරීමෙන් ලද සත්‍යෝක්ෂණ ආදායම ඉලක්කගත ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව 10% වැඩිකිරීමට නියමිත වුවද කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රාජකාරී වරින් වර අත්හිටුවා ඇති මොහොතක වර්ෂයේ සංවිධානය කල යුතුව තිබූ ජංගම සත්‍යෝක්ෂණ මධ්‍යස්ථාන සම්පූර්ණ කිරීමට නොහැකිවුවත් රජයේ සත්‍යෝක්ෂණ ආදායම 87.2 % කින් ලබා ගැනීමට හැකිවීම.

02. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වෙළඳුන් දැනුවත් කිරීමේ කටයුතු සෞඛාරක්ෂිතව සිදුකිරීමට කටයුතු සංවිධානය කල අතර ශබ්ද විකාශණයක් මගින් එම දැනුවත් කිරීම් පුළුල්

කල හැකිවී ඇත.ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය 11% කින් වැඩිකිරීමට හැකිවීම ලද රාජකාරී ජයග්‍රහනයකි.

03. කොවිඩ් 19 තත්වය යටතේ වැටලීම් ප්‍රතිශත 72.5% ක ප්‍රමාණයකට සිදුකරලීමට හැකිවීම.

අභියෝග

01. කොවිඩ් වසංගත තතත්වය හමුවේ මෙම වර්ෂය තුළ පෙර වර්ෂයේ සතොක්ෂණ මධ්‍යස්ථාන පැවැත්වීම සඳහා නව ක්‍රමවේදයක් ලෙස ජංගම රථයක් තුල කාර්යාලයක සිට ග්‍රාමීය මට්ටමින් මෙම මධ්‍යස්ථාන පැවැත්වීමේ ක්‍රියාවලිය අඛණ්ඩව මේ දක්වා පවත්වාගන යන අතර ඒ සඳහා අඩු පහසුකම් සහිත වූ මෙම ජංගම සේවාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රධාන කාර්යාලය මගින් ලබා දීමට කටයුතු නොකිරීම නිසා නිලධාරීන් යම් අපහසු තතත්වයක් මත රාජකාරී සිදුකිරීම අභියෝගයක් ව තිබුණි.

02. ජංගම මධ්‍යස්ථාන රාජකාරී සංවිධානය ඇතුළු සියළු රාජකාරී සඳහා කාර්යාලයේ පරිගණක පහසුකම් නොමැති වූ අතර එහිදී රාජකාරී සංවිධාන කටයුතු වලදී අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවීම අභියෝගයක්ව පැවතුණි.

03. වැටලීම් රාජකාරී සංවිධානය කිරීම සඳහා කාර්යමණ්ඩලයම (14) රැගෙන යා හැකි ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීම සහ ජංගම සත්‍යෙක්ෂණ සේවා සපයන එම රථයම වැටලීම් සඳහා භාවිතා කරන බැවින් මධ්‍යස්ථාන රාජකාරී විටදී වැටලීම් හා පරීක්ෂණ කටයුතු සිදුකිරීමට නොහැකි වැටලීම් ඉලක්ක සපුරා ගැනීම සඳහා අභියෝගයක්ව තිබුණි.

ඉදිරි ඉලක්ක

- 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයට තැත් කල වැටලීම් ප්‍රමාණය 5% කින්ද පවරන ලද නඩු ප්‍රමාණය 5% කින්ද වැඩි කිරීමට අපේක්ෂා කරමි.
- 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය 50% කින් වැඩි කිරීමට ඉලක්ක කර ඇත.
- සත්‍යෙක්ෂණ ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ 10% කින් වැඩිකිරීමට ඉලක්ක කර ඇත.

2.8 දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය

විශේෂ ජයග්‍රහණ

- 2021 වර්ෂය සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු 04 ක් පැවැත්වීම. කෘෂිකර්මාන්තයට අදාළ ආයතනවල ප්‍රගතිය අධික්ෂණය, ගැටළු විසඳීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- කොළඹ දිස්ත්‍රික්කය තුළ දේශීය අල බෝග ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය යටතේ පාදුක්ක, සීතාවක. සහ හෝමාගම, කොලොන්නාව, කඩුවෙල, කැස්බෑව යන කොට්ඨාසවල තෝරා ගත් ගොවීන් 29 දෙනෙක් මගින් අක්කර 15 ක වැල් අල වගාවක් ස්ථාපිත කිරීම . ඒ තුළින් අල බෝග පරිභෝජනය ඉහළ නැංවීම. ඉහළ ආදායමක් ලබා ගැනීම තුළින් ගොවීන්ගේ ආර්ථික, සමාජීය තත්ත්වයන් ඉහළ නැංවීම.

- දේශීය අල වර්ග යොදා ගනිමින් අගය එකතු කරන ලද ආහාර නිෂ්පාදනය සඳහා ව්‍යවසායකයින් දෙදෙනෙක් පුහුණුව සඳහා යොමු කල අතර එම ව්‍යවසායකයින් දෙදෙනා සඳහා විජලන යන්ත්‍ර, පෙති කපන යන්ත්‍ර සහ ඇඹරුම් යන්ත්‍ර 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ ලබා දීම. එමගින් දේශීය අල වර්ග යොදා ගනිමින් අගය එකතුකළ නිෂ්පාදන සකස් කිරීම සඳහා යොමු කිරීම සහ පාරිභෝගිකයාට පරිභෝජනය පහසු කිරීම.

- නාගරික නිවාස තුළ සිරස් අවකාශ ගෙවතු ප්‍රවර්ධනය කිරීම හා බොකාෂි කොම්පෝස්ට් ක්‍රම හඳුන්වා දීම ව්‍යාපෘතිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ, කොලොන්නාව, රත්මලාන, මොරටුව, දෙහිවල, මහරගම, කෝට්ටේ, යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රතිලාභීන් 160 දෙනෙක් සඳහා සිරස් අවකාශ වගා කට්ටල, බීජ හා රෝපණ ද්‍රව්‍ය, ගෙවතු වගා පොත්, 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ ලබා දීම. එමගින් අඩු ඉඩ සහිත නිවැසියන් ගෙවතු වගාවට යොමු කිරීම සහ සිරස් අවකාශ ගෙවතු වගාව ප්‍රචලිත කිරීම.

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම මගින් පලා වගාවේ අස්වැන්න ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වැඩි කිරීම ව්‍යාපෘතිය යටතේ මහරගම සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 4 දෙනෙක් සඳහා GAP ක්‍රමවේදය යටතේ වගාවන් පිහිටුවීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ ලබා දීම. එමගින් වස විසෙන් තොර එළවළු නිෂ්පාදනය කෙරෙහි ගොවීන් යොමු කිරීම.

- පුරන් කුඹුරු භාවිතයෙන් සෝජාන් වගාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතිය යටතේ පාදුක්ක කොට්ඨාසයේ වසර 15 පමණ පුරන් වූ අක්කරයක පමණ කුඹුරක් භාවිතා කර සෝජාන් වගා ආදර්ශනයක් ගොවීන් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් ආරම්භ කිරීම. එමගින් පුරන් කුඹුරු වගාවට යොදා ගැනීම සම්බන්ධව ගොවීන් සහ නිලධාරීන් දැනුවත් කිරීම සහ වගාවට යොමු කිරීම.

- හරිතාගාර තුළ කොච්චි වගාව සහ සලාද පිපිඤ්ඤා වගාව ව්‍යාපෘතිය යටතේ පාදුක්ක කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 03 දෙනෙක් සඳහා ආරක්ෂිත ගෘහ 03 ක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ ලබා දීම.

- සුපිරි වෙළඳසැල් සඳහා බිම්මල් වගාව ව්‍යාපෘතිය යටතේ පාදුක්ක කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 05 දෙනෙකු සඳහා බිම්මල් ගෘහ 05 ක් ඉදි කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය

50% ප්‍රතිලාභී දායකත්වය යටතේ ලබා දීම. මේ තුළින් නව ආරකින් බිම්මල් බදුන් වෙළඳපොළට හඳුන්වා දෙන අතර ඉන් නැවුම් බිම්මල් නිවසේදීම නෙලා ගැනීමට පාරිභෝගිකයාට අවස්ථාව හිමි වේ.

- කැකුළුතුරු උදාන ජාතික රුක්රෝපණ වැඩසටහන යටතේ 2021 වර්ෂයේ පළමු වසරට ඇතුළත් වූ ළමුන් සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් 388 ක ළමයින් 29,839 සඳහා පළතුරු පැළය බැගින් ලබා දීම. දරුවන් කුඩා අවදියේ සිටම පරිසර හිතකාමීන් කරවීම.
- තිරසාර ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කය තුළ සියළුම ග්‍රාමනිලධාරී වසම් ආවරණය වන පරිදි බීජ පැකට් 46,000 ක් බෙදා දීම. ඒ තුළින් ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම.

අභියෝග

- දේශීය අල බෝග ව්‍යාපෘතියේ ඇතැම් වගාවන් සඳහා රෝග හා පළිබෝධ හානි ඇති වීම.
- පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් සහ ක්ෂේත්‍ර චාරිකා සඳහා ගොවීන් එක් රැස් කිරීමට නොහැකි වීම.
- ඇතැම් ව්‍යාපෘති සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ ගොවීන් සම්බන්ධ කර ගත නොහැකි වීම.

ඉදිරි ඉලක්ක.

- 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති නිරන්තර පසුවිපරම් මගින් සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
- පුරන් කුඹුරු ආශ්‍රිතව සෝජාන් වගා හෝ වෙනත් වගාවන් ඇති කරමින් භාවිතයට නොගන්නා කුඹුරු ප්‍රමාණය අවම කිරීම.
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) අනුගමනය කරන වගා පිළිවෙත් සඳහා ගොවීන් යොමු කිරීම.
- තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය කෙරෙහි නැඹුරුකර ගැනීමේ අරමුණින් ව්‍යාපෘති සැකසීම
- කෘෂිකාර්මික කටයුතු ඩිජිටල්කරණය සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.

2.9 දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය

විශේෂ ජයග්‍රහණ

1. සමීක්ෂණ කටයුතු සාර්ථකව නිසි පරිදි අවසන් කිරීම .

2. යොමුකරන ලද ලැයිස්තු ගත කිරීම් යාවත්කාලීන කිරීම් නිසි පරිදි අවසන් කිරීම .

අභියෝග

1. කොවිඩ් -19 වසංගතය ඇඳිරිනීති අභියෝග හමුවේ සමීක්ෂණ කටයුතු සාර්ථකව සිදු කිරීම.

2. කොවිඩ් -19 වසංගතය හා නිරෝධායන ඇඳිරිනීති අභියෝග හමුවේ යොමුකරන ලද ලැයිස්තු ගත කිරීම් යාවත්කාලීන කිරීම.

ඉදිරි ඉලක්ක

1. කොවිඩ්-19 වසංගතය අභියෝග මධ්‍යයේ වුව ද 2021 ජන හා නිවාස සංගණනය සාර්ථකව නිම කිරීම.

2. වර්ෂයට අදාලව නියමිත වන්නා වූ සමීක්ෂණ කටයුතු ලැයිස්තු ගත කිරීම් යාවත්කාලීන කිරීම් ඉටු කිරීම

2.10 පර්යේෂණ හා සන්නිවේදන අංශය

විශේෂ ජයග්‍රහණ

1. කොවිඩ් -19 වසංගත තත්ත්වයේ වුවද මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සැපයුම් කරුවන් ලියාපදිංචි සිදු කිරීම.

2. කොවිඩ් -19 වසංගත තත්ත්වයේ වුවද අවශ්‍ය සම්මන්ත්‍රණ කටයුතු මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සාර්ථකව පැවැත්වීම.

3 තැපෑල කටයුතු ඉතාමත් සුපරීක්ෂාකාරීව සිදුකිරීමට හා එහි විධිමත් භාවයක් ඇතිකිරීම සඳහා තැපෑල් පරීෂනක දත්ත පද්ධතියක් හඳුන්වාදීම.

අභියෝග

1. කාර්යයාල නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාව අවම මට්ටමක පැවතීම.

ඉදිරි ඉලක්ක

1. වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.

2. මාර්ග ගත වැඩසටහන් නිර්මාණය කිරීම.

3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් පරිගණක හා පරිගණක ජාලකරණ බාහිර පාර්ශවයන්ගේ මැදිහත් වීමකින් තොරව අප අංශයෙන්ම වියදම් රහිතව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම හා නඩත්තු කිරීම.

4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම ග්‍රැෆික් නිර්මාණ කටයුතු ඉටුකර දීම.

2.11 දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය

විශේෂ ජයග්‍රහණ

- 2020 වර්ෂයේ සකස් කරන ලද ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම්වල ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කලහැකි යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම යටතේ කඩුවෙල, කැස්බෑව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස දෙකෙහි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සීතාවක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඉලූක්පිටිය දොල ක්ෂුද්‍ර ජල පෝෂකය සඳහා ඉඩම් පරිහරණ සැලසුම් නිර්දේශ ක්‍රියාවට නැංවීමට හැකි වීම (ප්‍රතිලාභීන් 31දෙනෙකු)
- හෝමාගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් හත් දෙනෙකුගේ (07) සහ පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් අට දෙනෙකුගේ(08) ඌණ පරිහරණ කෘෂිකාර්මික

ඉඩම්වල පස හා ජල සංරක්ෂණ ක්‍රම යෙදීමෙන් භූමිය ඉහල ඵලදායී මට්ටමකට නංවාලීමට හැකි වීම.

- කොළඹ දිස්ත්‍රික්කයේ තරුණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම සඳහා රජයේ ඉඩම් ලබා දීමේ වැඩසටහනේ සම්මුඛ පරීක්ෂණ පවත්වා නව ඉඩම් ලබා දීමට සුදුසුකම්ලත් අයදුම් කරුවන් 684 දෙනෙකු තෝරාගෙන ඉඩම් ඉල්ලුම් කරන අදාල දිස්ත්‍රික්ක වෙත යොමු කිරීම.
- කොලඹ දිස්ත්‍රික්කයේ පවතින ඌණ පරිහරණ ඉඩම් හඳුනා ගැනීම යටතේ 2021.12.15 වන දිනට ඉඩම් හෙක්.990.359ක් හඳුනා ගැනීම

අභියෝග

- කොළඹ දිස්ත්‍රික්කයේ තරුණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම සඳහා රජයේ ඉඩම් ලබා දීමේ වැඩසටහනේ සුදුසුකම්ලත් අයදුම් කරුවන් සඳහා සුදුසු රජයේ ඉඩම් තෝරා ගැනීම .
- කොළඹ දිස්ත්‍රික්කයේ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සඳහා ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාවට නැංවීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාවට නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කොලඹ දිස්ත්‍රික්කයේ ඌණ පරිහරණ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීත්වය ඉහළ නැංවීම.

ඉදිරි ඉලක්ක

- සීතාවක, පාදුක්ක සහ හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් 03ක් සැකසීම.
- ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂනය සිදු කිරීම (ප්‍රා.ලේ.කොට්ඨාස 13)
- ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් යාවත්කාලීන කිරීම (ප්‍රා.ලේ.කොට්ඨාස 07)
- ඉඩම් අයිතිය හා භුක්තිය පිලිබඳ සමීක්ෂනයක් කිරීම
- භාවිතයට ගත හැකි එහෙත් භාවිතයට නොගන්නා ඌණ පරිහරණ ඉඩම් හඳුනා ගැනීම හා නිර්දේශ ලබා දීම.

2.12 පුපුරන ද්‍රව්‍ය පාලන අංශය

විශේෂ ජයග්‍රහණ

- කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම හරහා කර්මාන්ත අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවීම.
- කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද පුපුරනද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම හරහා බලපත්‍රලාභීන්ගේ කර්මාන්ත හා සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවේ.
- සේවාලාභීන්ගේ තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාවත්කාලීන කිරීම.
- පුපුරන ද්‍රව්‍ය පරීක්ෂණවරුන් ලෙස විශේෂ පොලිස් නිලධරියෙකු සෑම පොලිස් ස්ථානයකටම හඳුන්වා දීම හා ඒ හරහා අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

- පුපුරන ද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන් හා සැපයීම සිදුකරන සපයන්නා බලපත්‍රලාභීන් මාර්ග ගත ක්‍රමයට දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

අභියෝග

- පවතින කොවිඩ් වසංගත තත්වය හමුවේ කර්මාන්ත ස්ථාන නිතර අධීක්ෂණයට ලක් කිරීමට නොහැකි වීම.
- පුපුරන ද්‍රව්‍ය භාවිතා කරන අයවලුන් දැනුවත් කිරීම සඳහා ඒකරාශි කර ගැනීමට නොහැකි වීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ පුපුරන ද්‍රව්‍ය විධිමත් හා නියමිත තාක්ෂණික ක්‍රමවේදයන් යටතේ ගබඩා කිරීම සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමට සුදුසු රජයේ ඉඩමකින් කොටසක් ලබා ගැනීමට නොහැකි වීම.
- තොරතුරු පද්ධතිය සඳහා සේවාලාභීන් උනන්දු කරවීම හා ඒ සඳහා යොමු කිරීම.

ඉදිරි ඉලක්ක

- දැනට පොලිස් ස්ථාන 04ක පවත්වා ගෙන යනු ලබන වාණිජ පුපුරන ද්‍රව්‍ය ගබඩා ඉවත් කර විධිමත් හා නියමිත තාක්ෂණික තත්වයන්ගෙන් යුතු ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම.
- දිස්ත්‍රික්කය තුළ පුපුරන ද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ගේ පුපුරන ද්‍රව්‍ය ගබඩා නවීකරණය කිරීම හා විධමත් කිරීම.
- තොරතුරු පද්ධතිය සම්පූර්ණ කර අන්තර්ජාලය හරහා පුපුරන ද්‍රව්‍ය සඳහා ඉල්ලිම් නිවසේ සිට සිදු කිරීමට පහසුකම් සැලසීම.
- සේවාලාභීන් සියලුදෙනා වෙත කඩිනමින් අවශ්‍ය බලපත්‍ර ලබාදීම.
- සේවාලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2.13 දිස්ත්‍රික් පොහොර අංශය

විශේෂ ජයග්‍රහන -

- 2020 වර්ෂයට සමගාමීව 2021 වසර තුළ ද COVID 19 වසංගත තත්ත්වයට මුහුණ දෙමින් ගොවින්ට අවශ්‍ය පොහොර බෙදාහැරීම සාර්ථකව සිදු කරන ලදී. මෙහිදී, පොහොර සම්බන්ධීකරණ කමිටු රැස්වීම් 07, ප්‍රගති සමාලෝචන රැස්වීම් 11 ක් හා පොහොර සමාගම් සමඟ රැස්වීම් 04 ක් පවත්වන ලදී.
- සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව හරිත කෘෂිකර්මාන්තයක් ඇති කිරීම සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්තින්ට අනුව 2021 මහ කන්නයේ සිට පරිසර හිතකාමී පොහොර භාවිතයෙන් වගා කිරීම ක්‍රියාත්මක වූ අතර ඒ අනුව, කොළඹ දිස්ත්‍රික්කය තුළ කාබනික පොහොර ව්‍යවසායකයන් 14 දෙනෙකු නව නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී.
- 2021 මහ කන්නය සඳහා , ජාතික පොහොර ලේකම් කාර්යාලයේ බලපත්‍රලාභී සමාගම් 07 ක් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ වී වගාව සඳහා කාබනික පොහොර සැපයීමට සුදුසුකම් ලැබිය. ඒ අනුව, 2021/22 මහ කන්නය සඳහා මූලික වී පොහොර අවශ්‍යතාවය ෂන හා දියර වශයෙන් එම පොහොර සමාගම් මඟින් සපුරා ගන්නා ලදී.
- 2021 වර්ෂයේ යල කන්නයේ කුඹුරු ඉඩම් හෙක්. 2374.4 ක් ගොවින් 6590 ක් සඳහා පොහොර මෙ.ටො. 486.329ක් නොමිලේ බෙදා හැරීම.
- 2021 වර්ෂයේ මහ කන්නයේ කුඹුරු ඉඩම් හෙක්. 3854.0 ක් ගොවින් 9945 ක් සඳහා පරිසර හිතකාමී කාබනික ෂන පොහොර මෙ.ටො 306.85 ක්, කාබනික දියර පොහොර ලීටර් 29081.7 ක් සහ KCl / MOP මෙ.ටො. 179.75ක් වශයෙන් ගොවින් වෙත නොමිලේ බෙදා හැරීම.
- වී සහනාධාර ලබා දීමේ වැඩසටහන යටතේ ෂන කොම්පෝස්ට් පොහොර සඳහා රු. 2127500.00 ක දිරි දීමනාවක් කුඹුරු ඉඩම් හෙක්ටයාර 3073.88 සඳහා ගොවීන් 8132ක් අතර බෙදා හරින ලදී.
- බෙදා හරින ලද පොහොර වල ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍ර මට්ටමින් පොහොර සාම්පල් 205 ක් ලබාගෙන රසායනාගාර වෙත යොමු කිරීම.
  03.පොහොර ව්‍යවසායකත්ව කාර්යයේ යෙදී සිටින ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම
- දිස්ත්‍රික්කයේ පරිසර හිතකාමී පොහොර නිෂ්පාදකයන් 14ක් සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා පොහොර නව නිෂ්පාදන ආයතන 28ක් ඇතුළත්ව ව්‍යවසායකයින් 42ක ලියාපදිංචිය සිදු කිරීම.
- යල සහ මහ කන්න වල තොග සත්‍යාපන කටයුතු 91 ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන 15 ක, පොහොර නිෂ්පාදන ආයතන 29ක හා පුද්ගලික පෙහොර අලෙවිසැල් 47ක් තුළ සිදු කිරීම.

අභියෝග

- COVID 19 වසංගත කටයුතු නිසා ප්‍රමාණවත් පරිදි ක්ෂේත්‍ර කටයුතු වල නියැලීමට නොහැකි වීම.

- පරිසර හිතකාමී පොහොර භාවිතා කිරීමේ වැඩසටහනට සමගාමීව රසායනික පොහොර වෙළඳසැලවල් හා ගබඩා පරීක්ෂා කිරීම සීමා කිරීම හේතුවෙන් තත්ය නිමැවුම් ප්‍රතිශතය පෙර කන්නවලට සාපේක්ෂව පහළ යාම.

ඉදිරි ඉලක්ක

- 2030 වන විට රසායනික පොහොර භාවිතය අවම කර 100% කාබනික පොහොර භාවිතය ඉහළ නැංවීමට අපේක්ෂා කළ ද 2021 වර්ෂයේ සිට ම වී වගා සඳහා සම්පූර්ණයෙන් කාබනික පොහොර භාවිතයට යොමු වූ අතර එය අඛණ්ඩව ඉදිරි වර්ෂවලදී ද පවත්වා ගෙන යාම.
- 2022 යල කන්නය තුළ කාබනික පොහොර භාවිතයෙන් කුඹුරු හෙක්ටයාර 2809.2ක් වගා කිරීම.
- දිස්ත්‍රික්කය තුළ පොහොර අවශ්‍යතාවන් සපුරමින් අඛණ්ඩව පොහොර නිෂ්පාදනය කිරීම පවත්වා ගැනීමට යන්ත්‍ර/උපකරණ සඳහා වන පිරිවැය වෙනුවෙන් සහන සැලසීම තුළින් නිෂ්පාදකයන් දිරි ගැන්වීම.
- දිස්ත්‍රික්කයේ සෑම නිවසකටම කාබනික පොහොර නිෂ්පාදන ඒකකයක් හඳුන්වා දීම.
- අත්‍යවශ්‍යම අනෙකුත් බෝග සඳහා අවශ්‍ය රසායනික පොහොර විවෘත වෙළඳපලින් ලබා ගැනීමට අවකාශ සලසා දීම.

2.14 බෞද්ධ කටයුතු අංශය

විශේෂ ජයග්‍රහණ

1. කොළඹ දිස්ත්‍රික්කයේ සුදුසුකම් ලත් දහම් පාසල් ගුරු භවතුන් 9477ක් සඳහා රුපියල් පන්දහසේ දහම් පාසල් ගුරු දීමනාව ලබා දීම.

2. 2021 කොළඹ දිස්ත්‍රික් දහම් පාසල් ගුරු-සිසු සංගණන වාර්තාව සකස් කිරීම.

3. ළඟ සංවර්ධන විහාරස්ථාන, ළඟ සංවර්ධන දහම් පාසල්, හා පුණ්‍යග්‍රාම වැඩසටහන් 65 යටෙත් ප්‍රතිපාදන කොටස්වාස 13 ම බෙදා දීම.

4. දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ 2021/2022 අධ්‍යයන වර්ෂය සිසුන් 161 න් ආරම්භ කිරීම.

5. කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ප්‍රමාණවත් ප්‍රත්‍ය පහසුකම් නොමැති පිරිවෙන් 28 ක් සඳහා අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් ලබා දීම.

අභියෝග

සංවර්ධන කටයුතු වෙනුවෙන් විහාරස්ථාන හා දහම් පාසල් විසාල ප්‍රමාණයක් ඉල්ලුම් කර තිබීම හේතුවෙන් ලැබෙන ප්‍රතිපාදන කළමනාකරණය කරගනිමින් වඩාත් සුදුසු ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව ලබා දීම.

ඉදිරි ඉලක්ක

තිරසර සංවර්ධනයේ දී පුද්ගල අධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඊට අදාළ කාර්යයන් හා වැඩ සටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කරවීම.

2.15 සමාජ සේවා අංශය

විශේෂ ජයග්‍රහණ

1. ආබාධ සහිත තරුණ තරුණියන් 80කු පමණ වෘත්තිය කුසලතා සංවර්ධනය හා රැකියා ගත කිරීම.(වෘත්තිය පුහුණු පාඨමාලා 30 පමණ)

2. ආබාධ සහිත තැනැත්තන් 75 දෙනෙකුට පමණ මූලික හා හදිසි අවශ්‍යතා සපුරා ගැනීමට ආධාර ලබා දීම හා සජීවිකරණය තුළින් ඔවුන්ගේ යහපැවැත්ම සහතික කිරීම. (නිවාස, කොමඩ් සහිත වැසිකිලි, ප්‍රවේශ පහසුකම්, නිවසට ජලය හා විදුලිය, වායු මෙට්ට, ජල මෙට්ට, හා සෞඛ්‍ය පහසුකම් හා අධ්‍යාපනය සඳහා ආධාර ලබා දීම.)

3. ආබාධ සහිත තැනැත්තන් 3181 සඳහා රු.5000 මාසික ජීවනාධාරය ලබාදීම තුළින් ඔවුන්ගේ දිළිඳු බව අවම කිරීම.

4. තනි මාපිය පවුල් 75ට මූල්‍ය හා වෙනත් අවශ්‍ය සහන සේවා ලබා දීම තුළින් ඔවුන්ගේ දිළිඳුබව අවම කිරීම.

5. අවු.70ට වැඩි වැඩිහිටි තැනැත්තන් 18050 දෙනෙකුට රු.2000 මාසික ජීවනාධාරය ලබා දීම තුළින් ඔවුන්ගේ සමාජ ආරක්ෂාව සහතික කිරීම.

6. අවු.100 සැපුරූ වැඩිහිටියන් 32 සඳහා රු. 5,000 බැගින් සියවස් පූර්ණ දිමනාව ලබා දීම.

7. අවු.60ට වැඩි වැඩිහිටි තැනැත්තන් සඳහා විවිධ ආධාර (ස්වයං රැකියා,කොමඩ් සහිත වැසිකිලි, නිවාස අළුත්වැඩියාව)ලබා දීම මගින් ඔවුන්ගේ යහ පැවැත්ම තහවුරු කිරීම.

8. ආබාධ සහිත තැනැත්තන් 160 පමණ උපකරණ ලබා දීම(රෝද පුටු, ත්‍රෙසිකල්, අත්වාරු, කිහිලි කරු, ඇවිදීමේ ආධාරක, ජල/වායු මෙට්ට, ඇස් කණ්නාඩි හා ශ්‍රවණ උපකරණ), මහජනාධාර 8289 දෙනෙකු සඳහා හා පිළිකාධාර 2058 දෙනෙකු සඳහා, ක්ෂය රෝගාධාර 16 දෙනෙකු සඳහා, ලාදුරු රෝගාධාර 35 දෙනෙකු සඳහා, තැලසීමියාධාර 27 දෙනෙකු සඳහා හා පියා අහිමි පාසල් දරුවන් 1034 දෙනෙකු සඳහා අධ්‍යාපන ආධාර බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ලබා දීම.

අභියෝග

1. කොරෝනා රෝග තත්ත්වය ව්‍යාප්ත වීම හේතුවෙන් 2021 වසරේ මහජන රැස්වීම්, සේවා හා සංවර්ධන වැඩසටහන් නතර කිරීමට සිදු වීම.

2. මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමානවත් නොවීම.

3. වෘත්තිමය සුදුසුකම් සහිත මානව සම්පත හිඟ වීම.

4. නිළධාරී අඩු කම.

5. රාජකාරී කෙරේ ඇතැම් නිළධාරීන්ගේ උද්යෝගය හා කැපවීම අඩු වීම.

6. නිළධාරීන් සඳහා අභිප්‍රේරණය අඩුකම, නිරුන්ධනය වන ප්‍රතිචාර හා බලපෑම් පැවැතීම.

7. රාජකාරී සඳහා අවශ්‍ය පහසුකම් අඩුකම (ප්‍රමාණවත් ඉඩ කඩ, දුරකථන,ෆැක්ස්,පරිගනක,ප්‍රින්ටර්ස් ආදී.)

8. ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා ගමන් වියදම් ප්‍රමාණවත් නොවීම.

9. ප්‍රජාවේ සෘන ආකල්ප හා සහභාගිත්වය අඩු වීම.

10. සමාජ සේවා සුබ සාධන හා සංවර්ධන වැඩසටහන් වලදී නිවාරනාත්මක හා සංවර්ධනාත්මක ප්‍රවේශයන් යොදා නොගැනීම, නව දැනුම, සංවර්ධන ආකෘති හා මොඩලයන් යොදා නොගැනීම, කාර්ය සාධන පර්යේශණ යොදා නොගැනීම.

ඉදිරි ඉලක්ක

1. අන්ත දරිද්‍රතා රේඛාවෙන් පහල මට්ටමේ (1.25 / අඩු) සිටින ආබාධ සහිත තැනැත්තන් සැමට රු.5000 මාසික ජීවනාධාරය ලබා දී ඔවුන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම.

2. අන්ත දරිද්‍රතා රේඛාවෙන් පහල මට්ටමේ (1.25 / අඩු) සිටින අවුරුදු 70 වැඩි වැඩිහිටි තැනැත්තන් සැමට රු.2000 මාසික ජීවනාධාරය ලබා දී ඔවුන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම.

3. අන්ත දරිද්‍රතා රේඛාවෙන් පහල මට්ටමේ (1.25 / අඩු) සිටින කාන්තා ගෘහමූලික පවුල්වල ගෘහමූලික කාන්තාවන් සඳහා රු.25000 ස්වයං රැකියා ආධාර ලබා දීම හා ඔවුන්ගේ පාසල් යන දරුවන් සඳහා මූල්‍යාධාර (මසකට එක් පවුලක් සඳහා රු.2500) ලබා දී ඔවුන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම.

4. අන්ත දරිද්‍රතා රේඛාවෙන් පහල මට්ටමේ (1.25 / අඩු) ජීවත්වන ආබාධ සහිත තැනැත්තන් 50% කගේ ඉඩම් හිමිකම, නිවාස අයිතිය, සහ නිවස තුළ ප්‍රවේශ පහසුකම් තහවුරු කිරීම.

5. ආබාධ සහිත තැනැත්තන් ආපදාවකට ලක්වීමේ අවධානම අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ආපදාවකදී ආබාධ සහිත තැනැත්තන්ට සිදු විය හැකි හානිකර බලපෑම් අවම කිරීම සඳහා වන ක්‍රමෝපායන් ඇති කිරීම.

6. වැඩිහිටි තැනැත්තන් ආපදාවකට ලක්වීමේ අවධානම අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ආපදාවකදී වැඩිහිටියන් සඳහා සිදු විය හැකි හානිකර බලපෑම් අවම කිරීම සඳහා වන ක්‍රමෝපායන් ඇති කිරීම.

7. ආබාධ සහිත තැනැත්තන් ආපදාවකට ලක්වීමේ අවධානම අවම කිරීම සහ ආපදාවකදී ඔවුන්ට සිදුවන හානියේ බලපෑම අවම කිරීම සහ ආපදා අවධානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි කාර්ය රාමුව පිළිබඳව සමාජ සේවා නිළධාරීන් පුහුණු කිරීම.

8. කෘෂි කාර්මික කටයුතුවල නියුතු වන හා ඊට පහසුකම් ඇති ආබාධ සහිත තැනැත්තන් සහ ඔවුන්ගේ පවුල්වල කෘෂි කාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය තුළින් සහ ආබාධ සහිත ආහාර නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන වැඩිදියුණු කිරීම තුළින් ඔවුන්ගේ ඵලදායීතාවය සහ ආදායම දෙගුණ කිරීම.

9. රෝග වැලැක්වීම, මාර්ග අනතුරුවැලැක්වීම ආබාධ සහිත දරු උපත් වැලැක්වීම, මානසික සෞඛ්‍ය සහ යහ පැවැත්ම ප්‍රවර්ධනය, පරිසර දූෂණය වැලැක්වීම, මත්ද්‍රව්‍ය, මධ්‍යසාර, දුම්කොල භාවිතය වැලැක්වීම, සාමකාමී පරිපූර්ණ සමාජයක් ඇති කිරීම සඳහා ප්‍රජාව සජීවීකරණය බල ගැන්වීම සහ සම්පත් සම්බන්ධීකරණය තුළින් අදාල කොට්ඨාස තුළ රෝගාබාධ වලට ලක්වන, ආබාධ සහිත තත්වයට පත්වන, ඇබ්බැහිනම් වලට ලක්වන හා මරණයට පත්වන සංඛ්‍යාව අඩකින් අඩු කිරීම.

10. ආබාධ සහිත ළමුන්ගේ අධ්‍යාපන කුසලතා පුහුණුව සඳහා සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකම විශේෂිත වූ යටිතල පහසුකම් හා සම්පත් සහිත මධ්‍යස්ථානයක් බැගින් පිහිටු වීම.

11. තමාගේ කටයුතු කර ගැනීමට හැකි ආබාධ සහිත තරුණ තරුණියන් සෑමට වෘත්තිය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම.

12. ආබාධ සහිත තැනැත්තන් සෑමට නිවාස සඳහා පානීය නල ජලය හා සනීපාරක්ෂක වැසිකිලි පහසුකම් ලබා දීම.

13. ආබාධ සහිත තැනැත්තන් සෑමගේ නිවාස සඳහා විදුලිය ලබා දීම.

14. රැකියාවක නිරත විය හැකි ආබාධ සහිත (අවු.18-60) තැනැත්තන්ගෙන් 50% ඵලදායී හා සුදුසු රැකියා අවස්ථා ලබා දීම.

15. ආබාධ සහිත තැනැත්තන්ගේ සමාජ ආර්ථික හා දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම ප්‍රවර්ධනය සඳහා උද්දේශන කන්ඩායමක් පුහුණු කොට ස්ථාපිත කිරීම.

16. ආබාධ සහිත තැනැත්තන් සහ වයස්ගත පුද්ගලයන්ට ප්‍රවේශ පහසුකම් සහිත ප්‍රවාහන පහසුකම් 50% කින් වර්ධනය කිරීම.

17. තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට කාර්යභාරය සහ ඊට අවශ්‍ය කුසලතා පිළිබඳව සමාජ සේවා නිළධාරීන් පුහුණු කිරීම.

2.16 **සංස්කෘතික අංශය**

විශේෂ ජයග්‍රහණ

01. විවිධ කලා ක්ෂේත්‍ර නියෝජනය කරන කලාකරුවන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.

02. ලියාපදිංචි ක්‍රියාකාරී කලායතන තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.

03. ආධාර අවශ්‍ය කලාකරුවන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.

04. ප්‍රාදේශීය මට්ටමෙන් හා දිස්ත්‍රික් මට්ටමෙන් කලාකරුවන්ගේ සුභසාධනය සහ කලාකටයුතු නන්වාලිම සඳහා ප්‍රාදේශිය හා දිස්ත්‍රික් සංස්කෘතික බල මණ්ඩල ඳිරිගැන්වීම.

05. කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද අති සාර්තක අයුරින් සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල හා දිස්ත්‍රික් මට්ටෙමන් සංස්කෘතික උත්සව පැවැත්වීම.

අභියෝග

01. ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමානවත් නොවීම.
02. නිලධාරීන් සඳහා ඇති තාක්ෂණික උපකරණ ප්‍රමානවත් නොවීම.
03. නිලධාරීන්ගේ රැකියා තෘප්තිය විඩිකිරීමට වැඩ පිළිවෙලක් නොමැති වීම.
04. නිලධාරීන් සඳහා උසස්වීම් පටිපාටියක් නොමැතිවීම.
05. ප්‍රමාණවත් ගමන් වියදම් ඳිමනාවක් ලබා නොඳීම.

ඉදිරි ඉලක්ක

01.පාසල් දරුවන් කලාව සාහිත්‍යට වැඩි නැඹුරුතාවයක් ඇති කිරීම

02.කලාකරුවාගේ සුභසාධන කටයුතු ඉහලනැන්වීම

03.කලාව, සාහිත්‍ය රාජ්‍ය සේවය තුලත් සමාජය තුලත් වැඩි වශයෙන් රෝපනය කිරීම

2.17 විදේශ රැකියා අංශය

විශේෂ ජයග්‍රහණ

1. විදේශ ගතවීමේ අරමුණ ශාක්ෂාත් කරගැනීම සඳහා විගමනික පවුල් සඳහා සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.

2. විගමනික පවුල් වල ළමයින්ගේ ආරක්ෂාව, මත්ද්‍රව්‍ය නිවාරණය, පිලිබඳ වැඩසටහන් කොවිඩ් අවධානම අඩු ප්‍රාදේශ ලේකම් කොට්ඨාස මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම.

අභියෝග

1. කොවිඩ්-19 ආපදා තත්ත්වය යටතේ නිලධාරීන් හට ප්‍රතිලාභීන් එක්රැස් කල නොහැකි වීම, නිලධාරීන් හට ක්ෂේත්‍රයට ගොස් තොරතුරු එක්රැස් කල නොහැකි වීම

2. වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන නොමැති වීම

3. අන්තර්ජාල, පරිගණක පහසුකම්, දුරකථන පහසුකම් නොමැතිවීම

4. නිලධාරීන්ගේ සෘණ ආකල්ප

5. සමාජීය වශයෙන් ජනතාවගේ පවතින යැපුම් මානසිකත්වය

6. සංවර්ධන සැලසුම් ක්‍රමවේදය සංකල්පීය වශයෙන් අධිනාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක කල නොහැකි වීම

ඉදිරි ඉලක්ක

1) පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීම

2) පවුල් සඳහා සංවර්ධන සැලසුම් වඩාත් සාර්ථක කර ගැණීම ප්‍රතිපාදන සොයා ගැණීම

3) නැවත, නැවත විදේශ ගතවීම වලක්වා නැවත සමාජගත කිරීම

4) විගමනික ශ්‍රමිකයන් හට අනෙක් ආයතන මගින් ලබා ගත හැකි ප්‍රතිලාභ ලබා ගැනීමට සහය වීම

5) විගමනික ශ්‍රමිකයන් පිළිබඳ දත්ත පද්ධතියක් සැකසීම.

2.18 මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය/භාහිර සේවා අංශය (අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය)

විශේෂ ජයග්‍රහණ

- දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් ක්ෂේත්‍ර ඔස්සේ ක්‍රියාත්මක කිරීම
- පාසල් දරුවන් /දහම් පාසල් දරුවන් දැනුවත් කිරීම
- දෙමව්පියන් දැනුවත් කිරීම
- පුහුණු වැඩසටහන් - රාජ්‍ය නිළධාරීන් / නීතිය බලාත්මක කරන නිළධාරීන් /බහුකාර්ය සංවර්ධන සහයක පුහුණු කිරීම්
- යොවුන් සේනාංකය සමඟ එක්ව මත්ද්‍රව්‍ය භාවිතය සේවාලාභීන් වෘත්තිය පුහුණුව සඳහා යොමු කිරීම.
- රෝහල් වල මනෝ වෛද්‍ය සායන සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිළධාරීන් යෙදවීම.
- ප්‍රජා පාදක ප්‍රතිකාරය පිළිබඳ දැනුවත් කිරීම - රාජ්‍ය නිළධාරීන්/ ප්‍රජාව
- ප්‍රාදේශිය මත් නිවාරණ කමිටු හා ග්‍රාමීය මත් නිවාරණ කමිටු පිහිටුවීම.
- වතු ආශ්‍රිත දැනුවත් කිරීම.

අභියෝග

- පැවති වසංගත තත්වය මත දැනුවත් කිරීමේ වැඩසටහන් බොහොමයක් මාර්ගගතව සිදු කිරීම(online)
- ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා පැමිණෙන සේවාලාභීන්ට මධ්‍යස්ථාන වල ඉඩ ලබා ගත නොහැකි වීම.
- සේවා ඉල්ලුමට සරිලන නිළධාරීන් හා තාක්ෂණික උපකරණ ප්‍රමාණවත් නොවීම.
- ප්‍රතිපාදන නොමැති වීම.

ඉදිරි ඉලක්ක

- දිස්ත්‍රික් මත් නිවාරණ හා මෙහෙයුම් කමිටුව පිහිටුවීම.
- උපදේශන සේවය පුළුල් කිරීම.
- හදුනාගත් අවදානම් කලාප වල ගොඩවැදීමේ මධ්‍යස්ථාන පිහිටු වීම(dropping center)

- බන්ධනාගාරගතව සිටින සේවාලාභීන් සහ ප්‍රජා විශෝධන ආඥාලාභීන් සඳහා උපදේශන ලබා දීම පුළුල් කිරීම.
- මහල් නිවාස ආශ්‍රිතව විශේෂ මත් නිවාරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජා පාදක ප්‍රතිකාරය ආශ්‍රිත ඉලක්ක සපුරා ගැනීම.
- අඛණ්ඩ පසුරුකවරණ ක්‍රියාවලිය

2.19 **පරිසර අංශය**

විශේෂ ජයග්‍රහණ

- දිස්ත්‍රික් පරිසර කමිටුව.

කොවිඩ් 19 වසංගතය ඉතා සීමාව පැතිරී වසරක වුවද දිස්ත්‍රික් පරිසර කමිටුව වාර 04 පවත්වා ගැනීමට හැකි වූ අතර එමඟින් දිස්ත්‍රික්කයේ පැවැති පරිසර ගැටලු හා පරිසර සංවර්ධන කටයුතු සාර්ථකව සිදු කර ගැනීමට හැකිවිය.

- සුරකිමු ගංඟා වැඩසටහන.

කොළඹ දිස්ත්‍රිකයේ සුරකිමු ගංඟා ව්‍යාපෘතිය යටතේ කැළණි ගඟ, බොල්ගොඩ ගඟ හා ඒ ආශ්‍රිත ඇල මාර්ග සුරකිම හා පවිත්‍ර කිරීම සඳහා කැප වී කටයුතු කළ වසරකි.

එම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් සුරකිමු ගංඟා කමිටුව වාර 04 ක් හා ඊට අදාළ අනු කමිටු 3 ක් ද පැවැත්වීමට හැකි විය. කමිටුව හරහා කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති දෙකක් අනුමත කිරීමට හැකි විය.

- සීතාවක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ සුකර ගොවිපලවල් මගින් කැළණි ගඟ පෝෂණය වන වක් ඔය දූෂණය වීම වැළැක්වීමේ ව්‍යාපෘතියග
- කොළඹ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කැළණි ගඟට සම්බන්ධ වන ඇල මාර්ග 04 ක අපද්‍රව්‍ය රැඳවුම් 4 ක් (waste tap) ඉදි කිරීම හා එම ඇල මාර්ග ආශ්‍රිතව ජීවත් වන ප්‍රජාව දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය. ප්‍රතිපාදන රුපියල් මිලියන 2.618.
- කොළඹ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘතිය අවසන් කිරීමට හැකිවීම.
- විශේෂ දින වැඩ සටහන
- ලෝක තෙත් බිම් වැඩසටහන
  සීතාවක උද්භිත උද්‍යානයේ පාසල් ළමුන් සඳහා තෙත් බිම් අසිරියම මැයෙන් චිත්‍ර තරඟයක් හා උද්භිත උද්‍යානය නැරඹීමේ වැඩසටහනක් කොවිඩ් 19 නිතිරීති වලට අනුගත වී සිදු කිරීමට හැකි වීම. මෙහි දී ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග සහ සහතිකයන් ප්‍රධානය කිරීම ද සිදුවිය.
- මිහිතල දිනය
  මිහිතල දිනය සැමරීම නිමිති කොටගෙන පාසල් ළමුන් සඳහා රචනා තරගයක් සංවිධානය කිරීමට හැකිවීම. ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග සහ සහතිකපත් පිරිනැමීම.
- ලෝක පරිසර දිනය

කොවිඩ් 19 ඉතා සිඟුව පැතිරුනු කාල සීමාවක් බැවින් ලෝක පරිසර දිනය උද්ඝිත තාක්ෂණය ඔස්සේ පාසල් ළමුන් සඳහා පරිසර ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් සුදානම් කිරීමට හැකි වූ අතර ජයග්‍රහකයින් සඳහා ත්‍යාග සහ සහතිකපත් පිරිනැමීම.

- ලෝක ළමා දිනය

  මෙම දිනය වෙනුවෙන් රාජ්‍ය නොවන ආයතනයක් මගින් අනුග්‍රහය ලැබුණු අතර පාසල් ළමුන් සඳහා විශේෂ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් සංවිධානය කර ගැනීමට හැකි වූ අතර ජයග්‍රාහකයින්ට ත්‍යාග සහ සහතිකයන් පිරිනැමුම.

- රුක් රෝපණ වැඩසටහන්
  - අත්තිඩිය තෙත් බිමේ කඩොලාන පැළ 300 සිටුවීම.
  - හුස්ම දෙන තුරුම රුක් රෝපණ වැඩසටහන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 13 තුල ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික්කයේ පාසල් කිහිපයක ද සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
  - නාගරික තුරු උයන්ම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
  - දිවයින පුරා රුක් රෝපණ වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 05 ක රුපියල් 730200.00 මුදලක ප්‍රතිපාදන යටතේ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවිය.
  - හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මගින් පරිසර සංරක්ෂණය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ පැල තවාන් 04 සඳහා මුල්‍ය ප්‍රතිපාදන ලබා ගැනිම.
  - කොස්තුරුම වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 05 ක නොමිලේ කොස් පැල 300 ක් ද මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා රුපියල් 67000 මුල්‍ය ප්‍රතිපාදන ද (පැල 300 සඳහා) ලබා දී ඇත.

- බෙල්ලන්විල - අත්තිඩිය අභය භූමිය ආරක්ෂා කර ගැනිම සඳහා විශේෂ කමිටුවක් පැවැත්විමට හැකි විම. ඒ යටතේ
  - තෙත් බිම් ආරක්ෂා කර ගැනිම සඳහා අදාළ මැනුම් කටයුතු සිදු කිරීම.
  - තෙත් බිම් ආරක්ෂා කර ගැනිම සඳහා ඇල මාර්ග ඉදි කිරීම.
  - තෙත් බිම් ආරක්ෂා කර ගැනිමට අනවසර ගොඩ කිරීම් සහ අනවසර අල්ලා ගැනිම් නතර කිරීමට

  මෙම කමිටුව හරහා සාර්ථකව සිදුකිරීමට හැකි විම.

- ජල මාර්ග ඔස්සේ වෙරළට සහ සාගරයට එකතු වන අපද්‍රව්‍ය පාලනය කිරීමේ කෙළඹ දිස්ත්‍රික් කමිටුව.

  මෙම කමිටුව ද වාර 04 සාර්ථකව පවත්වා ගැනිමට හැකි වූ අතර එමඟින් අදාල පාර්ශවකරුවන් සමඟ ඇල මාර්ග පිරිසිඳු කිරීමේ ක්‍රමවේද අනුගමනය කළ අතර ඉන් සාගරයට හා වෙරළට එකතුවන අපද්‍රව්‍ය යම් ප්‍රමාණයකින් අඩු කර ගත හැකි විය.

- දිස්ත්‍රික් පරිසර පැමිණිලි පරීක්ෂා කර විසදුම් ලබා දීම හා පරිසර දූෂණය පාලනය කිරීම. වර්ෂය පුරා කොළඹ දිස්ත්‍රික්කයේ විශාල පරිසර ගැටලු ප්‍රමාණයක් සඳහා පරිසර පැමිණිලි ලැබෙන අතර ඉන් බොහෝ ගැටලු සඳහා සාර්ථක විසඳුම් ලබා දීමට හැකි විය.

අභියෝග

- කොවිඩ් ආපදා තත්වය යටතේ නිලධාරීන් හට ක්ෂේත්‍රයට ගොස් තොරතුරු එක්රැස් කළ නොහැකි වීම
- සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන නොමැති වීම
- අන්තර්ජාල , පරිගනක පහසුකම්, දුරකථන පහසුකම් හා ලිපි ලේඛන ද්‍රව්‍ය නොමැති වීම
- පරිසර පැමිණිලි සොයා බැලීමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපුරා ගැනීමේ දුක්ෂරතා.

ඉදිරි ඉලක්ක

- තෙත් බිම් රැක ගැනිම හා සංරක්ෂණය කිරීම.
  කොළඹ දිස්ත්‍රික්කයේ බොල්ගොඩ පරිසර ආරක්ෂණ ප්‍රදේශයක්,බෙල්ලන්විල - අත්තිඩිය තෙත් බිම ශ්‍රී ජයවර්ධනපුර වනජීවී අභය භූමිය, තලංගම වැව පරිසර ආරක්ෂණ ප්‍රදේශය වැනි පාරිසරික කලාප සංරක්ෂණය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අදාළ නීතිරීති තදින්ම ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය වන්නේ නම් නව නීතිරීති සකස් කිරීම.

- දිස්ත්‍රික්කයේ පවතින පාරිසරික ගැටලු හා පරිසර දූෂණ තත්වයන් පාලන කිරීම සඳහා ප්‍රාදේශිය හා ග්‍රාමීය කමිටු නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.

- දිස්ත්‍රික්කයේ පලාත් පාලන ආයතන සමඟ කසල කළමණාකරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමග උදා:- (E-WASTE) විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩ සටහන

- සුරකිමු ගංඟා වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සැම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- හරිත ශ්‍රී ලංකා වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කය පුරා රුක් රෝපණ වැඩසටහන් සහ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

2.20 මානව සම්පත් සංවර්ධන අංශය

විශේෂ ජයග්‍රහණ

- වෘත්තිය පුහුණු ආයතන සමග සම්බන්ධවී ඔවුන් සියලු දෙනාටම පුහුණු ආයතන හෝ රැකියාවක් සොයා ගැනිම සඳහා සහයවීම
- රැකියා අපේක්ෂිතයන් වැඩි පිරිසක් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීමට වෘත්තිය මාර්ගෝපදේශනය ලබාදීම

- කොළඹ දිස්ත්‍රික්කයේ සාමාන්‍ය පෙළ අසමත් සියලු දරුවන්ගේ (7894) තොරතුරු රැස්කිරීම, ඔවුන්ව නිසි වෘත්තිය මාවතකට යොමු කිරීමට වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රාදේශිය රැකියා පොළවල් 2 ක් සහ මාර්ගගත ක්‍රමයට වැඩසටහන් 4ක් ප්‍රාදේශිය රැකියා අපේක්ෂිතයන් ඉලක්ක කරගෙන ඉතා සාර්ථකව පවත්වා ඇත.
- වෘත්තිය සතිය වැඩසටහනට සමගාමිව තරඟ අංශ 5ක් සඳහා තරඟකරුවන් 2700 පමණ පිරිසක් කෝවිඩ් වසංගත තත්වය හමුවේ වුවද යොමු කිරීමට හැකියාව ලැබීම.
- මාර්ගගත ක්‍රමයට සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකම රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති අතර එහිදි වෘත්තිය යතුර වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.
- රැකියා කේන්ද්‍රයට පැමිණෙන සියලු රැකියා අපේක්ෂියන් හට වෘත්තිය මාර්ගෝපදේශන ලබාදීම.
- සාමන්‍ය පෙළ ළමුන් සහ උසස් පෙළ ළමුන් සඳහා මාර්ගගත ක්‍රමයට වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රැකියා ආයතනවල පුරප්පාඩු ලබාගෙන එම පුරපුපාඩු වලට සුදුසු අපේක්ෂිතයන් යොමු කිරීම

අභියෝග

- මාර්ගගත ක්‍රමයට වැඩසටහන් පැවැත්වීමේදි නොයෙකුත් තාක්ෂණික ගැටලුවලට මුහුණදීමට සිදුවීම.
- රැකියා අපේක්ෂිතයන් වැඩි පිරිසක් රජයේ රැකියාවක් සෙවීම, ක්ෂේත්‍රගත රැකියා සඳහා යොමු නොවීම, කුසලතා සහිත රැකියා සඳහා වැඩි ඉල්ලුමක් පැවතියද කුසලතා සහිත රැකියා අපේක්ෂිතයන් අඩුවීම. උදා- විදුලි කාර්මික, ජලනල කාර්මික
- රැකියා අපේක්ෂිතයන් බලාපොරොත්තු වන රැකියාව සොයාදීම

ඉදිරි ඉලක්ක.

- 2022 වසරේ තුළදි කොළඹ දිස්ත්‍රික්කය තුළ රැකියා පොළ වැඩසටහන් 4ක් සහ වෘත්තිය පොළ වැඩසටහන් 2ක් පවත්වා රැකියා අපේක්ෂිතයන් වැඩි ප්‍රමාණයක් රැකියා සඳහා යොමු කිරීමතුළින් විරැකියාව අඩු කිරීමට දායකවීම සහ කුසලතා සහිත රැකියා අපේක්ෂිතයින් බිහි කිරීමට මඟ පෙන්වීම.
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 2ක් පැවැත්වීම.
- ව්‍යවසායකයින්/ස්වයං රැකියාලාභින් 25 දෙනෙකු බිහි කිරීම.
- රැකියා පුරප්පාඩු හදුනාගෙන රැකියා අපේක්ෂිතයින් 600 ක් රැකියා සඳහා යොමු කිරීම සහ රැකියාගත කිරීම 300 ඉලක්කයක් සැපිරිය යුතු වේ.
- දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන ජනාධිපති / අගමැති ලේකම් කාර්යාලවලට රැකියා සඳහා ලැබෙන ඉල්ලුම්පත් සඳහා වෘත්තිය මාර්ගෝපදේශය ලබා දීම සහ රැකියා සඳහා යොමු කිරීම.

2.21 **වනිතා සංවර්ධන අංශය**

විශේෂ ජයග්‍රහණ

කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ වුවද පහත ජයග්‍රහණ ලබා ගැනීමට හැකි විණි.

- විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන යටතේ කාන්තාවන් ව්‍යාපෘති ගැන්වීම
- කාන්තා ව්‍යවසායිකාවන්ට ජංගම වෙළඳකුට් ලබා දීමේ වැඩසටහන 2021 යටතේ ජංගම අලෙවිකුට් ලබා දීමට හැකිවීම
- ගෘහ මූලික කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 14 ක් පැවැත්වීමට හැකිවීම
- හදුනාගන්නා ලද ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්විය යුතු කාන්තාවන් සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තා අතරින් කිහිපයකට හෝ ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබීම සහ ඔවුන් ස්වයං රැකියා ගත කිරීමට හැකිවීම
- ගෘහස්ථ හිංසනයට පත් කාන්තාවන් හා ළමුන් සඳහා තාවකාලිකව නවාතැන් දී අවශ්‍ය සහාය සේවාසැපයීමට හැකිවීමට හැකි වීම
- කාන්තාවන් ආර්ථික සමාජීයමය වශයෙන් සවිබල ගැන්වීම උදෙසා ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීමට හැකිවීම
- කොවිඩ් - 19 වසංගත තත්ත්වය යටතේ මෙම දිස්ත්‍රික්කයේ හුදකලා කරන ලද මහල් නිවාස සංකීර්ණයන්හි වෙසෙන කාන්තාවන්ගේ හා ළමුන්ගේ මානසික ආතතිය අවම කර ගැනීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ චිත්‍ර තරඟයක් පැවැත්වීම හා එම දු දරුවන් සඳහා අධ්‍යාපන උපකරණ බෙදා දීමට හැකිවීම
- මාර්ගගත ක්‍රමය ඔස්සේ විවිධ මාතෘකාවන් පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පැවැත්වීමට හැකිවීම

අභියෝග

1. කොවිඩ් - 19 වසංගත තත්වයය හේතුවෙන් ;

- කාන්තාවන්ගේ ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි කරගැනීමේ දුෂ්කරතාවය
- කාන්තාවන් සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවය ඉටු කිරීම
- කාන්තා කාර්ය සංවිධාන රැස්වීය නොහැකිවීම.

2. කාන්තාවන්ට සිදු වන හිංසන සිඳුවීම්/ප්‍රචණ්ඩත්වයන්හිදී වනිතා සංවර්ධන නිලධාරිනියන් වශයෙන් මැදිහත්වීමේදී විධිමත් බලයක් නොතිබීම හේතුවෙන් නිලධාරිනියන් අපහසුතාවයට පත්වීම සහ ඔවුන්ගේ ආරක්ෂාවට තර්ජන ඇතිවීම.

3. ගෘහස්ථ හිංසනයට පත් කාන්තාවන් පිළිබඳ සත්‍ය සිදුවීම් සියල්ල පිළිබඳ නිලධාරීන් වෙත වාර්තා නොවීම

4. හදුනාගන්නා ලද ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්විය යුතු කාන්තාවන් සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර ඉදිරිපත් කළ ද ඉන් කිහිපයකට පමණක් ප්‍රතිපාදන ලැබීම. (ප්‍රතිපාදන නොමැතිවීම)

5. ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා කුඩා ප්‍රමාණයේ ණය (වක්‍රිය ණය) (රු.5,000/- සිට 30,000/-) බලමණ්ඩල හරහා ලබා දුන්න ද ඉන් ඔබ්බට මූල්‍ය ආයතන මඟින් ණය ලබා ගැනීමේදී පනවා ඇති දැඩි ණය කොන්දේසි මඟින් කාන්තාවන් අපහසුතාවයට පත්වීම (රජයේ සේවක ඇප වැනි....)

6. පැවති ආණ්ඩු වලින් වරින් වර විවිධ ස්වයං රැකියා ණය ක්‍රමයන් හදුන්වා දුන්නද ඉතා කුඩා මට්ටමින් ආරම්භ කර පවත්වා ගෙන යන කාන්තාවන් සඳහා එම ණය යෝජනා ක්‍රම වලින් ණය ලබා ගැනීමට නොහැකිවීම

7. හිංසනයට පත් කාන්තාවන් සඳහා තාවකාලිකව රඳවා තබා ගැනීමට රැකවරණ මධ්‍යස්ථානයක් නොවීම සහ ප.ව.4.00 පසු එවැනි කාන්තාවන් රඳවා තබා ගැනීමට

ඉදිරි ඉලක්ක

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

1.2 **විගණන මතය සඳහා පදනම**

කෙටුම්පත් වාර්ථාවට ලැබෙන පිළිතුරු / පැහැදිලි කිරීම් සලකාබලා විගණන මතය පසුව නිකුත් කරනු ලැබේ.

1.3 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මුල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් කවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටී සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

කොළඹ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අංක DIST.CMB/AD/3/11/2017 හා 2020 සැප්තැම්බර් 09 දිනැති ලිපිය මගින් නිල මැදුර ගොඩනැගිල්ලේ ස්ථාපිත රාජ්‍ය ආයතන විසින් භාවිතා කරන මහල් සංඛ්‍යාව අනුව ප්‍රතිශතාත්මකව විදුලි බිල අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් හා නිර්දේශ ලබා දී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ විදුලි බිල් ගාස්තුව හා ජලය බිල්පත් ගාස්තුව වන රු.44,995,794 න් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා කිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාල විය යුත්තේ රු.23,973,170ක් වුවත් වැය ලෙජරය අනුව එය රු.26.621,115ක් බව නිරීක්ෂණය වුණි. වැය ලෙජරයේ සඳහන් වියදමට නිලනිවසේ විදුලි බිල් ගාස්තුව හා ජලය බිල්පත් ගාස්තුව වන රු.109,462ක් ගැලපු පසුද තවදුරටත් රු.2,538,483ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.8,430,427,962 ක් වූ මූල්‍ය නොවන වත්කම් එකතු වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ACA-06) 2021 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන එනු වෙනුවට, එම දිනට සටහන් කර තිබුණු ආරම්භක ශේෂය රු.8,459,216,204 ක් විය. මේ අනුව පූර්ව වර්ෂයේ අවසන් ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය වශයෙන් ඉදිරියට ගෙන යාම සටහන් කිරීමේදි රු.28,788,242 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

	2020 දෙසැම්බර් 31 දිනට ශේෂය (ACA-06)	2021 ජනවාරි 01 දිනට ශේෂය (ACA-06)	වෙනස
	රු.	රු.	රු.
කෙරිගෙන යන වැඩ (ගොඩනැගිලි හා ආකෘති)	5,588,521,951	5,617,309,180	28,787,229
කාර්යාල උපකරණ	56,039,783	55,891,658	(148,125)
විදුලි උපකරණ	17,766,102	17,894,294	128,192
ලී බඩු උපකරණ	120,568,232	120,589,178	20,946
එකතුව	5,782,896,068	5,811,684,310	28,788,242

(ආ) මුලධන වත්කම් අත්පත් කර ගැනීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ අනුව රු.341,558,089 ක් වුවද භාණ්ඩාගාර වගුව SA-082 ක අනුව එය රු.312,774,417 ක් වූයෙන් රු.28,783,672 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ ලෙස රු.8,777,578,249ක් දක්වා තිබුණද එම වත්කම්වල කේවල ශේෂ සනාත කරගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරිපත් නොකළ අතර, ඒ වෙනුවට ඉදිරිපත් කරණු ලැබූ පරිසණක දත්ත වාර්තාව අනුව කේවල ශේෂ තොරතුරු එනම් ගත්මිල, ගත්දිනය හා අනුක්‍රමික අංකය වැනි වත්කම

හඳුනාගැනීමට අදාළවන තොරතුරු ඇතුළත් කර පිළියෙල කර නොතිබුණි. තවද, එම පරිසනක දත්ත වාර්තාවෙහිම කාණ්ඩගත කරණු ලැබූ ශේෂයන්ගේ එකතු වටිනාකම භාණ්ඩාගාර වගුවේ ශේෂයන් සමග නොසැසඳුණු බවද නිරීක්ෂණය විය.

(ඇ) ACA-06 වගුවේ දක්වා තිබෙන මිලදි ගැනිම් රු.312,774,417ක් සහ අපහරණ රු.5,775,935ක ශේෂයන් තුල රු.231,419,338ක් වූ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලට අදාල මිලදි ගැනිම් සහ පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාල රු.2,752,525 ක්වූ අපහරණ ශේෂයන් ඇතුළත්ව පවතින බව විගණනයේදි නිරීක්ෂණය විය. නමුත් මෙම මිලදී ගැනීම් හා අපහරණ ශේෂයන්හි සංයුතිය එනම්, මිලදී ගෙන තිබෙන සහ අපහරණය කරන ලද ඒකක මොනවාද යන්න පිළිබඳව තොරතුරු ඉල්ලා සිටියද එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) සහකාර දිස්ත්‍රික් ලේකම් විසින් ලිපි අංක DIST.CMB/ES/12/1-2021 මගින් ඉදිරිපත් කරනු ලැබූ නිල නිවාස පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීමේදී රත්මලාන හා සිතාවක ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අයත් නිල නිවාසවල වටිනාකම පිළිවෙලින් රු.5,120,000 ක් හා රු.8,000,000ක් වුවත් මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් ලබාදුන් CIGAS වාර්තාවන් අනුව එය පිළිවෙලින් රු.6,970,000ක් හා රු.130,500,000 ක් වුයෙන් රු.1,850,000 ක් හා රු.122,500,000ක් වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) අයිතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතුවූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 කට එනම් කඩුවෙල, දෙහිවල, මහරගම හා කැස්බැව අදාලව නිල නිවාස 05 ක් නිරීක්ෂණය වූවද එම නිල නිවාසවල වටිනාකම් තක්සේරුකොට මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) වලනය කළ හැකි රාක්ක 280 ක් වෙනුවෙන් ගෙවීම් වවුචර් අංක P2112234 මගින් රු.30,343,936 ක් Sanken Construction Pvt Ltd වෙත 2021 දෙසැම්බර් 29 දින ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අවශ්‍යතාවය සඳහා මිලදිගෙන ඇති වලනය කළ හැකි රාක්ක 280 වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවතින ප්‍රතිපාදන භාවිතා කරමින් ගෙවීම් කිරීමට 2021 නොවැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අමප/21/1921/303/152 මගින් ආවරණ අනුමැතිය ලබාදි තිබුණි.

(ii) මෙම රාක්ක 280 තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට 2019 අගෝස්තු 30 දින භාරදි තිබුණි. 2019 දී ලැබුණු මෙම රාක්ක බඩු වට්ටෝරු පොත්වලට ඇතුළත් කර තිබුණද එම කාර්යාලයේ 2020 වාර්ෂික භණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඇතුළත්ව නොතිබුණි.

1.6.2.2මූල්‍ය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රු.203,620,678 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව රු.204,771,372 ක් විය. මෙයට හේතු වී තිබුණේ 2013 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 09 ක කාලයක් ඉකුත් වී තිබුණද, නිරවුල් කර නොතිබූණු රු.1,150,694 ක් වූ නොසැසඳුණු හර ශේෂයයි.

(ආ). සේවා ස්ථාන මාරු වීම, මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැනට සේවයෙහි නොමැති සේවකයන් 35 දෙනෙකුට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ණය ශේෂය රු.3,631,960 ක් පැවති අතර ඉන් රු.1,257,867ක් වූ ණය ශේෂ 19 ක් වර්ෂ 2 ක් හෝ ඊට වැඩි කාලයක සිට අය විය යුතුව පැවතුණි.

1.6.2.3තැන්පතු ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර ප්‍රකාශය (**SA** - 30) අනුව තැන්පතු ගිණුම් ශේෂය රු.953,922,168 ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව එම ශේෂය රු.963,922,168 ක් වූයෙන් රු.10,000,000 වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට පොදු තැන්පත් (පැරණි) ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු.10,000,000 ක් වූ නිරවුල් නොකරන ලද හර ශේෂය හේතු වී තිබුණි. වර්ෂ 14 කට අධික කාලයක් ගතවී තිබුණද, 2019 ඔක්තෝබර් 15 දිනැති හා අංක 269/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.7 ඡේදයේ විධිවිධාන ප්‍රකාර පියවා නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) වන්දි ගෙවීමට පෙර තිබෙන ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන මූලික කටයුතු කඩිනමින් නිම කර ඉඩම් වන්දි ගෙවා එම තැන්පතු ශේෂ නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණෙන් වන්දි ගෙවීම් තැන්පතු ගිණුමේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 කට අදාළව වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් කල් ඉකුත් වූ තැන්පතු වටිනාකම් රු.102,827,540 ක් නිරීක්ෂණය විය. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03 කට අදාළව තැන්පතු 38 ක රු.12,127,493 ක් වර්ෂ 10කට වඩා පැරණි ශේෂ විය. මුදල් රෙගුලාසි 570(අ) අනුව ඉඩම්

වන්දි තැන්පත් කල දින සිට වර්ෂ 10 ක් ගතවූ පසු ඉකුත් තැන්පත් ලෙස රජයේ ආදායමට බැර කළ යුතු වූවද එම ශේෂ සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය හා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් පිළිවෙලින් රු.6,946,207ක් හා රු.1,011,589ක් නිලමැදුර ගොඩනැගිල්ලෙහි එම ආයතන විසින් භාවිතා කරන මහල් සඳහා 2021 වර්ෂයේ විදුලිය සහ ජලය බිල්පත් වියදම් ප්‍රතිපූර්ණය සඳහා ලැබී තිබුණු නමුත් එසේ ලද මුදල වර්ෂයේ වියදම සඳහා ගැලපීම් නොකිරීම හේතුවෙන් රු. 7,957,796ක් පොදු තැන්පත් ගිණුමේ (6000-00-00-20-00-06) 2022 මාර්තු 10 විගණිත දිනය වන විටත් පැවතුණි.

1.6.2.4 අග්‍රිම ගිණුමේ ශේෂය

7002-0-0-302-0-21 අග්‍රිම ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂයේ අග්‍රිම ලැබීම් හා ගෙවීම් දෙපාර්තමේන්තු පොත් අනුව රු.10,943,141,463ක් වුවත් භාණ්ඩාගාර පොත් (SA – 70) අනුව එය රු.11,047,371,463ක් වූයෙන් රු.104,230,000ක වෙනසක් නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල වූ ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 3,364ක් වූ අතර ඉන් රු. මිලියන 2,857ක් වර්ෂය තුළ වැයකර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය රු. මිලියන 507ක් හෙවත් සියයට 15ක් වූ අතර, සියයට 36.78ක් වූ මූලධන ප්‍රතිපාදනයේ ඉතිරිය ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) නිශ්චිත කාර්යයන් තුනක් ඉටුකර ගැනීම සඳහා වර්ෂය තුළ ලබා ගත් පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් රු. මිලියන 1,577න් රු. මිලියන 1,494ක් වැයකර තිබුණු අතර ඉතිරිය රු.මිලියන 82කි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය සියයට 5.24ක් විය. නමුත් ඉන් වැය විෂය අංක 255-1-1-3-1205 යටතේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මහජනතාවට අඩු මිලට ලබාදීමට ක්‍රමවේදයක් සකස්කිරීම වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් අංක 92/2021 යටතේ 2021 පෙබරවාරි 15 දින ලබාදුන් රු.3,000,000ක ප්‍රතිපාදනයෙන් රු.1,850,417ක් එනම් සියයට 61.68ක් උපයෝජනය කර නොතිබුණු අතර එම ඉතිරි මුදල 2021 දෙසැම්බර් 14 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් වෙත ප්‍රේෂණය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

වැය විෂය	මුළු ශුද්ධ ප්‍රතිපාදනය	මුළු වියදම	ඉතිරිය	ඉතිරිය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
	රු.	රු.	රු.	%
255-1-1-3-1205	3,000,000	1,149,583	1,850,417	61.68
255-1-1-5-1501	1,562,000,000	1,483,655,108	78,344,892	5.02
255-1-1-6-1501	12,585,000	10,150,000	2,435,000	19.35
එකතුව	1,577,585,000	1,494,954,691	82,630,309	5.24

(ඇ) මූලධන වැය විෂයන් 04කට අදාලව වෙන් කළ ප්‍රතිපාදනවලින් සියයට 21 සිට සියයට 91ක් දක්වා පරාසයක් තුළ එකතුව රු. මිලියන 229ක් ද. පුනරාවර්තන වැය විෂයන් 11කට අදාලව සියයට 21 සිට සියයට 94ක් දක්වා පරාසයක් තුළ එකතුව රු. මිලියන 26ක් ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 255ක් උපයෝජනයකර නොතිබුණි. එම ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 48.21ක් විය.

වැය විෂය	මුළු ශුද්ධ ප්‍රතිපාදනය	මුළු වියදම	ඉතිරිය	ඉතිරිය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
	රු.	රු.	රු.	%
255-1-1-0-2002	9,000,000	769,780	8,230,220	91.45
255-1-1-0-2104	439,500,000	219,264,819	220,235,181	50.11
255-1-1-0-2401	500,000	394,430	105,570	21.11
255-1-2-0-2401	2,500,000	1,934,214	565,786	22.63
255-1-1-0-1003	14,500,000	10,386,699	4,113,301	28.37
255-1-1-0-1201	4,350,000	3,432,350	917,650	21.10
255-1-1-0-1303	250,000	148,463	101,537	40.61
255-1-1-0-1401	1,800,000	1,400,000	400,000	22.22
255-1-1-0-1404	1,350,000	72,701	1,277,299	94.61
255-1-1-0-1409	23,330,000	13,255,023	10,074,977	43.18

255-1-2-0-1401	100,000	58,111	41,889	41.89
255-1-2-0-1403	21,300,000	14,465,734	6,834,266	32.09
255-1-2-0-1404	2,200,000	1,702,883	497,117	22.60
255-1-2-0-1506	9,000,000	6,960,104	2,039,896	22.67
255-1-2-0-1703	500,000	349,600	150,400	30.08
එකතුව	530,180,000	274,594,911	255,585,089	48.21

(ඇ) වැය විෂයයන් 4ක් සඳහා වෙන් කර ගන්නා ලද රු.1,331,000,000ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මු.රෙ.66 මඟින් වර්ෂය තුළ රු.52,450,000ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. එය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 1 සිට සියයට 22 දක්වා පරාසයක පැවතුණි.

වැය විෂය	ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය	මු.රෙ. මාරු කිරීම්	ශුද්ධ ප්‍රතිපාදනය	ශුද්ධ ප්‍රතිපාදනය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
	රු.	රු.	රු.	%
255-1-1-0-1409	30,000,000	6,670,000	23,330,000	-22.23
255-1-2-0-1001	617,000,000	6,670,000	610,330,000	-1.08
255-1-2-0-1003	214,000,000	8,610,000	205,390,000	-4.02
255-1-1-0-2104	470,000,000	30,500,000	439,502,104	-6.49
එකතුව	1,331,000,000	52,450,000	1,278,552,104	-3.94

(ඉ) එකතුව රු.1,464,800,000ක් වූ වැය විෂයයන් 20ක මුල් වියදම් ඇස්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ සංශෝධනයට ලක්කර තිබුණු ඒතර එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 77 සිට සියයට 334ක් දක්වා වූ පරාසයක පැවතුණි.

වැය විෂය	ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය	මු.රෙ. මාරු කිරීම්	මුලු ප්‍රතිපාදනය	ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
	රු.	රු.	රු.	%
255-1-1-0-1002	4,200,000	1,600,000	5,800,000	138.10
255-1-1-0-1101	950,000	210,000	1,160,000	122.11
255-1-1-0-1201	1,300,000	3,050,000	4,350,000	334.62
255-1-1-0-1202	2,900,000	1,000,000	3,900,000	134.48
255-1-1-0-1203	800,000	470,000	1,270,000	158.75
255-1-1-0-1205	250,000	150,000	400,000	160.00
255-1-1-0-1409	30,000,000	(6,670,000)	23,330,000	77.77
255-1-1-0-1506	500,000	190,000	690,000	138.00
255-1-2-0-1001	617,000,000	(6,670,000)	610,330,000	98.92
255-1-2-0-1002	20,000,000	3,500,000	23,500,000	117.50
255-1-2-0-1003	214,000,000	(8,610,000)	205,390,000	95.98
255-1-2-0-1201	23,000,000	5,200,000	28,200,000	122.61
255-1-2-0-1202	8,000,000	2,000,000	10,000,000	125.00
255-1-2-0-1203	3,000,000	550,000	3,550,000	118.33
255-1-2-0-1205	500,000	30,000	530,000	106.00
255-1-2-0-1301	6,500,000	1,550,000	8,050,000	123.85
255-1-2-0-1303	2,400,000	250,000	2,650,000	110.42
255-1-2-0-1402	9,000,000	2,200,000	11,200,000	124.44
255-1-1-0-2102	50,500,000	30,500,000	81,000,000	160.40
255-1-1-0-2104	470,000,000	(30,500,000)	439,500,000	93.51
එකතුව	1,464,800,000	-	1,464,800,000	

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව "බැඳීම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය" ආවරණය වන පරිදි සිගාස් (CIGAS) ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කර ඇති බැවින් ගනුදෙනු සම්බන්ධ ක්‍රියාවලියේ සියලුම පියවරයන් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු බව සඳහන් වේ. එසේ වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල CIGAS වාර්තා පරීක්ෂා කිරීමේදී එසේ සිදුකර නොතිබුණි. භාණ්ඩාගාර ප්‍රකාශයේ (SA – 92) හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක 2018, 2019 හා 2020 යන වර්ෂවලට අදාලව හඳුනාගනු ලැබූ රු.500,487 ක බැඳීම් හා බැරකම් ශේෂයක් 2021 දෙසැම්බර් 31 දිනවන විටත් සිගාස් ගිණුම්කරණ පද්ධතියේ පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදයෙහි දක්වා ඇති ආකාරයට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන් iii) දැක්වෙන බැරකම් භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් විෂයයන්ට අදාලව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ (SA – 92) බැරකම් ශේෂය සමඟ සැසඳී තිබිය යුතුය. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් iii අනුව බැරකම් ශේෂය රු.6,430,089 ක් හා භාණ්ඩාගාර ප්‍රකාශයේ (SA – 92) අනුව රු.515,187 ක් වූයෙන් රු.5,914,902 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) වැය විෂයය අංක 255-1-1-00-1101 හා 255-1-1-00-1402 යටතේ පිළිවෙලින් රු.35,892ක හා රු.192,930ක බැරකම් ශේෂයන් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන් iii) යටතේ දැක්වීමකින් තොරව 2021 වර්ෂයේදී ගෙවීම් සිදුකර තිබුණි.

(ඈ) 2020 වර්ෂයේ ව්‍යාපෘති 02 කට අදාලව රු.1,255,441 ක බැඳීම් හා බැරකම් ශේෂයක් හඳුනාගෙන තිබුණද ප්‍රවර්තන වර්ෂය තුළ එම බැඳීම් හා බැරකම් නිදහස් කිරීම තහවුරු කරගැනීම සඳහා බැරකම් නිදහස් කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් නොකෙරුණි

2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) ගර්භණී මව්වරුන්ට පෝෂණ දීමනාව ලබාදීම

ඒඩ්ස් බර දරු උපත් ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන ගැබිණි මව්වරුන් සඳහා රු.20,000 ක පෝෂණ දීමනාවක් ලබා දීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂය සඳහා වැය විෂයය විස්තරය 403-02-4-1-1501 යටතේ රු.313,566,892ක ප්‍රතිපාදන සලසා දී ඇති අතර

2021 දෙසැම්බර් 31 දිනට වියදම රු.313,566,892 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොලොන්නාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට වැය විෂයය විස්තරය 403-02-4-1-1501 යටතේ රු.33,498,000 ක ප්‍රතිපාදන ලබාදී ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට වියදම රු.32,800,000 ක් විය. එම වියදමට අදාල සිදුකරන ලද විගණන පරීක්ෂාවේදි කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 06/2016 හි 14.1 වගන්තිය ප්‍රකාරව අයදුම්පත් සඳහා ග්‍රාම නිලධාරී වසම් අනුව ගොනු පවත්වාගෙන යාම, 14.2 වගන්තිය ප්‍රකාරව භාරගත් අයදුම්පත් සඳහා ඇමුණුම 04 පරිදි ලේඛනයක් නඩත්තු කිරිම, 14.3 වගන්තිය ප්‍රකාරව වවුචර්පත් ප්‍රතිලාභි මවුවරුන් සඳහා නිකුත් කිරීමේදී ඇමුණුම 05 ආකෘතිය පරිදි ලේඛනයක් නඩත්තු කිරිම, 14.4 වගන්තිය ප්‍රකාරව මාසික ප්‍රගති වාර්ථාවක් දිස්ත්‍රික් ලේකම්ටද පිටපතක් සහිතව ළමා ලේකම් කාර්යාලයට අදාල මාසය අවසන් දින 07 ක් ඇතුළත, ඇමුණුම් අංක 06 පරිදි වාර්තා කිරිම කළ යුතුවුවද, ඒ අනුව වාර්තා තබාගැනීම හා වාර්තා ඉදිරිපත් කිරීම සිදු කර නොමැති බව නිරීක්ෂණය වුණි.

(ii) තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වැය ලෙජරයට අනුව 2021 වර්ෂයට අදාලව තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත වැය විෂයය විස්තරය 403-2-4-1-1501 යටතේ රු.16,000,000ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර 2021 දෙසැම්බර් 15 දිනට වියදම රු.13,142,000ක් විය. මේ සම්බන්ධයෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ 06/2016 හි 14.4 වගන්තිය අනුව මාසික ප්‍රගති වාර්තා දිස්ත්‍රික් ලේකම්ට ද පිටපතක් සහිතව ළමා ලේකම් කාර්යාලයට අදාල මාසය අවසන්ව දින 07ක් ඇතුළත වාර්තා කළ යුතු බව දන්වා තිබුණ ද එලෙස කටයුතු කර නොතිබුණි. තවද, වවුචර් සඳහා ගෙවීම් කිරීමේ දී 13.2 වගන්තිය අනුව වෙළඳ ආයතන විසින් මුද්දර කොටස් හා වවුචර් ගෙනැවිත් බාර දීමේ දී ළ.ලේ 01 කුවිතාන්සි පොත් භාවිතා කර රිසිට්පතක් (මුල් පිටපත) වෙළඳ ආයතනයට ලබා දී අනු පිටපත ගෙවීම් කටයුතු සඳහා පොදු 35 වවුචරය අමුණා ගිණුම් අංශයට භාර දිය යුතු වේ. නමුත්, මුද්දර කොටස් හා වවුචර් ගෙනැවිත් භාර දීමේ දී ළ.ලේ 01 කුවිතාන්සි නිකුත් කර ඇති බවක් නිරීක්ෂණය නොවුනු අතර, ලංකා සනොස බම්බලපිටිය හා නාරාහේන්පිට යන අලෙවිසැල් ද්විත්වයම වවුචර් පිළියෙල කිරීම හා ඒවායේ හරි වැරදි බලා අත්සන යෙදීම යන කාර්යයන් ද්විත්වයම අදාල වෙළඳසැල් පාර්ශවය විසින්ම සිදු කරන බවත්, ප්‍රා/ලේ කාර්යාලයේ විෂය භාර නිලධාරී විසින් එලෙස සකස් කර දෙන වවුචරය ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කිරීම පමණක් කර තිබුණි.

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 395(ඇ) ඡේදය ප්‍රකාරව බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය පිළිබඳව ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 කට අදාලව එලෙස කටයුතු නොකර ප්‍රමාද වී බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ අවස්ථා 17 ක් නිරීක්ෂණය විය.

(ආ) නිකුත්කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06ක කාලයක් ඉකුත්වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වුවද ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07 කට අදාලව එවිනාකම රු.128,872ක්වූ චෙක්පත් 21ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ දැක්වෙන මාර්ගෝපදේශ අංක 12 විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධානීන් විසින් තම ආයතනය වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය හා දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු වුවත්, කාර්යය මණ්ඩල විස්තරවල ප්‍රාදේශිය ලේකම් කාර්යාල කාර්යය මණ්ඩල විස්තරය ඇතුළත් කර නොතිබුණි.

තවද, කාර්ය මණ්ඩල විස්තරවල අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරු දෙකක් සඳහන් කළද ඒ අනුව ආයතනයේ සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) අදාළ වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස්කළ ක්‍රියාකාරකම් සැලැස්ම වෙනුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ විසින් ඉටුකරනු ලබන දෛනික කාර්යයන් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන්වන ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විමධ්‍යගත අයවැය වැඩසටහන් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06කට අදාලව රු.2,990,000ක ප්‍රතිපාදන අනුමත කරන ලද ව්‍යාපෘති 16ක එනම් රු.105,000කට අදාල භාණ්ඩ හා සේවා ව්‍යාපෘති දෙකක්ද, රු.2,885,000කට අදාල ඉදිකිරීම් ව්‍යාපෘති 12ක්ද 2021 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන - යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන I හි අනුමත ව්‍යාපෘති 47කි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට සමස්ත වියදම රු.54,502,410ක් හා අතැති බිල් වටිනාකම් රු.8,995,587ක් බව නිරීක්ෂණය විය. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් රු.441,000කට අදාල ව්‍යාපෘතියක් අවලංගු කර ඇති අතර රු.559,000කට අදාල ව්‍යාපෘතියක් 2021 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට අසමත් වී ඇත.

3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත, 2022 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර තිබුණි. වාර්ෂික කාර්යසාධන වාර්තා කෙටුම්පතේ තොරතුරු නිවැරදි නොවූ අවස්ථාවන් ගණනාවක් නිරීක්ෂණය වූ අතර ඉන් කිහිපයක් පමණක් පහත දැක්වේ.

(අ) මාර්ගෝපදේශ අංක 14 හි 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තොරතුරු ඇතුළත් කරනොමැත.

(ආ) මාර්ගෝපදේශ අංක 14 හි 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද යන්න සඳහන් කර නොමැත.

(ඇ) මාර්ගෝපදේශ අංක 14 හි 3.9 විගණකාධිපති වාර්තාව 2020 වාර්තාව ඇතුළත් කිරීම

(ඈ) මාර්ගෝපදේශ අංක 14 හි 7 අනුකූලතා වාර්තාවේ 1.3, 1.4, 1.5,හා 1.6 හි සඳහන් ගිණුම් නොමැති වුවද නියමිත දිනයට ගිණුම් ඉදිරිපත්කිරීම යටතේ අනුකූලවේ යනුවෙන් සඳහන් කිරීම

(ඉ) මාර්ගෝපදේශ අංක 14 හි 3.8 අනුව මූල්‍ය නොවන වත්කම් වාර්තාකිරීමේ කාර්යසාධනය යටතේ තොරතුරු ඉදිරිපති නොකිරීම හා ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි නොවීම.

(ඊ) මාර්ගෝපදේශ අංක 14 හි 3.6 අනුව වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගිකර ගැනීමේ කාර්යසාධනය යටතේ ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි නොවීම

(උ) මාර්ගෝපදේශ අංක 14 හි 4 පරිච්ඡේදය අනුව ආයතනයේ කාර්යසාධන දර්ශක ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඉදිරිපත් කළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

කෝට්ටේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුගේ බැංකු ගිණුම් විස්තර ඇතුළත් කර ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණ අතර කොලොන්නාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මුදල් රෙගුලාසි 880 අනුව ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප කැන්පතු ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

3.5 පාඩු හා හානි

පහත ඒදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 09 ක් සහ මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 06 කට අධික කාලයක් ඉකුත් වී තිබුණි. නමුත් එම හානිවලින් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණු පාඩු හා හානි වටිනාකම පිළිවෙලින් රු.92,606,688 ක් සහ රු.629,492 ක් වශයෙන් එකතුව රු.93,231,180 ක් විය. වර්ෂ 09 ක් ගත වන තුරුත් මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශණ අවසන් වී නොතිබුණු බැවින් එම හානි අයකර ගැනීම හෝ

කපාහැරීම් සිදුකළ නොහැකිව පැවතුණි.

(ඌ) 2020 වර්ෂයට අදාලව ඉදිරිපත් කරනු ලැබූ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ තවදුරටත් අයකරගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු රු.20,625ක්වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයේ ලැප්ටෙප් පරිගණකය අස්ථානගත වීම හා රු.10,750ක්වූ PA-3658 දරන රථ අනතුර සමාලෝචිත වර්ෂයේ පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශයේ හෝ අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයෙන් ඉවත්කර තිබුණි.

(ඍ) 2020 වර්ෂයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට් හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණු එහෙත් රු.206,950ක් වූ 2020 වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 04කට අදාල හානි හා පාඩු අයකර ගැනීම් 2021 වර්ෂයේ අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඎ) මුදල් රෙගුලාසි 104(3) වගන්තියට අනුව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක්ද, මුදල් රෙගුලාසි 104(3) වගන්තියට අනුව පරීක්ෂණයෙන් පසු අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතුය. නමුත් විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු පරීක්ෂාකිරීමේ දී එලෙස කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය.

වාහන අංකය	අනතුර සිදු වූ දිනය	ප්‍රාරම්භක වාර්තාව	අවසන් වාර්තාව ඉදිරිපත් කළ දිනය
KB – 0934	2020/04/23	2020/07/09	2020/12/02
	2020/12/01	2021/02/22	2021/10/25
KS – 7784	2020/08/28	2020/09/10	2020/12/18
KY – 1456	2020/09/17	2020/12/02	2021/10/15
KY – 7873	2021/05/31	2020/10/21	-

3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ගණනය කිරීමේ හා පරිවර්තනය කිරීමේ දෝෂ, විශ්‍රාම වැටුප් දෙවරක් ගෙවීම, විශ්‍රාමිකයන් මියගිය පසු ඒ බව තහවුරු කර ගැනීමෙන් තොරව තවදුරටත් විශ්‍රාම වැටුප් ගෙවීම, හමුදා විශ්‍රාම වැටුප් සඳහා දෙවරක් ජීවන වියදම් දීමනා ගෙවීම යනාදී විවිධ හේතූන් මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාළ බල ප්‍රදේශයන්හි විශ්‍රාමිකයන්ට අවිධිමත් හා අක්‍රමිකතා සහිතව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාමිකයන් 167 දෙනෙකුගෙන් එලෙස වැඩියෙන් ගෙවන ලද නමුත් තවදුරටත් අය විය යුතුව පවතින විශ්‍රාම වැටුප් වටිනාකම රු.24,207,556 ක් වූ අතර එම මුදලින් රු.21,475,400 ක් වර්ෂ 05 කට අඩු කාලයක් හා රු.2,732,156 ක් වර්ෂ 5-10 ත් අතර කාලයක සිට අයවිය යුතුව පැවතුණි.

(ආ) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ඉඩම

I. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩමේ තක්සේරු වාර්තාවක් ලබාගැනීම සඳහා කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් 2021 අගෝස්තු 03 වන දින ලිපි අංක KO-DS/LA/01/02/21 මඟින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමුකර තිබුණි. ඊට ප්‍රතිචාර ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කටයුතු සඳහා අවශ්‍ය කරනු ලබන තොරතුරු ඉල්ලා 2021 නොවැම්බර් 25 වන දින CM/KMP/විවිධ/2021 මඟින් ලිපියක් යොමු කර තිබුණද විගණිත දිනය වන 2022 පෙබරවාරි 08 දින වන විටත් පිළිතුරු ලිපියක් යවා නොතිබුණි.

II. මෙම ඉඩමෙහි අනවසර පදිංචිකරුවන් 11 දෙනෙකු පදිංචිව සිටින බවත් ඔවුන් ඉවත්කර ඉඩමේ නිරවුල් අයිතිය ලබාගැනීමට ප්‍රමාණවත් කටයුතු කර නොතිබුණු බවට වූ අංක WNP/CB/A/DSC/LAND 2019 හා 2020 අගෝස්තු 12 දිනැති විගණන විමසුමට පිළිතුරු ලෙස "අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අදාලව ග්‍රාම නිලධාරී වාර්තා හා ආ.ඒ.අ 60 ආකෘතිය අනුව වාර්තා කරන ලද පසුව නීත්‍යානුකූලව ඉවත් කිරීමේ කටයුතු සිදුකරන බව සඳහන් කළද ඒ සම්බන්ධයෙන් කටයුතු කළ බවට තොරතුරු විගණනයේදී අනාවරණය නොවීය.

(ඇ) **නොවිසඳුන විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීමට ප්‍රථම ප්‍රාදේශිය ලේකම් බල කොට්ඨාශයට ගැනෙන වසම් හා සීමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතු වූවද, පිළිවෙලින් 1999 මාර්තු 03 දින සහ 1999 මැයි 19 දින ආරම්භ කර ඇති තිඹිරිගස්යාය සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් අදාළ සීමාවන් නිර්ණය කොට කොට්ඨාශ ස්ථාපිත කිරීමේ ගැසට් නිවේදන ප්‍රකාශයට පත්කර නොතිබුණි.

(ii) මහරගම නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීම යටතේ ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන තිබුණද, 2016 පෙබරවාරි 02 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ වන්දි මුදල් තක්සේරු වටිනාකම් වන රු. මිලියන 112 ක් ගමනාගමන මණ්ඩලයට ගෙවා නොතිබුණි.

(iii) වසර කිහිපයකට පෙර මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ඉදි කර ඇති මහල් 06 කින් යුක්ත නව ගොඩනැගිල්ල සඳහා විදුලි සෝපාන 04 ක් ඉදිකළ යුතුව ඇතත්, එම විදුලි සෝපාන ඉදිකර නොතිබුණි.

(iv) කොළඹ, දෙහිවල, කොලොන්නාව, කැස්බෑව සහ හෝමාගම යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීම් සඳහා මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි. අයිතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ මෙම ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් රජයේ මුදල් විශාල වශයෙන් වැය කර තිබුණි.

(v) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප්වලට අදාළ පැරණි ලිපි ගොනු 337ක් අස්ථානගතවී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව සිවිල් විශ්‍රාමිකයන්ගේ ලිපිගොනු 125ක් සහ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමිකයන්ගේ ලිපි ගොනු 212ක් ද වශයෙන් ගොනු 337 ක් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හෝ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළද නොමැති බව දක්නට ලැබුණි. නමුත් එම විශ්‍රාමිකයන්ට අදාළ තාවකාලික ලිපිගොනු නැවත සකස් කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විධිමත් සහ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(vi) 2016 ජූනි 21 අංක CO/PDK/2010/679දරනඅනුරේඛණය සකස් කර ඇතිපාදුක්ක ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ මිනිමරු දොළ රක්ෂිතයේ, රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 228 අනුව දොළ රක්ෂිතය වෙනමද, පුද්ගලයන් පදිංචි හා භුක්ති විඳින කොටස් වෙනමද, දැක්වෙන අනුරේඛණයන් සැකසීම සඳහා 2016/26 මැනුම් ඉල්ලීම මිනුම් අධිකාරී (කොළඹ) වෙත යොමු කර තිබුණි. නමුත් අදාල මිනුම් ඉල්ලීම සඳහා 2019 මාර්තු 23, 2020 මාර්තු 13 හා 2020 දෙසැම්බර් 02 දින සිහි කැඳවීම් ලිපි යොමුකර ඇතත් මෙතෙක් එම අනුරේඛණ සැකසීමේකටයුතු සිදු කර නොතිබුණි.

(vii) කොටබොඩවත්තේ පිහිටා ඇති රජයේ නිල නිවාසවලට අදාල කුලී ආදායම දිගුකාලයක් තිසිසේ අයකර නොගැනීම හා උසාවි නියෝගයට අනුව කටයුතු නොකිරීම.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගෙන තිබුණු බවට 2021 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ අංශ 29 කට අදාලව තිරසාර සංවර්ධන අරමුණු 75 ක් යටතේ දර්ශක 136ක ප්‍රගතිය දක්වා තිබුණු අතර එයින් දර්ශක 16ක ප්‍රගතිය සියයට 50කට වඩා පහල අගයක්ද දර්ශක 42ක ප්‍රගතිය සියයට 50 – 74 අතර අගයකද පැවතුණි. දර්ශක 15 කට අදාලව ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පූරප්පාඩු	අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	52	48	04	-
තෘතියික මට්ටම	33	15	18	-
ද්විතියික මට්ටම	1,196	1,068	190	62
ප්‍රාථමික මට්ටම	142	106	36	-
එකතුව	1,423	1,237	248	62

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අනුමත සේවක සංඛ්‍යාව 1,423ක් ද, තත්‍ය සේවක සංඛ්‍යාව 1,237ක් ද, පුරප්පාඩු සේවක සංඛ්‍යාව 248 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 62ක් විය. සංවර්ධන නිළධාරී සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 107ක් වුවද එම සේවයේ තත්‍ය සේවක සංඛ්‍යාව 169ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 62ක් විය. පුරප්පාඩු සේවක සංඛ්‍යාව තුල රාජ්‍ය කළමනාකරණ සේවයේ තනතුරු පුරප්පාඩු 90 ක් හා ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු 87ක් නිරීක්ෂණය වූයෙන් එය මහජනතාවට සපයන සේවාවන්හි කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.

විගණකාධිපති

4 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50%-74%
ආයතන අංශය			
ගිනි අවි බලපත්‍ර සංඛ්‍යාව	✓		
කොස් ගස් හෙලීමේ බලපත්‍ර සංඛ්‍යාව	✓		
කොවිඩ් -19 වසංගත තත්වය මත පැනවූ ඇඳිරිනීති කාලසීමාව තුළ දිස්ත්‍රික්කය ඇතුළත හා දිස්ත්‍රික්ක යෙන් පිටත අත්‍යාවශ්‍ය කටයුතු සඳහා සංචරණය කිරීමට ඇඳිරිනීති බලපත්‍ර ලබා දීම් සංඛ්‍යාව	✓		
නිරෝධායනය වෙමින් සිටින පවුල් සඳහා රු.5000 හා රු.10000 වටිනාකමකින් යුත් බඩු මළු ලබා දීම් සංඛ්‍යාව	✓		
සීමිත කාලසීමාවක් තුල බහු කාර්ය සංවර්ධන රැකියා දස ලක්ෂයේ වැඩසටහන හා උපාධිධාරී අභ්‍යාසලාභීන් හට පත්වීම ලබාදීම් සංඛ්‍යාව	✓		
ආයතන නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වූ සංඛ්‍යාව		✓	
වසරේ ඉලක්කගත විමර්ශන කටයුතු සිදුකිරීම් සංඛ්‍යාව		✓	
දිස්ත්‍රික්කයේ නිලධාරීන් සඳහා සේවක අභිප්‍රේරණ වැඩසටහන් පැවැත්වීම් සංඛ්‍යාව	✓		
කෝවිඩ් - 19 වසංගත තත්වය යටතේ දිස්ත්‍රික්කයේ එන්නත්කරණ වැඩසටහන් සම්බන්ධීකරණය හා පවත්වාගෙන යාමේ වැඩසටහන් සංඛ්‍යාව	✓		
ගිණුම් අංශය			
ඒකාබද්ධ ආදායම් වියදම් ඇස්තමේන්තු සකස් කිරීම හා අයවැය දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කල සංඛ්‍යාව	✓		
දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මුලධන හා පුනරාවර්තන අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන බෙදා දීමේ සංඛ්‍යාව.	✓		
මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ සංඛ්‍යාව.	✓		

සකස් කල ඒකාබද්ධ පොදු තැන්පත් සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා වර්ෂ අවසාන කාල විශ්ලේෂණ වාරික ගණන.	✓		
වාර්ෂික ඇස්තමේන්තු සම්බන්ධ වාර්තා අමාත්‍යාංශය හා භාණ්ඩාගාරයට ඉදිරිපත් කල සංඛ්‍යාව.	✓		
භාණ්ඩාගාරයෙන් ලැබෙන අක් මුදල් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත බෙදා දීමේ ප්‍රමාණය.	✓		
වර්ෂ අවසාන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය සකස් කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාණය.	✓		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික අක්මුදල් අවශ්‍යතා ප්‍රකාශය සකස් කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාණය.	✓		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික අක්මුදල් අවශ්‍යතා ප්‍රකාශය සකස් කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාණය.	✓		
ඒකාබද්ධ බැංකු සැසඳුම සැකසීම හා මහා භාණ්ඩාගාරය හා අමාත්‍යාංශය වෙත යොමු කල සංඛ්‍යාව.	✓		
වෙනත් අමාත්‍යාංශ වෙතින් ලැබෙන ප්‍රතිපාදන වෙන් කිරීම් දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත බෙදා හැරීම් කල ප්‍රමාණය.	✓		
ප්‍රධාන ගිණුම් සාරාංශය සකස් කිරීම හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල ප්‍රමාණය.	✓		
ඒකාබද්ධ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සකස් කල ප්‍රමාණය.	✓		
2021/12/31 අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු වාර්තා යැවූ සංඛ්‍යාව.		✓	
වැටුප් සකස් කල දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා සැලසුම් අංශයේ නිලධාරී සංඛ්‍යාව.	✓		
හිඟ වැටුප්, අඩ වැටුප් ආදිය සකස් කල සංඛ්‍යාව.	✓		
විශ්‍රාම වැටුප් ප්‍රතිපාදන ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට නිදහස් කිරීමේ ප්‍රමාණය.	✓		
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අවශ්‍ය වාර්තා ලබා දුන් සංඛ්‍යාව.	✓		
ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල විශ්‍රාම වැටුප් කටයුතු පරීක්ෂා කිරීමේ සංඛ්‍යාව.	✓		
භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම් ප්‍රමාණය.	✓		
ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු පත් කිරීමේ ප්‍රමාණය.	✓		

ක්‍රම සම්පාදන අංශය			
සංඛ්‍යතා අධ්‍යනය නිමකල ව්‍යාපෘති ගණන.	✓		
ප්‍රාදේශීය සංවර්ධන කමිටුව අනුමත ව්‍යාපෘති ගණන.	✓		
දිස්ත්‍රික් සංවර්ධන කමිටුව අනුමත ව්‍යාපෘති ගණන.	✓		
අනුමත ඇස්තමේන්තු ගණන.	✓		
ප්‍රගති වාර්තා කළ ව්‍යාපෘති ගණන.	✓		
වැඩ අවසන් කරන ලද සංවර්ධන ව්‍යාපෘති ගණන.	✓		
පසු විපරම් සිදුකල ව්‍යාපෘති ගණන.	✓		
සංවර්ධන නිලධාරී ස්ථිර කිරීම් හා ස්ථාන මාරුකිරීම් කටයුතු සිදුකල සංඛ්‍යාව	✓		
අභ්‍යන්තර විගණන අංශය			
පැවැත්වූ දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටු (කාර්තුවකට 1 බැගින් පැවැත්වීම) සංඛ්‍යාව	✓		
රාජ්‍ය ගිණුම් කටයුතු පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම යටතේ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විගණන කළමනාකරණ කමිටු කාර්තුවකට 1 බැගින් පැවැත්වූ සංඛ්‍යාව	✓		
දිස්ත්‍රික් ඉංජිනේරු අංශය			
උවසන් කරන ලද ව්‍යාපෘති වල භෞතික හා මූල්‍ය ප්‍රගතියේ ප්‍රමාණය	✓		
සමෘද්ධි අංශය			
සමෘද්ධි අරුණළු - ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි, ධීවර, සත්ව පාලන, අලෙවි හා කර්මාන්ත සංවර්ධන යන ව්‍යාපෘති ලබාදුන් පවුල් සංඛ්‍යාව			✓
විශේෂ ව්‍යාපෘති සංවර්ධන ව්‍යාපෘති ලබාදුන් පවුල් සංඛ්‍යාව	✓		
සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන කර්මාන්ත ප්‍රවර්ධනය යටතේ රුපලාවන්‍ය ව්‍යාපෘති ලබාදුන්	✓		

පවුල් සංඛ්‍යාව			
සමෘද්ධි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ කුකුළු පැටවුන් ලබාදීමේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කළ පවුල් සංඛ්‍යාව	✓		
සමෘද්ධි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ පොල් පැල ලබාදීමේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කළ පවුල් සංඛ්‍යාව			✓
සමෘද්ධි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ බීජ පැකට් ලබාදීමේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කළ පවුල් සංඛ්‍යාව	✓		
සමෘද්ධි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ අපනයන භෝග වගාව සඳහා ගම්මිරිස් පැල හා කුරුඳු පැල ලබාදීමේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කළ පවුල් සංඛ්‍යාව	✓		
සමෘද්ධි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ පලතුරු පැල ලබාදීමේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කළ පවුල් සංඛ්‍යාව	✓		
ඳිරිය පියස නිවාස ලබාදුන් පවුල් සංඛ්‍යාව	✓		
විශේෂ නිවාස ලබාදුන් පවුල් සංඛ්‍යාව	✓		
සෞභාග්‍යා සමෘද්ධි නිවාස ලබාදුන් පවුල් සංඛ්‍යාව	✓		
මත් නිවාරණ ගෘහ කලමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කල සංඛ්‍යාව	✓		
සමෘද්ධි ළමා සමාජ පුස්තකාල ලබාදුන් සංඛ්‍යාව	✓		
සනීපාරක්ෂක වැඩසටහන යටතේ වැසිකිළි ලබාදුන් පවුල් සංඛ්‍යාව	✓		
සිප්දොර ශිෂ්‍යත්ව ලබාදුන් දරුවන්.	✓		
සමාජ ආරක්ෂණ ලබාදුන් පවුල් සංඛ්‍යාව.	✓		
සමෘද්ධි බැංකු ඉතුරුම් ක්‍රියාත්මක කල පවුල් සංඛ්‍යාව	✓		
සමෘද්ධි බැංකු ණය ලබාදුන් පවුල් සංඛ්‍යාව	✓		
කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය			
නව ව්‍යාපාර ආරම්භකිරීම් සංඛ්‍යාව	✓		

පවතින ව්‍යාපාර සංවර්ධනය කිරීම් සංඛ්‍යාව	✓		
ව්‍යාපාර ඇගයීම් සංඛ්‍යාව			✓
ව්‍යාපාර උපදේශණ ප්‍රමාණය	✓		
වෙළඳපොල සම්බන්ධීකරණය ප්‍රමාණය	✓		
තාක්ෂණික දැණුම බෙදාදීම් සංඛ්‍යාව	✓		
ගිණුම් පොත් තැබීම් ප්‍රමාණය	✓		
ව්‍යාපාර නාම ලියාපදිංචිය ප්‍රමාණය	✓		
ව්‍යාපාර දත්ත ලියාපදිංචිය ප්‍රමාණය	✓		
ව්‍යාපාර ණය ප්‍රමාණය			✓
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය			
වාර්ෂික කිරුම් මිනුම් උපකරණ සත්‍යෛක්ෂණ ආදායම් (අපේක්ෂිත ඉක්කකය 10%) ප්‍රමාණය	✓		
දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රතිශතය (75%)	✓		
තැත්කල වැටලීම් හා නඩු පැවරීම් ප්‍රතිශතය(5 %)	✓		
කෘෂිකර්ම අංශය			
දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු ගණන	✓		
විශේෂ සංවර්ධන ව්‍යාපෘති කොළඹ දිස්ත්‍රික්කය තුළ දේශීය අල බෝග ව්‍යාප්තිය සිදු කළ බිම් ප්‍රමාණය (අක්කර)	✓		
නාගරික නිවාස තුළ සිරස් අවකාශ ගෙවතු ප්‍රවර්ධනය කිරීම හා බොකාෂි කොම්පෝස්ට් ක්‍රම හඳුන්වා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	✓		
පුරන් කුඹුරු භාවිතයෙන් සෝජාන් වගාව වැඩිදියුණු කිරීම -බිම් ප්‍රමාණය (අක්කර)	✓		
හරිතාගාර තුළ කොච්චි වගාව සහ සලාද පිපිඤ්ඤා වගාව - හරිතාගාර ගණන	✓		
සුපිරි වෙළඳසැල් සඳහා බිම්මල් වගාව -බිම්මල් ගෘහ ගණන	✓		
යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම මගින් පලා වගාවේ අස්වැන්න ප්‍රමාණාත්මකව සහ		✓	

ගුණාත්මකව වැඩි කිරීම - බිම් ප්‍රමාණය (අක්කර)			
කැකුළුතුරු උදාන ජාතික රැක්රෝපණ වැඩසටහන	✓		
තිරසාර ගෙවතු සංවර්ධන වැඩසටහන	✓		
සංඛ්‍යාලේඛන අංශය			
සමීක්ෂණ කටයුතු සංඛ්‍යාව	✓		
ලැයිස්තු ගත කිරීම් සංඛ්‍යාව	✓		
දිස්ත්‍රික් ලේකම් තුමා විසින් විමසන ලද සංඛ්‍යාත්මක දත්ත හා තොරතුරු ලබා දීම් (විමසීම සඳහා උපදෙස් ලද) සංඛ්‍යාව	✓		
පර්යේෂණ හා සන්නිවේදන අංශය			
1. වෙබ් අඩවිය යාවත්කාලීනව කරන ලද වාර ගණන	✓		
2. මාර්ග ගත වැඩසටහන් නිර්මාණය කිරීම් සංඛ්‍යාව	✓		
3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් පරිගණක හා පරිගණක ජාලකරණ බාහිර පාර්ශවයන්ගේ මැදිහත් වීමකින් තොරව අප අංශයෙන්ම වියදම් රහිතව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම හා නඩත්තු කිරීම් සංඛ්‍යාව	✓		
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුකරන ලද ග්‍රැෆික් නිර්මාණ කටයුතු ඉටුකර දීම.	✓		
දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය			
තිරසර භාවිතය සඳහා සකස් කරන ලද ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාවට නැංවීම සංඛ්‍යාව	✓		
තිරසර භාවිතය සඳහා සකස් කරන ලද ඉඩම් සංඛ්‍යාව	✓		
පස හා ජල සංරක්ෂණය තුළින් ඵලදායීතාවය ඉහළ නංවන ලද ඌණ භාවිත කෘෂිකාර්මික ඉඩම්වල ප්‍රතිලාභීන් සංඛ්‍යාව	✓		
කොළඹ දිස්ත්‍රික්කයේ තරුණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා රජයේ ඉඩම් ලබා දීමේ වැඩසටහනේ සුදුසුකම්ලත් අයදුම් කරුවන් හඳුනා ගැනීම	✓		

කොළඹ දිස්ත්‍රික්කයේ පවතින ණය පරිහරණ ඉඩම් හඳුනා ගැනීම් සංඛ්‍යාව		✓	
ඉඩම් යෝග්‍යතා වාර්තා ලබා දීම් (2021 වර්ෂයේ ඉදිරිපත් වූ ඉල්ලීම් සඳහා) සංඛ්‍යාව	✓		
පුපුරන ද්‍රව්‍ය පාලන අංශය			
විවිධ පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කල සංඛ්‍යාව	✓		
විවිධ පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කල සංඛ්‍යාව		✓	
පුපුරන ද්‍රව්‍ය වාරික හා පතරොම් වාරික නිකුත් කල සංඛ්‍යාව		✓	
පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර ලාභීන්ගේ ආරක්ෂිතව පුපුරන ද්‍රව්‍ය භාවිතය	✓		
දිස්ත්‍රික් පොහොර අංශය			
ක්‍රියාත්මක කල පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	✓		
නියැදි පරීක්ෂාව හා පොහොර ගුණාත්මය තහවුරු කිරීම් සංඛ්‍යාව	✓		
තොග සත්‍යාපන හා ගබඩා පරීක්ෂා සංඛ්‍යාව		✓	
පොහොර අලෙවිසැල් ලියාපදිංචිය හා ගබඩා පරීක්ෂාව සිදුකල සංඛ්‍යාව			✓
ප්‍රගති සමාලෝචන රැස්වීම්/ පොහොර කමිටු රැස්වීම් හා විෂ වගා ප්‍රමාණය	✓		
විද්‍යාත්මක හා සමාජීය පර්යේෂණ අධ්‍යයනයන්. 20 පසු අස්වනු සමීක්ෂණ හා පාංශු පරීක්ෂා පැවැත්වූ සංඛ්‍යාව	✓		
බෞද්ධ කටයුතු අංශය			
ණය සංවර්ධිත විහාරස්ථාන සංවර්ධනය කළ ප්‍රමාණය			✓
ණය සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කළ ප්‍රමාණය			✓
දහම් පාසල් ගුරු පුස්තකාල දීමනා ලබාදුන් සංඛ්‍යාව	✓		

සමාජ සේවා අංශය			
1. වෘත්තිය පුහුණුව සඳහා සහභාගි වූ සහ රැකියා ගත වූ ආබාධ සහිත තරුණ තරුණයන් සංඛ්‍යාව			✓
2. මූලික හා හදිසි අවශ්‍යතා සපුරා ගන්නා ලද ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව		✓	
3.සජීවීකරණ සහ ස්වයං උපකාරක ක්‍රියා මගින් ශාරීරික ,මානසික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වුන ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			✓
4.රු.5000 මාසික ජීවනාධාරය ලැබූ ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව	✓		
5. ආදායම ඉහල ගිය කාන්තා ගෘහමූලික පවුල් සංඛ්‍යාව		✓	
6. රු.2000 මාසික ජීවනාධාරය ලැබූ වැඩිහිටියන් සංඛ්‍යාව	✓		
7. ස්වයං රැකියා, කොමඩි සහිත වැසිකිලි ,නිවාස අළුත්වැඩියා සහ වෙනත් ආධාර ලැබූ වැඩිහිටියන් සංඛ්‍යාව			✓
8. ග්‍රාම නිළධාරී කොට්ඨාස, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික් මට්ටමින් ගොඩනැගී ඇති ස්වශක්ති සංවිධාන සංඛ්‍යාව	✓		
9. සජීවීකරණය ,ස්වයං උපකාරක ක්‍රීඩා හා විවිධ වැඩසටහන් මගින් ශාරීරික, මානසික, අධ්‍යාත්මික ශා සමාජීය වශයෙන් සවිබල ගැන්වී ඇති සංඛ්‍යාව			✓
10. මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලැබූ සහ විවිධ වැඩසටහන් වලට සහභාගි වී ප්‍රතිලාභ ලැබූ අසරණ, දිලිඳු, රෝගී, පීඩාවට පත් හා ආන්තිකරණයට ලක් ව ඇති තැනැත්තන් සංඛ්‍යාව.		✓	
සංස්කෘතික අංශය			
දිස්ත්‍රික්කයේ කලා කටයුතු නංවාලිමට සංවිධානය කල වැඩසටහන් සංඛ්‍යාව		✓	
කලාකරුවන්ගේ ජීවන තත්ත්වය ඉහල නංවාලිමට සංවිධානය කල වැඩසටහන් සංඛ්‍යාව		✓	
කලා හා සංස්කෘතික කටයුතු ව්‍යාප්තකරණය, ප්‍රචාරණය හා ප්‍රවර්ධනය සඳහා සිදුකල වැඩසටහන් සංඛ්‍යාව			✓

විදේශ රැකියා අංශය			
සැකසූ සංවර්ධන සැලසුම් ගණන (25)			✓
පැවැත්වූ වැඩසටහන් ගණන (10)		✓	
මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය/හානිර සේවා අංශය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය			
දැනුවත් කිරීමේ වැඩසටහන් පුලුල් ක්ෂේත්‍ර ඔස්සේ ව්‍යාප්ත කිරීම් ප්‍රමාණය		✓	
දැනුවත් කිරීමේ වැඩසටහන් (පාසල්/දහම් පාසල් දරුවන්, දෙමව්පිය ගුරු පුහුණු /විද්‍යාපීඨ විශ්ව විද්‍යාල සිසුන්, වතු ආශ්‍රිත ත්‍රිවිධ හමුදා, පොලිසිය හා අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන නිලධාරීන් පුහුණු වැඩසටහන් විශාලවැඩබිම් සේවකයින්, නිලධාරීන් රාජ්‍ය නිළධාරී පුහුණුව ප්‍රජා දැනුවත් කිරීමේ රාජ්‍ය නොවන ආයතන) සංඛ්‍යාව		✓	
මත් ද්‍රව්‍ය වලට යොමුවූවන් සඳහා උපදේශන සේවා සැපයූ සංඛ්‍යාව		✓	
මත් ද්‍රව්‍ය ඇබ්බැහිවූවන් ප්‍රතිකාර හා පුනරුත්තාපන සඳහා යොමු කිරීම හා පසුවිපරම් සේවා සැපයූ සංඛ්‍යාව.		✓	
පරිසර අංශය			
දිස්ත්‍රික් පරිසර කමිටු සංඛ්‍යාව			✓
දිස්ත්‍රික් සුරකිමු ගංඟා කමිටු සංඛ්‍යාව			✓
දිස්ත්‍රික්යට ලැබුණු පරිසර පැමිණිලි සඳහා ක්‍රියාත්මක වූ සංඛ්‍යාව			✓
ලැබුණු පැමිනිලි සඳහාවිසඳුම් ලබාදුන් ප්‍රමාණය			✓
ක්‍රියාත්මක කළ පරිසර ව්‍යාපෘති ප්‍රමාණය			
පරිසර අධ්‍යාපනය හා දැනුවත් කිරීම සඳහා පැවැත් වූ දේශන සංඛ්‍යාව.			✓
මානව සම්පත් සංවර්ධන අංශය			

රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කල ප්‍රමාණය			✓
පුරප්පාඩු ලියාපදිංචිය කල ප්‍රමාණය			✓
රැකියා ගැලපීම කර දුන් ප්‍රමාණය			✓
රැකියා සඳහා යොමු කල සංඛ්‍යාව	✓		
ප්‍රාදේශිය රැකියා පොළ පැවැත්වීම	✓		
රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	✓		
රාජ්‍ය නිලධාරින්ගේ රැකියා තෘප්තිය සම්බන්ධ සමීක්ෂණ සංඛ්‍යාව	✓		
විවිධ සමීක්ෂණ සංඛ්‍යාව	✓		
වෘත්තිය මාර්ගෝපදේශන ලබා දීම. (O/L A/L /ස්වයං රැකියා ව්‍යවසායකත්ව වැඩ සටහන්, දෙමාපියන් දැනුවත් කිරීම)		✓	
වනිතා සංවර්ධන අංශය			
සහාය සේවාවන් සඳහා යොමු කරන ලද කාන්තාවන් සංඛ්‍යාව (ගෘහස්ථ හිංසනයට පත්)		✓	
ආර්ථිකමය වශයෙන් සවිබල ගන්වන ලද කාන්තාවන් සංඛ්‍යාව	✓		
වෙන් කරගත් පුහුණු පාඨමාලා සංඛ්‍යාව		✓	
ශිල්පිය පුහුණු ලබා ගත් කාන්තාවන් සංඛ්‍යාව	✓		
රැකවරණය ලබා දුන් කාන්තාවන් හා ළමුන් සංඛ්‍යාව	✓		
විවිධ මානෘකා සම්බන්ධව දැනුවත් කරන ලද කාන්තාවන් සංඛ්‍යාව (Zoom තාක්ෂණය) ඔස්සේ	✓		
මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණ අංශය			
ගැබිණි මව්වරුන් සඳහා ලබා දුන් මසකට රු. 2000/ -වටිනා පෝෂණ මළු ගණන	✓		
කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ නිවාස තුළ හුදකලා වී සිටින මහල් නිවාස වල වෙසෙන මුල් ළමාවියේ පසුවන දරුවන්ගේ මානසික සෞඛ්‍ය			✓

තත්ත්වය යහපත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය වන අධ්‍යාපන උපකරණ ලබා දීම් ප්‍රමාණය			
කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් පසුව මුල් ළමාවියේ පසුවන දරුවන් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන කරා පැමිනිමේදී දරුවන්ට සනීපාරක්ෂක පහසුකම් ලබා දීම සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත ජල බේසම් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා ලබා දුන් ප්‍රමාණය.		✓	
අධිකරණ අමාත්‍යාංශය - සමට පුහුණු නිලධාරී			
උසාවි ක්‍රමවේදයට විකල්පයක් ලෙස සාමකාමී ප්‍රවේශයක් තුළ අඩු වියදමකින්,අඩු කාලසීමාවක් තුළ සමථකරණය මඟින් ගැටුම් නිරාකරණයට මඟ පෙන්වන ක්‍රම වේදය තුළ සමථකරුවන් තෝරා ගැනීමේදී පාර්ශවයන්ට උපරිම සාධාරණත්වය ඉටුකල ප්‍රමාණය.			✓
කොළඹ දිස්ත්‍රික්කය තුළ සමථ මූල මණ්ඩල අළුත්කිරීම පිණිස ගැසට් කිරීමෙන් පසුව නාම යෝජනා කැඳවා සිදුකරන ලද සම්මුඛ පරීක්ෂණ ප්‍රමාණය.			✓
කොළඹ දිස්ත්‍රික්කය තුළ විශේෂිත ඉඩම් ගැටළු විසඳීම පිණිස, ඉඩම් සමථ මූල මණ්ඩලයක් ස්ථාපිත කිරීම සඳහා නාම යෝජනා කැඳවා සිදුකරන ලද සම්මුඛ පරීක්ෂණ ප්‍රමාණය.	✓		
තෝරාගත් පුහුණුලාභීන්ට දින 5ක සමථකරණ දක්ෂතා සහිත පුහුණු වැඩමුළු ඉටුකිරීමෙන් පසුව එක් එක් සමථකරුවන් සඳහා වෙන වෙනම,පුහුණු ක්‍රියාකාරකම් සහ ලිඛිතව කරනු ලබන ඇගැයීම් ඇසුරෙන් (ලකුණු සහිත) නිර්දේශිත වාර්තා ලබාදුන් ප්‍රමාණය.			✓
දිස්ත්‍රික්කය තුළ සමථ මූල මණ්ඩල නිරීක්ෂණය කරමින් අධීක්ෂණ වාර්තා සමථ මණ්ඩලකොමිෂන් සභාව වෙත භාර දුන් ප්‍රමාණය.			✓
ළමා හිමිකම් ප්‍රවර්ධන අංශය			
කෝවිඩ් 19 හේතුවෙන් අපහසුතාවයට පත් දරුවන් සඳහා සහන සැලසූ පවුල් ප්‍රමාණය.		✓	
ළමාරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කල ප්‍රමාණය.	✓		

ළමා සංවර්ධන කමිටු සහ දිස්ත්‍රික් කමිටු ක්‍රියාත්මක කරපු සංඛ්‍යාව		✓	
පාසැල් නොයන ළමුන් සඳහා අධ්‍යාපන උපකරණ ලබාදීම් සංඛ්‍යාව	✓		
වෛද්‍ය, පෝෂණ සහ නිවුන් ආධාර ළමුන් සඳහා ලබාදීම් සංඛ්‍යාව		✓	
ක්‍රියාකාරීව පවත්වාගෙන ආ ළමා සමාජ සංඛ්‍යාව			
ළමා නිවාස ළමුන් සඳහා සහන සැලසීම් ප්‍රමාණය	✓		
අවාසි සහගත ළමුන් සඳහා සහන සැලසීම් ප්‍රමාණය	✓		
කොස්පැල රෝපණය කිරීම් සංඛ්‍යාව			✓
රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණ අංශය			
කොළඹ දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි කල ආයතන සංඛ්‍යාව	✓		
ජාතික මට්ටමේ ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ ලබාදුන් ආයතන සංඛ්‍යාව	✓		
වැඩ බලපත්‍ර හා විසා වාර්ශික වැඩ සැලස්ම හා කාර්තුමය ප්‍රගති වාර්තා අනුමතිය සඳහා ඉදිරිපත් කල සංඛ්‍යාව		✓	
ජාතික ඒකාබද්ධතා අංශය			
සැකසූ ව්‍යාපෘති ගණන (20)			✓
පැවැත් වූ වැඩසටහන් ගණන		✓	
දිස්ත්‍රික් උපදේශන අංශය			
උපදේශන සායන සඳහා පැමිනෙණ සේවාලාභින් සඳහා මනෝප්‍රතිකාරාත්මක උපදේශනය ලබා දුන් සංඛ්‍යාව.			✓
පාසල් පාදක ව්‍යාපෘති යටතේ දරුවන්ගේ චිත්තවේගී බුද්ධි සංවර්ධන වැඩමුලු පැවැත්වූ සංඛ්‍යාව.			✓
සුවපත් සිතක් සවිමත් දැයක් යටතේ ප්‍රාදේශීය		✓	

ලේකම් කොට්ඨාශ මට්ටමෙන් තෝරා ගනු ලබන තරුණ තරුණියන් 32 නෙකු ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව			
ඵලදායී පුරවැසියන් සහිත සාර්ථක පවුලක් උපදේශන වැඩසටහන යටතේ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් වෙනුවෙන් උපදේශන වැඩසටහන් හා සායන පැවැත්වීම		✓	
මාධ්‍ය අංශය			
ආවරණය කල වැඩසටහන් සංඛ්‍යාව	✓		
මාධ්‍ය වාර්තාකරණය කල වැඩසටහන් සංඛ්‍යාව		✓	
සමාජ ආරක්ෂණ මණ්ඩලය			
වැඩිහිටියන් සුරක්ෂිත කිරීම			✓
නවදායකයින් බඳවා ගැනීම		✓	
නව බඳවා ගැනීම් සිදු කිරීමට රාජ්‍ය නිලධාරීන්ට මඟපෙන්වීම	✓		
වාරික මුදල් අයකිරීම් විධිමත් කිරීම	✓		
මහජනතාව දැනුවත් කිරීම		✓	
දායකත්වය ලබා ගැනීමට පෙළඹවීම		✓	
දායකයින්ට ප්‍රතිලාභ ලබා දීම		✓	
බඳවාගත් නිලධාරීන් ඇගයීම		✓	
සක්‍රීයව දායකයන් පවත්වාගෙන යාම			✓

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධන

හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ආයතන අංශය

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	2020 වන විට අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.	පුහුණු කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව හා බහුකාරීය නිලධාරීන් සංඛ්‍යාව	✓		
නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් හා තිරසර ලෙස සකස් කිරීම	2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම	ආයතනික මැදිහත් වීම් මත ඉදිකරන ලද හා වැඩිදියුණු කරන ලද නව නිවාස ප්‍රමාණය	✓		
තිරසර සංවර්ධනය සඳහා සාමකාමී හා පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම හා සෑම මට්ටමතම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.	සියලුම ආකාරයේ අල්ලස සහ දූෂණ වැලැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ප්‍රමාණය				✓

දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.	මාර්ග කි.මී.10 ක් සංවර්ධනය කිරීම	සංවර්ධනය කරන ලද මාර්ග කි.මී. සංඛ්‍යාව- (9.94 කි.මී.)			✓
	කාණු කි.මී. 0.65 ක් සංවර්ධනය කිරීම	සංවර්ධනය කරන ලද කාණු පද්ධති කි.මී. සංඛ්‍යාව -(0.56 කි.මී)			✓
සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයක් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.	ඇළ මාර්ග 55 ක් ප්‍රතිසංස්කරණය කිරීම	සංවර්ධනය කරන ලද ඇළ මාර්ග සංඛ්‍යාව (53)			✓
සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම.	නිවාස 100 ක් සඳහා පානීය ජල පහසුකම් ලබාදීම	ජල පහසුකම් ලබාගත් නිවාස සංඛ්‍යාව (90)			✓
	නිවාස 50 ක් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබාදීම	සනීපාරක්ෂක පහසුකම් ලබාගත් නිවාස සංඛ්‍යාව (43)			✓
	මාතෘ සායන 20 ප්‍රතිසංස්කරණය කිරීම	ප්‍රතිසංස්කරණය කරන ලද මාතෘ සායන ගණන (14)			✓
